ශ්‍රී ලංකා කජු සංස්ථාව



වාර්ෂික වාර්තාව

2023

පටුන		පිටුව
•	සභාපතිතුමාගේ පණිවිඩය	I-II
01.	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1-3
02.	ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය	4-18
03.	සංස්ථාවේ සංවර්ධන කාර්යයන්	19-27
04.	පරිපාලන කටයුතු	28-29
05.	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	30-32
06.	විගණන කමිටු වාර්තාව	33-35
07.	2023 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව	36-38
08.	කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	39-44
09.	කාර්ය සාධනය පිළිබඳ වසර 05ක සාරාංශය	45-46
10.	පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	47-62
11.	විගණකාධිපති වාර්තාව	63-74
12.	විගණකාධිපති වාර්තාවේ සඳහන් අඩු පාඩු නිවැරදි කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග	75-96
13.	වසර 05ක ගිණුම් සාරාංශ	97



සභාපතිගේ පණිවිඩය

දේශීය වැවිලි භෝග ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා මහඟු අත්වැලක් සපයමින්, දේශීය කජු වගාව නඟා සිටුවීම සඳහා කජු වගා ව්‍යාප්ති කටයුතු සංවර්ධනය කරමින්, කජු පර්යේෂණ හා සංවර්ධන කටයුතු දිරිගන්වමින් සහ අගය එකතු කළ නව කජු නිෂ්පාදන හඳුන්වාදෙමින් සිය 50 වන සංවත්සරය ඉමහත් හරසරින් යුතුව සම්පූර්ණ කළා වූ ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් 2023 වර්ෂයේදී සිදු කරන ලද සංවර්ධන වැඩසටහන් පෙළ පිළිබඳව පණිවුඩයක් එක් කිරීමට ලැබීම පිළිබඳව
සතුටු වෙමි.

ඊසානදිග බ්‍රසීලයේ සම්භවයක් ඇති කජු ශාකය 16 වන ශතවර්ෂයේදී ඉන්දියාවේ ගෝවා ප්‍රාන්තය හරහා පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ වයඹදිග මුහුදුබඩ තීරයේ මුල් අවස්ථාවේ වගා කර ඇති අතර, පසුකාලීනව වියළි දේශගුණයක් ඇති කලාපවල වැවිය හැකි භෝගයක් ලෙස ප්‍රචලිත වී ඇත. වර්තමානයේදී මෙය වාණිජමය වශයෙන් වැදගත් ඉහළ කෘෂිකාර්මික ශක්‍යතාවයක් ඇති භෝගයක් ලෙස හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසුව කෘෂි ක්ෂේත්‍රයේ නියුක්තවූවන් කජු වගාව කෙරෙහි අවධානය යොමු කළ අතර, විශේෂයෙන්ම 1973 දී ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපිත කිරීමෙන් පසුව කජු කර්මාන්තය වඩාත් ප්‍රචලිත වී ඇත. ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත කජු කර්මාන්තයේ සංවර්ධනය ප්‍රධාන වශයෙන් පැවරී ඇත.

වර්තමානයේ කජු මද මඟින් සකස් කරන ලද ආහාර, විශේෂයෙන් සිංහල අළුත් අවුරුදු සහ නත්තල් සමයට රසකැවිලි, කේක්, ව්‍යාංජන සඳහා භාවිතා කරන අතර, කජු ලෙල්ලෙන් ලබාගන්නා දියරය (Cashew Nut Shell Liquid) ලැකර්, තීන්ත, ප්ලාස්ටික් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කිරීමේ හැකියාවක් ඇත.

කජු මද සහ කජු නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාවේ කජු මදවල ඇති ඇත්දත් පැහැය, ප්‍රමාණයෙන් විශාල වීම, කජු මදය වටා ඇති සීනි සහිත ආවරණය නිසා ගෝලීය වෙළඳපොලෙහි විශාල ඉල්ලුමක් ඇති අතර, එම ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කජු නිෂ්පාදනයක් සිදු නොවේ. වාර්ෂිකව ලෙලි කජු මෙ.ටො. 25,000ක පමණ ඉල්ලුම පවතින අතර, නිෂ්පාදනය වනුයේ මෙ. ටො. 13,100ක පමණ ප්‍රමාණයකි. මෙම තත්ත්වය අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අහිතකර ලෙස බලපා ඇත.

2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ලෙලි කජු අස්වැන්න මෙ. ටො. 13,014කි. මෙම වර්ෂයේ අපනයන පරිමාව මෙ. ටො. 68.34ක් වූ අතර අපනයන වටිනාකම රු.මි. 311.08කි. 2022 වර්ෂයට සාපේක්ෂව මෙය ඉහළ වර්ධනයකි.

2023 වර්ෂය තුළදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියලුම සේවාවන් සැපයීම සහ වාණිජ කටයුතු ඉතා සතුටුදායක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවූ අතර, ඒ සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත දක්වන ලද සහයෝගීතාවය පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය හා ප්‍රණාමය ඔවුන් වෙත පුද කරමි.

විශේෂයෙන්ම සංස්ථාවේ සියලුම ක්‍රියාකාරකම් ඉහළ ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු සියලු කාර්ය මණ්ඩලය දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ අතර, ඔවුන්ගේ සේවය ද අගය කරමි.

කුඩා පරිමාණයේ පිරිසැකසුම්කරුවන්, කජු නිෂ්පාදන අපනයනකරුවන්, කුඩා කජු ඉඩම්හිමියන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියලුම පාර්ශවකරුවන් මා වෙත දක්වන ලද සහයෝගය සහ කැපවීම මත මෙම සාර්ථකත්වය ළඟාකර ගැනීමට හැකියාව ලැබිණි. එය ද බෙහෙවින් අගය කරමි.

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය **ගරු රමේෂ් පතිරණ මැතිතුමන්** සහ සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන අංශයේ ලේකම්තුමන්ලා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය විසින් අප වෙත ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන් ද ස්තුතිවන්ත වෙමි.



නීතීඥ උදාර විජේසිංහ
සභාපති
ශ්‍රී ලංකා කජු සංස්ථාව

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා කජු සංස්ථාව රාජ්‍ය ව්‍යාපාරික ආයතනයක් වශයෙන් පිහිටවනු ලැබූ බැවින්, කජු ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම ආරම්භයේ සිටම සිදු කරන ලදි. පසුකාලීනව කජු ක්ෂේත්‍රය ආශ්‍රිතව දේශීය වශයෙන් පැනනැගුණු ගැටළු නිරාකරණය සඳහා මැදිහත්ව සේවා සැපයීම සිදු කරනු ලබයි. ඒ අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකා කජු සංස්ථාව රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් වශයෙන් සහ කජු වගාව සම්බන්ධව ව්‍යාප්ති සේවා, පර්යේෂණ සහ පිරිසැකසුම් සේවා සැපයීම් ආයතනයක් වශයෙන් කටයුතු කරනු ලැබේ.

1.2 ශ්‍රී ලංකා කජු සංස්ථාව ස්ථාපනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1973 මැයි මස 25 වන දින අංක 60/7 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවන ලදී. සංස්ථාව ආරම්භයේ සිට රාජ්‍ය ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර, කජු කර්මාන්තය සඳහා සියලුම සේවාවන් සැපයීම සිදු කරන අතරතුර වාණිජ කටයුතු ද ලාභදායි මට්ටමකින් සිදු කරයි.

1.3 ආයතනයේ දැක්ම

ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

1.4 ආයතනයේ මෙහෙවර

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාළ පාර්ශවයන් වෙත වෘත්තීයමය මඟපෙන්වීම ලබා දීම තුළින් දිගුකාලීනවූ වාණිජමය ශක්‍යතාවයක් ළඟා කර ගැනීමට හැකිවන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

1.5 ඉලක්ක හා අරමුණු

ගෝලීයව පිළිගත් වෙළඳ නාමයක් සහ ඉහළ අපනයන ධාරිතාවයක් සඳහා ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ව්‍යාප්තිය, පිරිසැකසුම්කරණය, අලෙවිකරණය හා සහතිකකරණයේ ඵලදායිතාව ඉහළ නැංවීම.

- වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාව ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළඳනාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයනය දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත් කිරීම.
- ලාභ ඉපැයීම මඟින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත් කිරීම.

1.6 රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ පළමුවන උපලේඛනය අනුව කජු සංස්ථාවේ කාර්යයන්

(අ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම සම්බන්ධ සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

(ආ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ කටයුතු සිදු කිරීම.

(ඇ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම දියුණු කිරීමේ පරමාර්ථයෙන් විමර්ශන හා පර්යේෂණ කටයුතු සිදුකිරීම.

(ඈ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම සහ කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම පිළිබඳ තාක්ෂණික, අලෙවි හා වෙනත් තොරතුරු රැස් කිරීම, පිළියෙල කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම සහ ඒ කටයුතුවලදී අන් අය සමඟ එක්ව ක්‍රියා කිරීම.

(ඉ) කජු සහ කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම සඳහා පිහිටුවනු ලබන කර්මාන්තශාලා පිහිටු විය යුතු ස්ථාන, ඒවායේ ප්‍රමාණය හා තාක්ෂණික ප්‍රමිති නිශ්චය කිරීම සහ අළුත් කර්මාන්තශාලා පිහිටුවීමටත් අවශ්‍ය අවස්ථාවලදී එවකට පවතින කර්මාන්තශාලා ක්‍රියා කරවීම.

(ඊ) කජු සහ කජු නිෂ්පාදන මිලට ගැනීම, බෙදා හැරීම, විකිණීම සහ අපනයනය කිරීම.

(උ) කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම හා අලෙවි කිරීම, කජු නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම පිළිබඳ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම පිණිස පහසුකම් සැපයීම.

(ඌ) කජු වගාවන්, පිරිසැකසුම් කිරීමේ පහසුකම් සහ අලෙවි කිරීම දියුණු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය මූලික සංවිධාන පිහිටුවීම සහ එම සංවිධාන පිහිටුවීමට ආධාර දීම.

(එ) කජු නිෂ්පාදන ප්‍රචාරය කිරීම හා විකිණීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීම, ලෝක වෙළඳපොළ තුළ ඒ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සහ ඒ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ අනුෂාංගික කාර්යයන් සඳහා ප්‍රචාරක කටයුතුවලට මුදල් යෙදවීම, ඒ කටයුතු අනුපාලනය කිරීම සහ ඒ කටයුතුවලට ආධාරදීම ආරම්භ කොට ඊට අනුග්‍රහය දැක්වීම.

2. ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

වගුව 2.1 : 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර
01.	ඩබ්.එච්.එම්. උදාර විජේසිංහ මයා	සභාපති
02.	අශෝකා ලංකාතිලක මෙය	නියෝජ්‍ය සභාපතිනිය
03.	ඒ.යූ.කේ. දොඩන්වල මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.02.24 දින දක්වා)
04.	සුජන්ති මායාදුන්නේ මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නියෝජිත)
05.	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.03.30 දින සිට 2023.09.05 දක්වා)
06.	ඒ.පී.ඩී.ඩී. චන්දුරංගි මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.10.31 දින සිට)
07.	චාමර සුහසිංහ මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	උපාලි වඩුආරච්චි මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
09.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	කේ.එස්. විජයකීර්ති මයා	සාමාන්‍යාධිකාරී (වැඩ බලන) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
11.	වයි.ටී. තුෂංගා මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

2.2 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ විගණන කමිටුව

වගුව **2.2 : 2023** වර්ෂයේ විගණන කමිටුව

අනු අංකය	නම	තනතුර
01.	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.07.31 දින දක්වා)
02.	ඒ.පී.ඩී.ඩී. චන්දුරංගි මිය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.12.22 දින සිට)
03.	ඒ.යූ.කේ. දොඩන්වල මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.02.24 දින දක්වා)
04.	ආර්.ඒ.ආර්.එස්. මායාදුන්න මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.06.16 දින සිට)
05.	චාමර සුභසිංහ මයා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	කේ.එස්. විජයකීර්ති මයා	කමිටු ලේකම් (වැ.බ.) සාමාන්‍යාධිකාරී (වැ.බ.)
07.	කේ.ඒ.සී. ශාමන්ත මයා	කමිටු නිරීක්ෂක, ප්‍රධාන අභ්‍යන්තර විගණක- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2023.02.24 දින සිට)
08.	වී.යූ. ලියනගේ මයා	කමිටු කැඳවුම්කරු හා කමිටු සාමාජික- සහකාර සාමාන්‍යාධිකාරී(අභ්‍යන්තර විගණන)
09.	ඩී.එම්.යූ.එස්. ධර්මජීව මයා	කමිටු නිරීක්ෂක, විගණන නිලධාරී - ජාතික විගණන කාර්යාලය (2023.02.24 දින සිට)

2.3 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ඉහළ කළමනාකරණය

i). කේ.එස්. විජයකීර්ති මයා - සාමාන්‍යාධිකාරී (වැඩ බලන)

ii). වයි.ටී.තුෂංගා මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

2.4 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මධ්‍යම කළමනාකරණ කාර්ය මණ්ඩලය

i.	එම්.ටී.එස්.කේ. පීරිස් මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්
ii.	වී.යූ. ලියනගේ මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
iii.	පී.එම්.ඒ.පී.කේ. විජේතුංග මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි
iv.	එම්.ඩී.ටී.ඩබ්. ප්‍රාර්ථන මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ (2023.12.27 දින සිට)
v.	ප්‍රසන්න ගුණවර්ධන මයා	-	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි හා පිරිසැකසුම් (2023.12.27 දින සිට)

2.5 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය

ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා සංස්ථාව සතුව අංශ 07ක් පවතින අතර, එම එක් එක් අංශයන් විසින් විවිධ කාර්යයන් සිදුකරනු ලබයි. එම අංශ සහ ඒවායේ කාර්යභාරය පහත පරිදි වේ.

01. ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය
02. මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය
03. මූල්‍ය අංශය
04. අභ්‍යන්තර විගණන අංශය
05. වැවිලි අංශය
06. අලෙවි සහ පිරිසැකසුම් අංශය
07. ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය

2.5.1 ව්‍යාප්ති සහ පර්යේෂණ අංශය

ශ්‍රී ලංකාව තුළ කජු කර්මාන්තය නඟා සිටුවීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාප්ති හා පර්යේෂණ අංශය විසින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. කජු වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම ව්‍යාප්ති හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, මීට අමතරව ව්‍යාප්ති හා පර්යේෂණ අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරනු ලබයි.

- කජු වගාව ව්‍යාප්ත කිරීම සහ වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ගොවීන්හට ආධාර කිරීම.
- ගොවීන්ගේ ගැටළු සහ බාධාවන් හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබා දීම.
- ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම සහ සහජීවනය ඉහළ නැංවීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ඵලදායිතාවය ඉහළ නැංවීම.
- කජු වගාවේ සංවර්ධනය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීම.
- වැඩි ඵලදාවක් සහිත, විවිධ දේශගුණික වෙනස්වීම් සඳහා ප්‍රතිරෝධීතාවයක් දක්වන, අවම රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතයක් සහිත කජු ප්‍රභේදයන් හඳුන්වාදීම.
- උසස් තාක්ෂණික ක්‍රමවේද භාවිතයෙන් පරිසර සංරක්ෂණය ද සහිතව වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම.
- පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි ඵලදායිතාවය ඉහළ නැංවීම, අගය එකතු කිරීම, පසු අස්වනු තාක්ෂණය සහ ඇසුරුම්කරණය පිළිබඳ සැලකිලිමත්වෙමින් ඒ සඳහා පර්යේෂණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

කජු සංස්ථාවේ ව්‍යාප්ති අංශය යටතේ පවතින පර්යේෂණ අංශය මඟින් කජු ශාකය, කජු වගාව හා නිෂ්පාදන පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ පවත්වනු ලැබේ. මෙම අංශය යටතේ ප්‍රධාන මධ්‍යස්ථාන දෙකක් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ කජු කර්මාන්තයේ වර්ධනයට සහය දැක්වීම සහ තිරසාර සහ පරිසර හිතකාමී ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණ වේ.

2.5.2 මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පරමාර්ථ හා අරමුණු ඉටු කරගැනීම උදෙසා මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායි අයුරින් යොදා ගැනීම මෙන්ම අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කිරීම මානව සම්පත් හා පාලන අංශය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වශයෙන් දැක්විය හැකිය.

මෙම කාර්යයන්ට අමතරව මාවන සම්පත් හා පාලන අංශය මඟින් පහත කාර්යයන් සිදුකරනු ලබයි.

- සේවකයන් බඳවා ගැනීම් හා අනුස්ථාපන කටයුතු සිදු කිරීම.
- රැකියා නිර්මාණය හා විශ්ලේෂණය කිරීම.

- පුහුණුව හා සංවර්ධන කටයුතු සිදු කිරීම.
- විනය පරිපාලන කටයුතු සිදු කිරීම.
- සේවක සුභසාධන කටයුතු සිදු කිරීම.
- සේවකයින්ගේ වේතන කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- සේවකයින්ගේ දුක් ගැනවිලි කළමනාකරණය කිරීම.
- සේවකයින්ගේ කාර්යඵල ඇගයීම යනාදී කාර්යයන් සිදු කරනු ලබයි.

ඒ අනුව සේවකයන්ගේ ඵලදායිතාව, විෂය දැනුම හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් සංස්ථාවේ අපේක්ෂිත පරමාර්ථ හා අරමුණු කරා ළඟා වීම සඳහා මහඟු දායකත්වයක් මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය විසින් සපයනු ලබයි.

2.5.3 මූල්‍ය අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ගවලින් සම්පාදනය කරගනිමින් එම අරමුදල් ඵලදායි ලෙස ආයෝජන කර, සංස්ථාවේ ලාභදායීත්වය ඉහළ නැංවීම සඳහා මූල්‍ය අංශය මඟින් කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ලාභදායීත්වය ඉහළ නැංවීම, මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම සහ ද්‍රවශීලතාව ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාම මූල්‍ය අංශයේ අරමුණු වශයෙන් හඳුන්වා දිය හැක.

ඉහතින් දක්වා ඇති කාර්යයන්ට අමතරව පහත කාර්යයන් මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි.

- නිවැරදි මූල්‍ය කළමනාකරණය මඟින් සංස්ථාවේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම.
- අදාළ මූල්‍ය නීති සහ රෙගුලාසිවලට අනුකූලව ගෙවීම් කටයුතු සිදු කිරීම.
- විවිධ අංශයන්ගේ සහ ව්‍යාපෘතීන්ගේ ආදායම්, වියදම්, ලාභ සහ අලාභ තත්ත්වයන් සඳහන් කරමින් මාසික වාර්තා සකස් කිරීම.
- සෑම වර්ෂයක් අවසානයේදීම වාණිජ සහ සේවා අංශයන්ගේ ලාභදායීත්වය සඳහන් කරමින් අවසාන ගිණුම් සකස් කර ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.

2.5.4 අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරකම් මත පදනම් වූ අභ්‍යන්තර පාලන ක්‍රමයන් පිළිබඳව නිරන්තර හා ස්වායීන ඇගයීමක් ක්‍රියාත්මක කොට, ඒ හරහා අදාලවන අභ්‍යන්තර පරීක්ෂාවන්හි ප්‍රමාණාත්මකභාවය හා වලංගුභාවය තහවුරු කිරීමේ කටයුතු සිදු කරමින් ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු සම්පත් නිසි පාලනයක් යටතේ වඩා ඵලදායිව, කාර්යක්ෂමව හා ආර්ථිකමය ආකාරයෙන් ආයතනයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා යොදාගැනීම වෙනුවෙන් අවශ්‍ය විධිධ ක්‍රම හඳුන්වා දීම හා ඒවායේ ප්‍රායෝගික යොදාගැනීම් පිළිබඳ ප්‍රතිපෝෂණයක යෙදීම මෙන්ම කජු සංස්ථාවේ ප්‍රගතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් අදාල වන වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ නිරන්තර ඇගයීමක යෙදීම හා ඒවායේ සිදුවිය යුතු වෙනස්කම් හා ඒවායේ ප්‍රගතිය පිළිබඳව පාලනාධිකාරිය වෙත වාර්තා කිරීම යනාදී කාර්යයන් සිදුකරමින් සංස්ථාවේ අපේක්ෂිත ඉලක්කයන් හා අරමුණු කරා ළඟා වීම සඳහා සැලකිය යුතු දායකත්වයක් අභ්‍යන්තර විගණන අංශය විසින් ලබා දෙනු ලබයි.

2.5.5 වැවිලි අංශය

ශ්‍රී ලංකාවේ දේශීය පාරිභෝජනය සඳහා අවශ්‍ය උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් අපේක්ෂිත ඉලක්ක හා පරමාර්ථ මුදුන් පමුණුවාගැනීම වැවිලි අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, එම අංශය මඟින් අංශය මඟින් පහත කාර්යයන් සිදුකරනු ලබයි.

- සංස්ථාව සතු වතුයායන් සහ පැළ තවාන් නඩත්තු කරමින් ලාභදායීව පවත්වාගෙන යාම.
- ස්වාභාවික පරිසරය සංරක්ෂණය වන පරිදි වගා කටයුතු සිදු කිරීම.
- වතුයායන් හා පැළ තවාන් ආශ්‍රිත ගම්මහද ප්‍රදේශයන්හි ජනතාව සමඟ සුහදව කටයුතු කරමින් නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම.
- කජු වගාව ආදර්ශ වගාවක් ලෙස පවත්වා ගනිමින් ආයෝජකයින් සහ පිරිසැකසුම්කරුවන් ආකර්ෂණය කරගැනීම.

එමෙන්ම සංස්ථාවේ වැවිලි අංශය මඟින් ශ්‍රී ලංකාව තුළ කජු වගාව සිදු කිරීමට අවශ්‍ය අව්‍යාජ (Authentic) කජු බද්ධ පැළ නිෂ්පාදනය කර දිවයින පුරා කජු වගාව සිදු කරනු ලබන ගොවීන් වෙත බෙදා හැරීම සිදු කිරීමට අමතරව, එම අව්‍යාජ (Authentic) කජු බද්ධ පැළ අලෙවි කටයුතු සිදු කිරීම මඟින් සංස්ථාවේ ලාභදායිත්වය වැඩි කිරීම සඳහා උපරිම දායකත්වයක් ලබා දෙනු ලබයි.

2.5.6 අලෙවි සහ පිරිසැකසුම් අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අලෙවි හා පිරිසැකසුම් අංශය විසින් දේශීයව කජු පාරිභෝජනය සිදු කරනු ලබන පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා හා වුවමනා පිළිබඳව සොයා බලා ඔවුන්ගේ ඉල්ලුමට සරිලන පරිදි නැතහොත් ඔවුන්ගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා යෝග්‍ය කජු නිෂ්පාදිත සැපයීම මඟින් සංස්ථාවේ අපේක්ෂිත පරමාර්ථ හා අරමුණු කරා ළඟා වීම සඳහා කටයුතු කරනු ලබයි. මීට අමතරව පහත කාර්යයන් සිදු කරනු ලබයි.

- නිෂ්පාදන පිරිවැය අවමකිරීමත්, ඵලදායිතාවය ඉහළ නැංවීමත් මඟින් කජු පිරිසැකසුම් කර්මාන්තය ඉහළ නැංවීම.
- අන්තර්ජාතික ප්‍රමිති තත්ත්වයන්ට ගැළපෙන පරිදි අගය එකතු කළ කජු නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය සහ රසය ඉහළ නැංවීම.
- කජු අලෙවි සහ පිරිසැකසුම් කර්මාන්තයේ උන්නතිය සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින් වාර්ෂිකව එම ක්ෂේත්‍රයේ සංවර්ධනය ඇති කිරීම.
- ලාභදායිත්වය ඉහළ නංවාගනිමින් සහ වෙළඳපොල තරඟකරුවන් සමඟ යහපත් සම්බන්ධතා පවත්වා ගනිමින්, අලෙවි අංශය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුක්තව පවත්වාගෙන යාම.
- සේවකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීමත්, කුසලතා සංවර්ධනය කිරීමත් මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ බලගැන්වීම.

සංස්ථාවේ වතුයායන්ගෙන් වාර්ෂිකව ලැබෙන ලෙලි කජු අස්වැන්නට වටිනාකමක් එකතු කරමින් කජු පරිභෝජනය කරනු ලබන පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා හා වුවමනාවලට සරිලන පරිදි එම ලෙලි කජු පිරිසැකසුම් කටයුතු සිදු කරමින් අගය එකතු කරන ලද කජු නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම සඳහා සංස්ථාව සතුව පිරිසැකසුම් මධ්‍යස්ථාන 02ක් පවතී. එම පිරිසැකසුම් මධ්‍යස්ථාන දෙක ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්වල පිහිටා ඇත.

2.5.7 ප්‍රතිපත්ති හා සැලසුම් අංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අපේක්ෂිත පරමාර්ථ ස්ථාපිත කිරීම සහ එකී පරමාර්ථ ළඟා කර ගැනීමට අදාළ ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම් කටයුතු සිදු කිරීම ප්‍රතිපත්ති හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර, ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය විසින් විවිධාකාරයේ සැලසුම් (Plans) ඉදිරිපත් කරන අතර, ඒවා මඟින් ඉටු කර ගත යුතු පරමාර්ථ සහ ඒවා ඉටු කර ගන්නා අකාරය

පිළිබඳව ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත මහපෙන්වීම සිදු කරනු ලබයි. ඉහත කාර්යයන්ට අමතරව ප්‍රතිපත්ති හා සැලසුම් අංශය විසින් පහත කාර්යයන් සිදු කරනු ලබයි.

- සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම වාර්ෂිකව සකස් කිරීම.
- සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාත්මක සැලැස්මට අදාළ අරමුණු සහ ඉලක්ක සත්‍ය ක්‍රියාකාරකම් සමඟ සංසන්දනය කර ඇගයීම් කටයුතු සිදුකිරීම, ඉහළ කළමණාකාරීත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය අනෙකුත් පාර්ශවයන් වෙත දැනුම් දීම සහ ඉලක්ක සපුරා ගැනීමේ බාධක සඳහා විසඳුම් සොයාගැනීම, සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කාර්ය සාධනය සහ ගැටළු වාර්තා කිරීම.
- කජු ගොවීන් සහ පිරිසැකසුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් සහ සංස්ථාවේ සියලුම වාණිජ කාර්යයන් පිළිබඳව දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- ඉලක්ක සපුරාගැනීමේ බාධාවන් හඳුනාගැනීම සහ එයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක ජයගැනීම් සඳහා සැලසුම් අවම පිරිවැයකින් යුක්තව සම්පාදනය කිරීම.
- කජු සංස්ථාව ලබාගන්නා ජයග්‍රහණ සහ කීර්තිනාමය ඉහළ නැංවීම, කජු වගා කිරීමේ ප්‍රතිලාභයන් මහජනතාව වෙත දැනුම් දීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදුකිරීම.
- වාර්ෂික වාර්තා පිළියෙල කිරීම.

2.6 ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල

2.6.1 ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය දැනට අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත. ප්‍රධාන කාර්යාලයට අමතරව කජු නිෂ්පාදිත අලෙවි කිරීම සඳහා අලෙවිසැලක් ද මෙම ස්ථානයෙහිම පිහිටා ඇත.

වගුව **2.6.1** : ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංක

දුරකථන :	
සභාපති	0112 - 871005
නියෝජ්‍ය සභාපති	0112 - 869844
සාමාන්‍යාධිකාරී	0112 - 876134
ෆැක්ස්	0112 - 867843
ඊ මේල්	cashewco@sltnet.lk
වෙබ් අඩවිය	www.cashew.gov.lk

2.6.2 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ප්‍රාදේශීය කාර්යාල

වගුව **2.6.2** : ප්‍රාදේශීය කාර්යාල

	නම හා තනතුර	ආවරණය වන දිස්ත්‍රික්කය	ලිපිනය	දුරකථන අංකය
1.	ඩබ්.එන්.පී. ධර්මරත්න මිය සහකාර ප්‍රාදේශීය කළමනාකරු	අනුරාධපුරය	ශ්‍රී ලංකා කජු සංස්ථාව, කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිති ගොඩනැගිල්ල, ගොඩගේ මාවත, අනුරාධපුරය.	025-2227071 070-1229968
2.	චම්ලා දෙනගම මිය සහකාර ප්‍රාදේශීය කළමනාකරු	බදුල්ල/මහනුවර	ශ්‍රී ලංකා කජු සංස්ථාව සී.ටී.සී.හන්දිය, අළුත්තරම, මහියංගනය.	071-6153963
3.	රංජිත් ගමගේ මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු(වැ.ඛ.)	රත්නපුර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මධ්‍යම පැළ තවාන, කිරලවැල්කොටුව, ඇඹිලිපිටිය.	070-5617732
4.	එල්. සංජීවන් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	කිලිනොච්චි/ මුලතිව්/යාපනය/ වවුනියාව/ මන්නාරම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, පරණ කච්චේරිය ගොඩනැගිල්ල, කිලිනොච්චිය.	021-2283830 077-9850497
5.	පී.එම්.සී. විජේකුමාර මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු (වැ.ඛ.)	අම්පාර	ශ්‍රී ලංකා කජු සංස්ථාව, 40 වන සැතපුම් කණුව, මංගලගම, අම්පාර.	071-4970974
6.	කේ.ඒ.ඒ.එන් අමරසිංහ මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මොණරාගල	ශ්‍රී ලංකා කජු සංස්ථාව, හෝමාගම වත්ත, 22 වන සැතපුම් කණුව,නක්කල, මොණරාගල.	055-2252090 071-8159195
7.	කේ.බී.එස්.ජේ කාරියවසම් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	හම්බන්තොට	ශ්‍රී ලංකා කජු සංස්ථාව සිල්වාස්, මල්පෙත්තාව, අම්බලන්තොට.	047-2223407 071-8576359
8.	ඩබ්.එන්.පී. ධර්මරත්න මිය සහකාර ප්‍රාදේශීය කළමනාකරු (වැ.ඛ.)	පුත්තලම	ශ්‍රී ලංකා කජු සංස්ථාව, ශාන්ත මරියාපාර, සේනකුදිරිප්පුව, පුත්තලම.	032-2265998 070-1229968
9.	එච්.ටී.ඩී.දයාරත්න මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මඩකලපුව/ පොළොන්නරුව	ශ්‍රී ලංකා කජු සංස්ථාව, මහජන පුස්තකාලය, වී.සී පාර, වදුරමුලෙයි.	065-3658566 070-4902580

නම හා තනතුර		ආවරණය වන දිස්ත්‍රික්කය	ලිපිනය	දුරකථන අංකය
10.	බී.ජී. කුමාරසිංහ මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	මාතලේ	ශ්‍රී ලංකා කජු සංස්ථාව, නො. 138, දඹුල්ල පාර, උඩුදෙනිය, නාලන්ද.	071-4481510
11.	ආර්.එස්.නරේෂ් කුමාර් මයා සහකාර ප්‍රාදේශීය කළමනාකරු	ත්‍රිකුණාමලය	ශ්‍රී ලංකා කජු සංස්ථාව, නුවර පාර, තඹලගමුව, ත්‍රිකුණාමලය.	077-1303648

2.7 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් වතුයායන්

වගුව **2.7 :** වතුයායන් සහ ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංකය	වතුයායේ නම	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් නඩත්තු කරන ලද අක්කර ප්‍රමාණය
01.	කමන්දළුව වතුයාය	පුත්තලම	548	494
02.	ආච්චිගෙවත්ත වතුයාය	පුත්තලම	961	761
03.	හාඩි වතුයාය	මඩකලපුව	365	190
04.	කොණ්ඩච්චි වතුයාය	මන්නාරම	6,498	765
05.	මාන්කර්ණි වතුයාය	මඩකලපුව	1,075	115
06.	පුනරීන් වතුයාය	කිලිනොච්චි	479	250
07.	වෙල්ලන්කුලම වතුයාය	මන්නාරම	500	265
08.	තිරියාය වතුයාය	ත්‍රිකුණාමලය	35	5
	එකතුව		**10,461**	**2,845**

- කොණ්ඩච්චි වතුයායේ අක්කර 1,435ක භූමි ප්‍රමාණයක් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කටයුතු සිදු කර, වගා කරනු ලබයි.

2.8 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් බීජ උද්‍යාන

වගුව **2.8 :** බීජ උද්‍යාන පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංක	බීජ උද්‍යාන	පිහිටි දිස්ත්‍රික්කය	මුළු අක්කර ප්‍රමාණය	වගාකර ඇති අක්කර ප්‍රමාණය
01.	එළුවන්කුලම බීජ උද්‍යානය	පුත්තලම	616	245
02.	විලච්චිය බීජ උද්‍යානය	අනුරාධපුරය	25	17

03.	සුදුවතුර ආර බීජ උද්‍යානය	මොණරාගල	45	45
04.	මහඔය බීජ උද්‍යානය	අම්පාර	81	80
05.	නාලන්ද බීජ උද්‍යානය	මාතලේ	135	50
	එකතුව		**902**	**437**

2.9 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් පැළ තවාන්

වගුව 2.9 : පැළ තවාන් පිහිටි ඉඩම් අක්කර ප්‍රමාණය

අනු අංක	මධ්‍යම පැළ තවානේ නම	අවරණය වන දිස්ත්‍රික්ක	අක්කර ප්‍රමාණය	පැළ නිෂ්පාදන ධාරිතාවය (පැළ ගණන)
01.	මිහින්තලේ පැළ තවාන	අනුරාධපුර/වව්නියා/ කිලිනොච්චි/ මුලතිව්/ මන්නාරම	2.5	160,000
02.	දඹුල්ල පැළ තවාන	මාතලේ/පොළොන්නරුව	3.0	50,000
03.	කමන්දළුව පැළ තවාන	පුත්තලම/ කුරුණෑගල	3.0	240,000
04.	හාඩි පැළ තවාන	මඩකලපුව/ ත්‍රිකුණාමලය	1.0	40,000
05.	කුඹුක්කන පැළ තවාන	මොණරාගල	3.0	150,000
06.	මහියංගණය පැළ තවාන	බදුල්ල/ මහනුවර	1.5	60,000
07.	චන්ද්‍රිකාවැව පැළ තවාන	හම්බන්තොට/ රත්නපුර	1.0	60,000
08.	මංගලගම පැළ තවාන	අම්පාර	0.25	15,000
එකතුව			**15.25**	**775,000**

2.10 ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන

<u>කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය</u>		<u>දිස්ත්‍රික්කය</u>
01. නැඳගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	-	ගම්පහ
02. පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය	-	පුත්තලම

2.11 ශ්‍රී ලංකා කපු සංස්ථාවට අයත් කපු පර්යේෂණ ඒකක

පර්යේෂණ ඒකක		දිස්ත්‍රික්කය
01. කමන්දළුව පර්යේෂණ ඒකකය	-	පුත්තලම
02. පුත්තලම පර්යේෂණ ඒකකය	-	පුත්තලම

2.12 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ප්‍රධාන ඒකාබද්ධ පර්යේෂණ සහයෝගීතාවය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලැබේ.

2.13 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ අලෙවි සැල්

වගුව 2.13 : ශ්‍රී ලංකා කපු සංස්ථාවේ කපු අලෙවිසැල්

අනු අංකය	සංස්ථා කපු අලෙවි සැල් පිහිටි ස්ථාන	දිස්ත්‍රික්කය
01.	රාජගිරිය කපු අලෙවිසැල, අංක 1334, පරණ කෝට්ටේ පාර, රාජගිරිය.	කොළඹ
02.	කොල්ලුපිටිය අලෙවිසැල, අංක 518, ගාලු පාර, කොළඹ 03.	කොළඹ
03.	නාරාහේන්පිට කපු අලෙවිසැල, ආර්ථික මධ්‍යස්ථානය, රාජ්‍ය වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල.	කොළඹ
04.	බලංගොඩ කපු අලෙවිසැල, 122 D, බාන්ස් රත්වත්ත මාවත, බලංගොඩ.	රත්නපුර
05.	රත්නපුර කපු අලෙවිසැල, අංක 32, කෙළින් වීදිය, රත්නපුර.	රත්නපුර

2.14 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වරලත් අලෙවි සැල්

වගුව 2.14 : ශ්‍රී ලංකා කපු සංස්ථාවේ වරලත් කපු අලෙවි සැල්

අනු අංකය	සංස්ථා වරලත් කපු අලෙවිසැල්	දිස්ත්‍රික්කය
01.	ආනන්ද ෆුඩ් සිටි, අංක 272, අහුරුවාතොට පාර, හොරණ.	කළුතර
02.	සුනිලා ග්‍රොසරි, අංක 35, අළුත් පාර, අම්බලන්ගොඩ.	ගාල්ල
03.	ගෝල්ඩන් මේඩ්, 144, ගාලු පාර, අහංගම.	ගාල්ල

අනු අංකය	සංස්ථා වරලත් කජු අලෙවිසැල්	දිස්ත්‍රික්කය
04.	රුහුණු රසාර, Agriculture Dept., ලබුදුව, ගාල්ල.	ගාල්ල
05.	සම්පත් ෆාමසි ඇන්ඩ් ග්‍රොසරි, 39 E, මාතර පාර, අකුරැස්ස.	ගාල්ල
06.	රුහුණු රසාර, Agriculture Dept.,මාතර.	මාතර
07.	අබේගුණවර්ධන ස්ටෝර්ස්, දෙනියාය.	මාතර
08.	සීමාසහිත යටිනුවර ගහපළාත විවිධ සේවා සමූපකාර සමිතිය, පොල්ගහමුල හන්දිය, පේරාදෙණිය.	මහනුවර
09.	සීමාසහිත යටිනුවර මැද පළාත විවිධ සේවා සමූපකාර සමිතිය, ඇඹිල්මීගම, පිළිමතලාව.	මහනුවර
10.	සීමාසහිත මධ්‍යම පළාත් සමූපකාර සමිතිය, ඇහැලේපොළ කුමාරිහාමි මාවත බෝගම්බර, මහනුවර.	මහනුවර
11.	සීමාසහිත පූජාපිටිය සමූපකාර සමිතිය, පූජාපිටිය	මහනුවර
12.	සීමාසහිත මහනුවර විවිධ සේවා සමූපකාර සමිතිය, කෝප්සිටි අලෙවිහල, පල්ලෙකැලේ.	මහනුවර
13.	කෝප් සිටි, කුණ්ඩසාලේ.	මහනුවර
14.	සෙප්කෝ සුපර්, බෝගම්බර.	මහනුවර
15.	විවිධ සේවා සමූපකාර සමිතිය, මහනුවර.	මහනුවර
16.	Royal Mall (Pvt) Ltd, මහනුවර.	මහනුවර
17.	Sunrise Super, කුණ්ඩසාලේ.	මහනුවර
18.	EPPCO Mini Mart, ප්‍රධාන පාර, මාවනැල්ල.	කෑගල්ල
19.	ප්‍රෙෂ් ෆාම් ෂොප්, ගාලු පාර, හික්කඩුව.	ගාල්ල
20.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මැල්සිරිපුර.	කුරුණෑගල

2.15 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංචාරක බංගලා

<u>සංචාරක බංගලා</u>		<u>දිස්ත්‍රික්කය</u>
1. පුත්තලම සංචාරක බංගලාව	-	පුත්තලම
2. හාඩි සංචාරක බංගලාව	-	මඩකලපුව

- සංස්ථාවට අයත් කොණ්ඩච්චි වතුයායේ සංචාරක බංගලාවක් මේ වන විට ඉදිකරමින් පවති.


2.16 ශ්‍රී ලංකා කපු සංස්ථාවේ කාර්ය මණ්ඩලය

වගුව **2.16 : 2023** වර්ෂයේ සේවය කරන ලද කාර්ය මණ්ඩලය

වැටුප් ක්‍රේතය	තනතුර	අනුමත සංඛ්‍යාව	2023 වර්ෂයේදී සිටින සේවක ප්‍රමාණය		පුරප්පාඩු
			ස්ථිර	කොන්ත්‍රාත්	
HM 1-3	සාමාන්‍යාධිකාරී	01	-	-	01
HM 1-1	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	01	01	-	-
MM 1-1	සහකාර සාමාන්‍යාධිකාරී - මුදල්	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාප්ති හා පර්යේෂණ	01	01	-	
	සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි හා පිරිසැකසුම්	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - වැවිලි	01	01	-	-
	සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පාලන	01	-	-	01
	සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රතිපත්ති හා සැලසුම්	01	-	-	01
JM 1-1	ප්‍රාදේශීය කළමනාකරු/ ස.ප්‍රාදේශීය කළමනාකරු	11	08	01	02
	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි/ පර්යේෂණ නිලධාරි	02	01	-	01
	වැවිලි නිලධාරී	01	-	-	01
	ව්‍යාප්ති නිලධාරී	01	-	-	01
	වතු අධිකාරී	04	04	-	-
	තත්ත්ව සහතික කිරීමේ නිලධාරී	02	-	-	02
	පරිපාලන නිලධාරී	01	01	-	-
	මූල්‍ය නිලධාරී	01	01	-	-
	අලෙවි ප්‍රවර්ධන නිලධාරී	01	01	-	-
	අභ්‍යන්තර විගණන නිලධාරී	01	-	-	01
	සැලසුම්, අධීක්ෂණ හා ඇගයීම් නිලධාරී	01	-	-	01
MA - 4	භාෂා පරිවර්තක	01	-	-	01
MA 2-1	වැවිලි සහකාර	37	15	01	21
	තොරතුරු තාක්ෂණ සහකාර	01	01	-	-
	විගණන සහකාර	02	02	-	-
	මූල්‍ය සහකාර	01	01	-	-
	ප්‍රවාහන සහකාර	01	01	-	-
MA 1-1	කළමනාකරණ සහකාර	57	40	05	12
	ක්ෂේත්‍ර සහකාර	22	08	-	14
PL - 3	රියැදුරු	26	21	02	03
	බොයිලර් යන්ත්‍ර ක්‍රියාකරු	02	-	-	02
PL - 2	කම්කරු පරිපාලක	07	08	-	-
	සංචාරක බංගලා භාරකරු	03	-	-	03
PL - 1	කාර්යාල සහායක	16	14	05	-
	මුරකරු	11	06	03	02
	වාහන සහායක	02	02	-	-
		224	141	**17**	**70**

- සේවා අවශ්‍යතාවය මත සිදු කරගෙන ඇති බඳවා ගැනීම්වලට අනුව කම්කරු පරිපාලක 01ක් හා කාර්යාල සහායකවරුන් 03නෙකු අනුමත ප්‍රමාණයට වඩා අතිරික්තව සේවය කරනු ලබයි.

2.17 ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ආයතනික ව්‍යුහය



03. ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංවර්ධන කාර්යයන්

ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් කජු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා මෙන්ම සංස්ථාවේ සංවර්ධනය සඳහා පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලබයි.

01. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම (සහනාධාර ව්‍යාපෘතිය සඳහා).
02. කජු සහනාධාර යෝජනා ක්‍රමය.
03. වැවිලි කළමනාකරණය.
04. වාණිජ කටයුතු, වතුයායන්වල වගාව සඳහා සහ වෙනත් ව්‍යාපෘති සඳහා කජු පැළ නිෂ්පාදනය.
05. භූමි ඵලදායිතා ප්‍රවර්ධනය.
06. පර්යේෂණ හා සංවර්ධනය.
07. කජු පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය.
08. මානව සම්පත් කළමනාකරණය.
09. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

සංස්ථාව යටතේ පවතින කමන්දළුව, මිහින්තලේ, හාඩි, දඹුල්ල, කුඹුක්කන, චන්ද්‍රිකා වැව, මහියංගනය හා මංගලගම යන මධ්‍යම පැළ තවාන් තුළ රෝපණ ද්‍රව්‍ය හෙවත් කජු පැළ නිෂ්පාදනය කරනු ලබන අතර, ප්‍රශස්ත නිෂ්පාදන ක්‍රමවේද (GAP) යටතේ උසස් නිෂ්පාදන තත්ත්වයන් පවත්වා ගනිමින් මෙම කජු පැළ නිෂ්පාදනය සිදු කරනු ලබයි. එසේ නිෂ්පාදනය කරනු ලබන කජු පැළ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කජු සහනාධාර වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 20ක් ආවරණය වන පරිදි කජු වගාව කෙරෙහි ඇල්මක් දක්වන ඒ සඳහා සුදුසු ඉඩම් හිමි ගොවීන් වෙත බෙදා දීම සිදු කරනු ලබයි.

2023 වර්ෂයේදී මෙම පැළ තවාන් තුළ බද්ධ කජු පැළ 93,560ක් නිෂ්පාදනය කර කජු සහනාධාර ව්‍යාපෘතිය යටතේ විධිමත් පරිදි තෝරාගත් ගොවීන් වෙත නොමිලේ බෙදා දී ඇත.

3.2 කජු සහනාධාර යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් ශ්‍රී ලංකාව තුළ කජු වගාවේ ව්‍යාප්තිය වැඩි දියුණු කරලීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, මෙම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරය මඟින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 20ක් ආවරණය වන පරිදි කජු වගාව සඳහා සුදුසු ඉඩම් හිමි ගොවීන් තෝරාගෙන ඔවුන්ගට තම වගාවන් සිදුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුව ලබා දී වගාවන් සිදු කිරීමට අවශ්‍ය කජු පැළ නොමිලයේ ලබා දීම සිදුකරනු ලබයි.

වගුව 3.2 : 2023 වර්ෂයේ සහනාධාර කජු වගා භූමි ප්‍රමාණය

	දිස්ත්‍රික්කය	බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)	ගෙවතු වගාව	
				බද්ධ කජු (අක්කර)	බීජ කජු (අක්කර)
1	පුත්තලම	104	25	1	-
2	කුරුණෑගල	61.3	-	3.7	-
3	කෑගල්ල	2.5	-	2.5	-
4	ගම්පහ	49.43	-	-	-
5	අනුරාධපුරය	118	-	32	-
6	වව්නියාව	40	-	-	-
7	මන්නාරම	10	1	-	-
8	මුලතිව්	20	22.5	-	-
9	යාපනය	10	-	-	-
10	කිලිනොච්චිය	30	5	-	-
11	මොණරාගල	96.74	-	25	-
12	මාතලේ	45	-	30	33.25
13	අම්පාර	50	75	25	-
14	පොළොන්නරුව	-	122.5	-	-
15	බදුල්ල	50	-	55	-
16	හම්බන්තොට	118	-	-	-
17	රත්නපුරය	15	10	20	5
18	මඩකලපුව	75	50	25	-
19	ත්‍රිකුණාමලය	50	-	40	-
20	මහනුවර	-	-	20	-
එකතුව		**945**	**311**	**279.2**	**38.25**

මෙම වර්ෂයේදී බද්ධ කජු අක්කර 945ක් හා බීජ කජු අක්කර 311ක් වගා කරන ලද අතර මෙම සහනාධාර යෝජනා ක්‍රමය මඟින් ගෙවතු වගාව යටතේ අක්කර 317.45ක් සඳහා කජු පැළ ලබා දෙන ලදි. එමෙන්ම මෙම වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභී පවුල් 3,036ක් සඳහා පුහුණුව ලබා දී ඇත.

3.3 වැවිලි කළමනාකරණය

3.3.1 බීජ උද්‍යාන සංවර්ධනය

සංස්ථාව සතුව බීජ උද්‍යානයන් 06ක් පවතී. ඒවා සුදුවතුර ආර, කොණ්ඩච්චි, තිරියාය, එළුවන්කුලම II, පුත්තලම සහ මාන්කර්ණි II අදියර වේ.

මෙම බීජ උද්‍යාන තුළ බද්ධ පැළ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අංකුර එකතු කිරීම සහ මව් බීජ තෝරාගැනීම සිදු කරනු ලබයි. මව් බීජ යොදා ගෙන බද්ධ කිරීම සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය කරනු ලබන අතර, මව් ශාකවලින් සුදුසු අංකුර ලබාගෙන ඒවා බද්ධ කරනු ලබයි.

2023 වර්ෂයේදී සංස්ථා බීජ උද්‍යානයන් තුළ බද්ධ කිරීමට අවශ්‍ය අංකුර 231,250ක් එකතු කර ඇති අතර, මව් බීජ 289,062ක් තෝරාගෙන ඇත.

මෙම වර්ෂය තුළදී සංස්ථා බීජ උද්‍යානවල අක්කර 1,115ක් නඩත්තු කටයුතු හා පුනරුත්ථාපන කටයුතු සිදු කරන ලදි. මීට අමතරව මෙම වර්ෂයේදී එළුවන්කුලම II අදියරේ අක්කර 40ක් නව වගාව සිදු කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

3.3.2 සංස්ථාව සතු වතුයායන් නඩත්තු කිරීම.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වතු අංශය මඟින් 2023 වර්ෂය තුළදී ප්‍රධාන වතුයායන් 13ක් පවත්වාගෙන යන ලදි. මෙම වතුයායන් නඩත්තු කිරීම මඟින් දේශීය පාරිභෝජනය සඳහා ගුණාත්මක තත්ත්වයෙන් උසස් කජු මද නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ලෙලි කජු අස්වැන්න වාර්ෂිකව ලබා ගැනීම සිදු කරනු ලබයි.

2023 වර්ෂයේදී මෙම වතුයායන්වල අක්කර 3,178ක පූර්ණ වශයෙන් නඩත්තු කටයුතු සිදු කර ඇත. එම එක් එක් වතුයායන්වල නඩත්තු කටයුතු සිදු කරන ලද අක්කර ප්‍රමාණයන් පහත දැක්වේ.

වගුව 3.3.2 : 2023 වර්ෂයේ නඩත්තු කරන ලද අක්කර ප්‍රමාණය

	වතුයාය	නඩත්තු කරන ලද අක්කර ප්‍රමාණය
1	විලච්චිය	25
2	එළුවන්කුලම	210
3	මහඔය	45
4	නාලන්ද	50
5	හාඩි	190

	වතුයාය	නඩත්තු කරන ලද අක්කර ප්‍රමාණය
7	පුත්තලම	761
8	තිරියාය	10
9	කොණ්ඩව්වි	475
10	පුනරීන්	479
11	සුදුවතුර ආර	45
12	කමන්දළුව	548
13	මාන්කර්ණි I	140
එකතුව		**3,178**

දේශීය පරිභෝජනය සඳහා අවශ්‍ය කජු මද නිෂ්පාදනය කිරීම සඳහා 2023 වර්ෂයේදී සංස්ථා වතුයායන් තුළින් ලබාගත් ලෙලි කජු මෙ.ටො. 85.06ක (ගබඩා බර) ප්‍රමාණයක් පිරිසැකසුම් කටයුතු සඳහා යොදා ගෙන ඇත.

එමෙන්ම සංස්ථාවේ වතුයායන්වල පොල් වගාව ද සිදු කරනු ලබන අතර, මෙම වර්ෂයේදී පොල් ගෙඩි 57,425ක අස්වැන්නක් ලබා ගෙන ඇත.

3.4 කජු පැළ නිෂ්පාදනය (පැළ තවාන් කළමනාකරණය)

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ මධ්‍යම පැළ තවාන් 08ක් පවතින අතර, මෙම මධ්‍යම පැළ තවාන්වල වාණිජ කටයුතු සහ විශේෂ ව්‍යාපෘති සඳහා බද්ධ කජු පැළ නිෂ්පාදනය කරනු ලබන අතර, 2023 වර්ෂයේදී ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු වැඩි ඵලදාවක් සහිත නව ප්‍රභේදවලින් සමන්විත බද්ධ පැළ 171,400ක් සාර්ථකව නිෂ්පාදනය කර ඇත.

මෙම මධ්‍යම පැළ තවාන්වල නිෂ්පාදනය කරනු ලබන බද්ධ පැළ සංස්ථා වතුයායන් සඳහා, වාණිජ කටයුතු සඳහා, සහනාධාර වැඩසටහන් යටතේ පෞද්ගලික වතුහිමියන් සඳහා මෙන්ම රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන වෙනත් විශේෂ ව්‍යාපෘතීන් සඳහා යොදා ගනු ලබයි.

3.5 භූමි ඵලදායීතා ප්‍රවර්ධනය

කජු වගාව සඳහා බලපාන රෝග සහ පළිබෝධ මර්දනය කිරීම සඳහා යොදාගත හැකි නිවැරදි කෘෂිකාර්මික ක්‍රමවේද භාවිතා කරමින් ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශය මඟින් විවිධ පර්යේෂණයන් සිදු කරනු ලබයි. මෙම වර්ෂය තුළදී වතුයායන්වල කජු වගාව කෙරෙහි බලපාන පළිබෝධ සහ රෝග පාලනය කිරීම සඳහා අක්කර 3,604ක් සඳහා කෘමිනාශක යොදන ලදි. මේ සඳහා ඇසටමයිප්‍රිඩ් 20% (Mospilan 100g) 120.4 kg රසායනික ද්‍රව්‍ය භාවිතා කර ඇත.

එමෙන්ම අමතර ආදායම් ඉපැයීම අරමුණු කරගෙන සංස්ථා වතුයායන්වල සිදු කරනු ලබන පොල් වගාවේ ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් ඵලදාව සහිත හා ඵලදාව රහිත වගාවන් හඳුනාගෙන ඒ සඳහා පොහොර යෙදීම මෙම වර්ෂයේදී සිදු කර ඇත.

3.6 පර්යේෂණ හා සංවර්ධනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පර්යේෂණ අංශයන් 02ක් පවතී. ඒවා පුත්තලම හා කමන්දළුව පිහිටා ඇත. කජු වගා කිරීමේ ගුණාත්මකභාවය හා අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා තිරසාර සහ කාර්යක්ෂම වගා ක්‍රමවල නවීකරණය සිදු කිරීම සහ කජු වගා කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ යෝජනා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යය වන අතර, මීට අමතරව පහත කාර්යයන් සිදු කරනු ලබයි.

01. කජු භෝගවල ගුණාත්මකභාව සහ අස්වැන්න වැඩි දියුණු කිරීම.
02. තිරසාර සහ කාර්යක්ෂම කජු වගා ක්‍රම සංවර්ධනය.
03. ඉහළ ඵලදාවක් සහිත නවීන කජු ප්‍රභේදයන් හඳුනාගැනීම සඳහා අදාළ පර්යේෂණ සිදු කිරීම.
04. කජු අගය එකතු කළ නිෂ්පාදන සහ කජු ආශ්‍රිත නිෂ්පාදන නවීකරණය.
05. කජු භෝගවලට බලපාන පළිබෝධ සහ රෝගවලට විරුද්ධව පර්යේෂණ සිදු කිරීම.
06. කජු වගාවේ නවීන තාක්ෂණයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම.
07. පර්යේෂණ ප්‍රතිඵල ගොවීන් සහ අදාළ පාර්ශවකරුවන් වෙත පැවරීම යනාදී පර්යේෂණ කාර්යයන් පර්යේෂණ අංශය මඟින් වාර්ෂිකව සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, 2023 වර්ෂයේදී පර්යේෂණ කාණ්ඩ 07ක් යටතේ පුත්තලම පර්යේෂණ අංශයේ පර්යේෂණ 05ක් ද කමන්දළුව පර්යේෂණ අංශයේ පර්යේෂණ 08ක් ද වශයෙන් ක්‍රියාත්මක කරන ලදි. එම පර්යේෂණ සහ කාලසීමාවන් පහත පරිදි වේ.

වගුව 3.6 : 2023 වර්ෂයේ සිදුකරන ලද පර්යේෂණ

	පර්යේෂණ අංශය	පර්යේෂණය	පර්යේෂණ කාලය
01	Puttalam Research Unit.	Promising one new superior cashew variety for commercial Planting.	2016-2024
02		Germplasm conservation Mutative District.	2016-2030
03		Germplasm conservation (Mannar District, Mulative District & Western Province).	2014-2030

	පර්යේෂණ අංශය	පර්යේෂණය	පර්යේෂණ කාලය
04		Effect of five difference spaces on cashew Plants.	2012-2024
05		Evolution of the effectiveness of chemical insecticides in controlling cashew stem and root border under field conditions.	2023
06	Kamandaluwa Research Unit.	Promising superior cashew variety for commercial planting.	2015-2030
07		Effect of five deference spaces on cashew.	2015-2030
08		Bud Wood nursery on cashew 1.	2014-2030
09		Bud Wood nursery on cashew 2.	2017-2033
10		Living performance of patch bud demonstration 1	2017-2033
11		Living performance of patch bud demonstration 2.	2006-2030
12		Distinguish the overall performance of cashew.	2017-2033
13		To see the adult varietal ratio cashew.	2017-2033

3.7 කජු පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව යටතේ පිරිසැකසුම් මධ්‍යස්ථාන 02ක් පවතී. ඒවා නැදගමුව හා පුත්තලම පිහිටා ඇත. මෙම පිරිසැකසුම් මධ්‍යස්ථාන තුළ දේශීය පාරිභෝජනය සඳහා අවශ්‍ය කජු නිෂ්පාදනය සිදු කරයි. සංස්ථා වතුයායන්ගෙන් ලැබෙන අස්වැන්න පිරිසැකසුම් කටයුතු සඳහා යොදාගෙන ගුණාත්මක තත්ත්වයෙන් උසස් කජු වෙළඳපොල වෙත ඉදිරිපත් කරනු ලබයි.

උසස් ප්‍රමිතියෙන් යුක්ත වූ කජු මද නිෂ්පාදන වෙළෙඳපොල වෙත ඉදිරිපත් කිරීම මඟින් ඉහළ මිලක් උපයා ගැනීම පිණිස සහ වර්තමානයේ පවතින වෙළඳපොල තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා උසස් නිෂ්පාදන යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ.

මෙම කාර්යයන්ට අමතරව කජු නිෂ්පාදන පිරිසැකසුම් කටයුතු සම්බන්ධයෙන් ඇල්මක් දක්වන සියලුම පාර්ශවකරුවන් වෙත ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් එම අවශ්‍යතා ගුණාත්මකභාවයෙන් සහ ඉහළ ඵලදායිතාවකින් යුක්තව සිදු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ද මෙම පිරිසැකසුම් මධ්‍යස්ථානවල සිදු කරනු ලබයි.

2023 වර්ෂයේදී වතුයායන්ගෙන් ලබා ගන්නා ලද ලෙලි කජු මෙ.ටො.169.35ක් පුත්තලම සහ නැදගමුව යන පිරිසැකසුම් මධ්‍යස්ථානවල පිරිසැකසුම් කටයුතු සඳහා යොදා ගනිමින් කජු මද මෙ.ටො. 42.09ක ප්‍රමාණයක් ලබා ගෙන ඇති අතර, අගය එකතු කරන ලද කජු මද මෙ.ටො. 33.72ක් අලෙවි කිරීම මඟින් රු. මි. 167.82ක ආදායමක් උපයා ඇත.

එමෙන්ම වෙළඳපොල තරඟකාරී තත්ත්වයන්ට මුහුණ දීම සහ පිරිවැය අවම කිරීමේ පරමාර්ථයෙන් මෙම වර්ෂයේදී ලෙලි කජු මෙ.ටො. 99.64ක ප්‍රමාණයක් මිලදී ගන්නා ලදි. මේ නිසා තරඟකාරී වෙළඳපොල පරාසයක් ස්ථාපනය විය.

3.7.1 දේශීය පාරිභෝජනය සඳහා ලෙලි කජු සහ කජු මද ආනයනය

දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන කජු ප්‍රමාණවත් නොවීම කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන්ට අවශ්‍ය ලෙලි කජු සහ කජු මද දේශීය වෙළඳපොල තුළ හිඟතාවයක් ඇති වීම හේතුවෙන් ඒ සඳහා විසඳුමක් වශයෙන් කුඩා පරිමාණ කජු පිරිසැකසුම්කරුවන් සඳහා බදු සහන යටතේ ලෙලි කජු සහ කජු මද ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීම ශ්‍රී ලංකා කජු සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

මෙම ආනයන බලපත්‍ර තාවකාලික පදනම මත දේශීය නිෂ්පාදන වෙළඳපොලෙහි හිඟ කාලයේදී පමණක් ලබා දීම සිදු කරයි. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්තාවලට අනුව, මෙම වර්ෂයේදී කජු මද මෙ.ටො. 47.66ක් ආනයනය කර කුඩා පරිමාණ නිෂ්පාදකයන් රාශියක් අතර බෙදාහරින ලදී. මේ අනුව, කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පවුල්වලට තම ජීවනෝපාය ස්ථාවර කිරීමට හා ඔවුන්ගේ ආර්ථික හා සාමාජීය මට්ටම ඉහළ නංවාලීම සඳහා සංස්ථාවට මැදිහත්වීමට අවස්ථාව ලැබුණි.

3.8 මානව සම්පත් කළමනාකරණය

ආයතනයක මානව සම්පත් වශයෙන් ඵලදායී නිෂ්පාදන කටයුතුවලට යොමු කළ හැකි සේවකයන් සතුව ඇති ශක්තීන්, දැනුම, කුසලතාවයන් හා අත්දැකීම් හැඳින්විය හැකිය. ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මානව සම්පත් කළමනාකරණ හා පාලන අංශය විසින් සියලුම අංශ, ඒකක සහ සංස්ථාව යටතේ පවතින අනෙකුත් කාර්යාල සම්බන්ධීකරණය කරමින් සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීමත්, අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කරමින් සහ වැඩිදියුණු කරමින් මානව සම්පතෙහි ඵලදායීතාව උපරිම කිරීම සඳහා කටයුතු කරනු ලබයි.

3.8.1 මානව සම්පතේ සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන්වල දායකත්වය

පුහුණු වැඩසටහන් මඟින් සේවකයින්ගේ කාර්ය ඵලදායීතාව ඉහළ නැංවීමටත්, ඔවුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීමටත්, නව දැනුම ලබා ගැනීමටත් අවස්ථාව සැලසෙන අතර

ස්වයං පෙළඹවීම මඟින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. මෙම පුහුණු වැඩසටහන් අඛණ්ඩව ඉදිරි වර්ෂවල සිදු කිරීමට සැලසුම් කර ඇත.

සේවකයන්ගේ ඵලදායිතාව, විෂය දැනුම හා කාර්යක්ෂමතාව වර්ධනය වීම තුළින්, කජු අස්වැන්න ඉහළ නැංවීම, කජු පිරිසකැසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායිතාව ඉහළ නැංවීම, කජු අපනයන දිරි ගැන්වීම, ශ්‍රී ලංකා කජු සංස්ථාව කජු නිෂපාදනයේ ප්‍රමුඛයා බවට පත් කිරීම හා ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත් කිරීම වැනි අභිමාර්ථයන් කරා ළඟා වීමට පුහුණු වැඩසටහන් මහඟු දායකත්වයක් සපයයි.

මෙම වර්ෂය තුළදී කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් Narahenpita Institute of Personal Management ආයතනයේ පවත්වන ලද අභ්‍යන්තර විගණන පරිචය පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර හා විගණන විසින් සහභාගී වන ලදි.

කණිෂ්ඨ කළමනාකරණ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් මෙම වර්ෂයේදී පවත්වන ලදි. එමෙන්ම මෙම වර්ෂයේදී සමස්ත සේවකයින්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

3.9 වෙනත් ව්‍යාපෘති

3.9.1 අපනයන ගම්මාන ව්‍යාපෘතිය

සංස්ථාව විසින් කජු අපනයනය ඉලක්ක කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 11ක් මුල් කරගෙන බද්ධ කජු පැළ බෙදා දීම සිදු කරනු ලබන අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 25ක් ආවරණය කරමින් සංස්ථා වාණිජ තවාන්වල නිෂ්පාදනය කරනු ලබන ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බද්ධ පැළ බෙදා දීම සිදු කරනු ලබයි.

මෙම වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ බෙදා දුන් පැළ ප්‍රමාණයන් පහත පරිදි වේ.

වගුව 3.9.1 : 2023 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය යටතේ නිකුත් කළ පැළ ප්‍රමාණය

අ.අ	දිස්ත්‍රික්කය	නිකුත් කළ පැළ ප්‍රමාණය
01	හම්බන්තොට	4,900
02	මඩකලපුව	7,000
03	වවුනියාව	4,410
04	කිලිනොච්චිය	2,800
05	මුලතිව්	6,370
06	මන්නාරම	700

අ.අ	දිස්ත්‍රික්කය	නිකුත් කළ පැළ ප්‍රමාණය
07	යාපනය	700
08	මොණරාගල	13,793
09	පොළොන්නරුව	4,059
10	ගම්පහ	2,000
11	කුරුණෑගල	23,000
එකතුව		69,732

4. පරිපාලන කටයුතු

ශ්‍රී ලංකා කජු සංස්ථාව රාජ්‍ය ව්‍යාපාරික ආයතනයක් වශයෙන් පිහිටවනු ලැබූ බැවින්, දේශීය පාරිභෝජනය සඳහා අවශ්‍ය ගුණාත්මක තත්ත්වයෙන් උසස් කජු නිෂ්පාදනය කිරීමට අමතරව දිස්ත්‍රික්ක 20ක් තුළ විහිදී ඇති කජු වගාව සිදු කරනු ලබන වගාකරුවන් වෙත තම වගාවන් සාර්ථකව සිදු කිරීම සඳහා අවශ්‍යවන මඟ පෙන්වීම හා අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි. මීට අමතරව සංස්ථාව විසින් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සමඟ ඒකාබද්ධව පර්යේෂණ සිදු කරමින්, නව කජු ප්‍රභේදයන් හඳුන්වා දෙමින්, එම ප්‍රභේදයන් යටතේ කජු පැළ නිෂ්පාදනය කරමින් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාප්ති වැඩසටහන් මඟින් තෝරාගත් ගොවීන් වෙත තම කජු වගාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය පැළ නොමිලයේ ලබා දීම සිදු කරනු ලබයි.

එමෙන්ම කජු පිරිසැකසුම් කර්මාන්තයේ නියැලෙන පාර්ශවයන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන්ට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් පහසුකම් සලසා දීම සිදු කරනු ලබයි. එමෙන්ම කජු නිෂ්පාදන මිලදී ගන්නා පාර්ශවයන් වෙත ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම සිදු කරනු ලබන අතර, ඔවුන්ට අගය එකතු කරන ලද කජු නිෂ්පාදන අලෙවි කිරීම මඟින් ලාභ ඉපැයීම ද සිදු කරනු ලබයි.

මෙම කාර්යයන් සාර්ථකව සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ ශ්‍රම දායකත්වය නොමඳව ලබා දෙන අතර, රජයේ නව සංවර්ධන උපායමාර්ග, චක්‍රලේඛ හා අණපනත්වලට අනුකූලව ජනතාවගේ ආදායම් උත්පාදනය කිරීම මෙන්ම සංස්ථාවේ අපේක්ෂිත අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා ද, මේ අනුව කටයුතු කළ හැකි විය.

4.1 2023.12.31 දිනට කාර්ය මණ්ඩල කළමනාකරණය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතියික, ප්‍රාථමික හා කොන්ත්‍රාත් යන සේවා මට්ටම්වල සේවකයින් විසින් රාජකාරී කටයුතු සිදු කරනු ලබන අතර, 2023 වසරේ 158ක පමණ කාර්ය මණ්ඩලය විසින් සංස්ථාවේ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ලබාදී ඇත. මෙම කාර්ය මණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ හා දීප ව්‍යාප්ත අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරනු ලැබීය.

මෙම කාර්ය මණ්ඩලයට අමතරව සංස්ථාවේ වතුයායන්වල, පිරිසැකසුම් මධ්‍යස්ථාන හා අනෙකුත් කාර්යාලවල කජු අස්වැන්න එකතු කිරීම, වල් පැළෑටි ඉවත් කිරීම, පොහොර යෙදීම, කජු කැපීම හා කජු පැළ සිටුවීම සඳහා වලවල් කැපීම ආදී කාර්යයන් ඉටු කිරීම සඳහා වෙක්රෝල් පදනම මත කම්කරුවන් 220ට ආසන්න ප්‍රමාණයක් සේවය කරනු ලබයි.

4.1 වගුව : 2023 වර්ෂයේ සේවය කරන ලද සේවක සංඛ්‍යාව

සේවා මට්ටම	සේවය කරන ලද සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	06
තෘතීක	17
ද්විතියික	74
ප්‍රාථමික	61
එකතුව	**158**

4.2 2023 වර්ෂයේ ලබා ගත් ජයග්‍රහණ

- කජු මෙ.ටො. 68.34ක ප්‍රමාණයක් අපනයනය කිරීම තුළින් රු.මි.311.08ක අදායමක් මෙම වර්ෂයේදී උපයා ඇත. පෙර වර්ෂයන්ට සාපේක්ෂව මෙම වසරේදී අපනයන ප්‍රමාණය හා ආදායම වර්ධනය වී ඇත.
- මෙම වර්ෂය තුළදී අගය එකතු කරන ලද කජු මද විකිණූ ප්‍රමාණය මෙ.ටො.33.72ක් වන අතර, එමඟින් රු.මි.167.82ක ආදායමක් උපයා ඇත. පෙර වර්ෂයන්ට සාපේක්ෂව මෙමඟින් ඉපයූ ආදායම ඉහළ ගොස් ඇත.
- මෙම වර්ෂය තුළදී කජු සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභී පවුල් 1,000ක් සඳහා පුහුණුව ලබා දීමට අපේක්ෂා කළ අතර, මෙම වර්ෂය තුළදී ප්‍රතිලාභී පවුල් 3,036ක් සඳහා පුහුණු කිරීම මඟින් 303%ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත

ඉහතින් සඳහන් කරන ලද ජයග්‍රහණවලට අමතරව පහත සඳහන් කර ඇති අභියෝග මෙම වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා බාධාවක් විය.

- අයහපත් කාලගුණික තත්ත්වයන් මත එනම්, මල් හටහන්නා කාල සීමාව තුළ අධික නියඟයකට ලක්වීම හේතුවෙන් මල් වියළීමකට ලක්වීම නිසා වතුයායන්වල අස්වැන්න අපේක්ෂිත මට්ටමට වඩා අඩුවීම.
- දේශීය ලෙලි කජු ඉල්ලුමට සරිලන සැපයුමක් වාර්තා නොවීම.
- කම්කරු වියදම් හා ද්‍රව්‍ය වියදම් ඉහළ යාම.
- පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදානයන් සීමාකිරීම හේතුවෙන් නව කාර්යයන් ආරම්භ කිරීමේදී මෙන්ම අත්‍යවශ්‍ය සේවාවන් ඉටුකර ගැනීමේදී බාධා ඇති විය.

මේ අනුව මෙම කාර්යයන් අඛණ්ඩව සිදුකර ගැනීම සඳහා සංස්ථාව විසින් උපයාගත් අරමුදල් උපයෝගී කර ගැනීමටද සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජමය හා සංවර්ධන කාර්යයන්හි ආයෝජනය සඳහා අරමුදල් හිඟතාවය ඇති විය.

5. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා කජු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජුනි මස 02 වනදා නිකුත් කළ චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/12 ට අනුව ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන 2024 ඔක්තොම්බර් 11 වන දින විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

5.1 ආරම්භය

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ අංක 60/7 දරණ ගැසට් නිවේදනය මගින් 1973 මැයි 25 දින ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හා එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ නියෝගය මත රු.මි. 40ක මූලික ප්‍රාග්ධනයකින් යුක්තව ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවන ලදී.

5.2 ප්‍රතිඵල

ප්‍රවර්තන වසරෙහි මූල්‍ය ප්‍රතිඵල සහ ස්කන්ධය වෙනස්වීම පිළිබඳ දත්ත ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත.

5.3 ව්‍යාපාර සමාලෝචනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, ඒ පිළිබඳ ඇගයීමක් සභාපතිතුමාගේ වාර්තාවේ ඇතුළත් කර ඇත.

5.4 දේපළ, පිරියත හා උපකරණ

මූල්‍ය ප්‍රකාශනයෙහි ප්‍රවර්තන වසරට අදාළව දේපළ, පිරියත හා උපකරණවල සිදුවූ වෙනස්කම් සටහන් අංක 07 මඟින් පැහැදිලි කර ඇත. මෙම සටහනෙහි පෙන්වන වටිනාකම් ඒවායේ වර්තමාන වෙළඳපොල අගය හා ප්‍රමාණාත්මක වෙනස්කම් නොපවතී.

5.5 සංචිත

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය තුළ සංස්ථාවේ මුළු සංචිතවල සංයුතිය සඳහන්ව ඇත.

5.6 අධ්‍යක්ෂ මණ්ඩලය

වගුව 5.6 : 2023 වර්ෂයේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර
01.	ඩබ්.එච්.එම්. උදාර විජේසිංහ මයා	සභාපති
02.	අශෝකා ලංකාතිලක මෙය	නියෝජ්‍ය සභාපතිනිය
03.	ඒ.යූ.කේ. දොඩන්වල මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.02.24 දින දක්වා)
04.	සුජන්ති මායාදුන්නේ මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නියෝජිත)
05.	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.03.30 දින සිට 2023.09.05 දක්වා)
06.	ඒ.පී.ඩී.ඩී. චන්දුරංගි මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.10.31 දින සිට)
07.	චාමර සුභසිංහ මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	උපාලි වඩුආරච්චි මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
09.	අයි.ඩබ්.ඒ. සමන් කුමාර මයා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	කේ.එස්. විජයකීර්ති මයා	සාමාන්‍යාධිකාරී (වැඩ බලන) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
11.	වයි.ටී. තුෂංගා මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

5.7 විගණන කමිටුව

රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන්ට (Public Enterprises Guidelines) අනුකූලව සංස්ථාවේ විගණන කමිටුව පිහිටුවා ඇත.

5.8 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයන්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසියාකාරව මෙම වර්ෂයේදී ගෙවා ඇත.

5.9 පාරිසරික ආරක්ෂාව

පරිසරයට අහිතකර හා පරිසරය දූෂණයට ලක්වන කිසිඳු ක්‍රියාකාරකමකට සංස්ථාව විසින් මැදිහත් වී නොමැත.

5.10 මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු ගිණුම් මහින් ගැලපීම් කිරීමට හෝ හෙළිදරව් කිරීම සඳහා කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

5.11 විගණකවරු

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත,

කේ.එස්.විජයකීර්ති මහතා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

6. විගණන කමිටු වාර්තාව

පූර්ව චක්‍රලේඛ උපදෙස් හා 2021.11.16 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2021හි සඳහන් උපදෙස් ප්‍රකාරව 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කපු සංස්ථාවේ විගණන කමිටුව ස්ථාපිත කරන ලද අතර, එය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් හා නිරීක්ෂකයන් දෙදෙනෙකුගෙන් සමන්විත සමස්තය 07 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විය. එම විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

වගුව 3.1 : 2023 වර්ෂයේ සංස්ථාවේ විගණන කමිටුව

අනු අංකය	නම	තනතුර
01.	කේ.ඒ.සී. ප්‍රියදර්ශනී මෙය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.07.31 දින දක්වා)
02.	ඒ.පී.ඩී.ඩී. චන්දුරංගි මිය	කමිටු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (මහා භාණ්ඩාගාර නියෝජිත) (2023.12.22 දින සිට)
03.	ඒ.යූ.කේ. දොඩන්වල මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.02.24 දින දක්වා)
04.	ආර්.ඒ.ආර්.එස්.මායාදුන්න මිය	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - (විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිත) (2023.06.16 දින සිට)
05.	චාමර සුභසිංහ මයා	කමිටු සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	කේ.එස්. විජයකීර්ති මයා	කමිටු ලේකම් (වැ.බ.), සාමාන්‍යාධිකාරී (වැ.බ.)
07.	කේ.ඒ.සී. ශාමන්ත මයා	කමිටු නිරීක්ෂක, ප්‍රධාන අභ්‍යන්තර විගණක - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2023.02.24 දින සිට)
08.	වී.යූ. ලියනගේ මයා	කමිටු කැඳවුම්කරු - සහකාර සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
09.	ඩී.එම්.යූ.එස්. ධර්මජීව මයා	කමිටු නිරීක්ෂක, විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය (2023.02.24 දින සිට)

2023 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරයා විගණන කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර, එසේම කමිටු ලේකම්වරයෙකු පත් කර නොතිබූ හෙයින් විගණන කමිටුවේ වැඩ බලන ලේකම්වරයා ලෙස මෙම සංස්ථාවේ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා කටයුතු කරන ලදී. 2023 වර්ෂයේදී පවත්වන ලද මුළු විගණන කමිටු රැස්වීම් ගණන 04 කි.

සමාලෝචිත 2023 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හා එම නිර්දේශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ලබාදුන් අනුමැතීන් ප්‍රකාරව අදාළ වැඩකටයුතුවල ප්‍රගතිය පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීමට විගණන කමිටුව විසින් කටයුතු කරන ලදී.

1. විවිධ ප්‍රායෝගික ගැටළු හේතුකොටගෙන ප්‍රමාද වී තිබූ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකර, එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිර්මාණය වී ඇති දෝෂ හා අඩුපාඩු සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කර, එම දෝෂ හා අඩුපාඩු නිවැරදි කරලීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

2. සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ ක්‍රියාකාරකම්වලට අදාලව ජාතික විගණන කාර්යාලය මඟින් නිකුත් කර තිබූ සියලු විගණන විමසුම් හා විගණන වාර්තාවල අන්තර්ගත නිරීක්ෂණ සම්බන්ධයෙන් සාකච්ඡා කර, ඊට අදාලව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

3. ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සියලු අලෙවිසැල්වල ආසන්න කාලවකවානුවට අදාල ලාභාලාභ තත්ත්වය පිළිබඳව තොරතුරු විශ්ලේෂණය කර, ඒ අනුව එම අලෙවිසැල්වල කටයුතු සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම හා ඒ අනුව අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

4. සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විධිමත් පරිදි තීරණ ගැනීම සඳහා මාසික පදනමක් යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම හා ඊට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

5. සංස්ථාවට අයත් එළුවන්කුලම වතුයායේ පවතින තේක්ක ගස් ප්‍රමාණය විධිමත් පරිදි සංගණනය කර, ඒවායේ වටිනාකම තක්සේරු කරවාගැනීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම හා ඒ අනුව අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

6. සංස්ථාවේ සියලුම වතුයායන් හා බීජ උද්‍යානවල පවතින කෘෂ ගස් සම්බන්ධයෙන් විධිමත් පරිදි සංගණනයක් සිදු කර ඒ අනුසාරයෙන් කෘෂ ගස් රෙජිස්තර සකස් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

7. සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව පෙන්නුම් කරන ලැබිය යුතු රාජ්‍ය ණය හා ගෙවිය යුතු රාජ්‍ය ණය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු වන බවට නිර්දේශ ඉදිරිපත් කිරීම හා ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

8. සංස්ථාවේ නීතිමය අයිතිය යටතේ පවතින පුත්තලම හා නැදගමුව යන පිරිසැකසුම් මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල පත්ඉරු සටහන් පිළිබඳව පරීක්ෂා කර, අවශ්‍ය තහවුරු කරවා ගැනීම් සිදුකරවා ගැනීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සහ ඒ අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

ඒ.පී.ඩී.ඩී. චන්දුරංගි
සභාපති - විගණන කමිටුව

07. 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධන වාර්තාව

7.1 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය (කජු සහනාධාර ව්‍යාපෘතිය සඳහා)

සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කජු වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ පැළ බෙදා දීම සඳහා සංස්ථා මධ්‍යම පැළ තවාන්වල කජු පැළ නිෂ්පාදනය කරනු ලබන අතර මෙම වර්ෂයේදී මෙම සහනාධාර වැඩසටහන සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 9.00ක් වෙන් කර තිබූ අතර, කාර්ය සැලැස්මට අනුව බද්ධ කජු පැළ 93,560ක් නිෂ්පාදනය කිරීම වාර්ෂික ඉලක්කය වූ අතර, මෙම පැළ 93,560ක ප්‍රමාණයම නිෂ්පාදනය කර 100%ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. මේ සඳහා වෙන් කරන ලද රු.මි. 09ක මුදලම වැය වී ඇත.

7.2 කජු සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 20ක් වගා කිරීම.

භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ බද්ධ කජු අක්කර 1,250ක් සහ බීජ කජු අක්කර 250ක් ප්‍රතිලාභී පවුල් 1,000ක් මඟින් වගා කිරීම මෙම වර්ෂයේදී අපේක්ෂා කළ අතර, බද්ධ කජු අක්කර 1,250ක් වගාකිරීම සඳහා ප්‍රතිලාභී ගොවීන් 2,628ක් ද, බීජ කජු අක්කර 250ක් ගොවීන් 408ක් පුහුණු කිරීම මඟින් වගා කර ඇත.

තවද මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 1,000ක් සඳහා පුහුණුව ලබා දීමට අපේක්ෂා කළ අතර, මෙම වර්ෂය තුළදී ප්‍රතිලාභී පවුල් 3,036ක් සඳහා පුහුණු කිරීම මඟින් 303%ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. මෙම කාර්යයන් සඳහා වැයවූ මුළු මුදල රු.මි. 8.00කි.

7.3 වැවිලි කළමනාකරණය.

සංස්ථාව යටතේ පවතින බීජ උද්‍යානයන් නඩත්තු කරමින් ව්‍යාප්ති සේවා සහ වාණිජමය කාර්යයන්වලට අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ඉහළ ගුණාත්මයෙන් සමන්විත අංකුර 231,250ක් සහ මව් බීජ 289,062ක් තෝරාගන්නා ලදි. මෙම වර්ෂය සඳහා කාර්ය සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්කය ද ඉහත ප්‍රමාණයම විය.

තවද මෙම වර්ෂයේදී එළුවන්කුලම II අදියරේ අක්කර 40ක නව වගාව ඇති කිරීම සඳහා මේ වන විට කැළෑ එළිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. එමෙන්ම මෙම වර්ෂය තුළදී සංස්ථා බීජ උද්‍යාන අක්කර 1,115ක් නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු අවසන් කර ඇත. මෙම කාර්යයන් භාණ්ඩාගාරය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක වූ අතර, මේ සඳහා වැය වූ මුදල රු.මි. 19.85කි.

7.3.1 වතුයායන් නඩත්තු කිරීම.

සංස්ථාව සතුව වතුයායන් 13ක් පවතින අතර, මෙම වතුයායන් නඩත්තු කිරීම වාර්ෂිකව සිදු කරනු ලබයි. මෙම වර්ෂයේදී කාර්ය සැලැස්මට අනුව වතුයායන්වල අක්කර 3,178ක් නඩත්තු කිරීමට අපේක්ෂා කළ අතර, අක්කර 3,178ක ප්‍රමාණයම නඩත්තු කිරීමට මෙම වර්ෂයේදී හැකියාව ලැබී ඇත. මෙම කාර්යය සිදු කිරීම සඳහා සංස්ථාව මඟින් උපයාගත් අරමුදල්වලින් රු. මි. 58.24ක් වැය වී ඇත.

මෙම වර්ෂයේ ලෙලි කජු අස්වැන්න මෙ.ටො. 170ක ප්‍රමාණයක් සංස්ථා වතුයායන්වලින් ලබා ගැනීමට අපේක්ෂා කළ ද පැවති අයහපත් දේශගුණික තත්ත්වය හේතුවෙන් ලබාගත හැකි වූයේ මෙ.ටො. 85.06ක ප්‍රමාණයකි. සංස්ථා වතුයායන්වල පවතින පොල් වගාවේ අස්වැන්න පොල් ගෙඩි 88,240ක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද අහිතකර දේශගුණික තත්ත්වයන් මත ලබා හැකි වූයේ පොල් ගෙඩි 57,425ක ප්‍රමාණයකි.

7.4 කජු පැළ නිෂ්පාදනය (පැළ තවාන් කළමනාකරණය)

අදාළ වර්ෂය තුළදී ව්‍යාප්ති හා වාණිජමය කාර්යයන් සඳහා අවශ්‍ය බද්ධ පැළ නිෂ්පාදනය සාර්ථක සිදු කර ඇත. සංස්ථා වතුයායන්වල සිටුවීම සඳහා උසස් තත්ත්වයෙන් යුතු බද්ධ පැළ 33,900ක් නිෂ්පාදනය සිදු කිරීම, වාණිජ කටයුතු සඳහා පැළ 102,540ක ප්‍රමාණයක් නිෂ්පාදනය සිදු කිරීම සහ අපනයන පොකුරු ගම්මාන ව්‍යාපෘතිය සඳහා බද්ධ පැළ 35,000ක් නිෂ්පාදනය කර ඇත. මෙම කාර්යයන් සිදු කිරීම සඳහා සංස්ථාව විසින් උපයාගන්නා ලද අරමුදල්වලින් රු.මි. 21.06ක මුදලක් වැය වී ඇත.

7.5 භූමි ඵලදායිතා ප්‍රවර්ධනය

අදාළ වර්ෂයේ සංස්ථා වතුයායන්ගෙන් ඵලදායී අස්වැන්නක් ලබා ගැනීම සඳහා අක්කර 3,604ක් සඳහා කෘමිනාශක යොදා ඇත. එමෙන්ම වතුයායන් සහ පර්යේෂණ අංශය සඳහා ඇසටමයිප්‍රිඩ් 20% (Mospilan 100g) 120.4kg මිලදී ගෙන බෙදා දී ඇත. මේ වෙනුවෙන් භාණ්ඩාගාරය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි.3.50ක් වන අතර, වැයවූ මුදල රු.මි.3.45කි.

7.6 පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකා කජු සංස්ථාව සහ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම හා කළමනාකරණ පීඨය හා ඒකාබද්ධව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ශාක අභිජනනය, පොහොර භාවිතය, පැළ ඝනත්වය, කජු වගාවේ රෝග හා පළිබෝධ

මර්දනය, බද්ධ කිරීමේ තාක්ෂණික ක්‍රමවේද සහ අස්වැන්න පිළිබඳව පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2023 වර්ෂයේදී පර්යේෂණ කාණ්ඩ 07ක් යටතේ පුත්තලම පර්යේෂණ අංශයේ පර්යේෂණ 05ක්ද කමන්දළුව පර්යේෂණ අංශයේ පර්යේෂණ 08ක් ද වශයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 2.75ක් වෙන් කර ඇති අතර, මෙම ප්‍රතිපාදන තුළින් වැයවී ඇත්තේ 2.16කි.

එමෙන්ම නව කජු ප්‍රභේදයක් හඳුන්වා දීමට අදාළ පර්යේෂණ සිදු කිරීම සඳහා දත්ත රැස්කොට මේ වනවිට අවසන් වී ඇති අතර, ඊට අදාළ විශ්ලේෂණ සිදු කරමින් පවතී.

7.7 කජු පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය

සංස්ථා වතුයායන්ගෙන් ලබාගන්නා අස්වැන්න පුත්තලම සහ නැදගමුව යන පිරිසැකසුම් මධ්‍යස්ථානවල පිරිසැකසුම් කටයුතු සිදු කර අගය එකතු කරන ලද කජු නිෂ්පාදන ලෙස සංස්ථාවේ අලෙවි සැල් මඟින් සහ වරලත් අලෙවිසැල් මඟින් අලෙවි කරනු ලබයි. මෙම වර්ෂයේදී ලෙලි කජු මෙ.ටො. 150ක් පිරිසැකසුම් කටයුතු සිදු කිරීම අපේක්ෂිත ඉලක්කය වූ අතර, ලෙලි කජු මෙ.ටො. 169.35ක් පිරිසැකසුම් කටයුතු සඳහා යොදා ගෙන කජු මද මෙ.ටො.42.09ක් නිෂ්පාදනය කර ඇත.

මෙම වර්ෂය තුළදී අලෙවි කිරීමට අපෙක්ෂා කරන ලද අගය එකතු කරන ලද කජු මද ප්‍රමාණය මෙ.ටො.30ක් වුවත්, මෙම වර්ෂයේදී කජු මද මෙ.ටො.33.72ක් අලෙවි කර රු.මි.167.82ක් උපයා ඇත.

එමෙන්ම මෙම වර්ෂයේදී කජු අලෙවිසැල් 04ක් විවෘත කිරීමට අපේක්ෂා කළ අතර, ඒ සඳහා මේ වනවිට කටයුතු සිදු කරමින් පවතී. මෙයින් එක් අලෙවි සැලක් 2024 වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට නියමිතව පවතී. අනෙකුත් අලෙවි සැල් විවෘත කිරීම සඳහා මේ වන විට කටයුතු සූදානම් කරමින් පවතී.

7.8 මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ විවිධ අංශවල නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මෙම වර්ෂය තුළදී පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි. මෙමඟින් කාර්ය ඵලදායිතාව ඉහළ නැංවීමටත්, විෂය දැනුම යාවත්කාලීන කිරීමටත් සහ නව දැනුම ලබා ගැනීමටත් අවස්ථාව ලැබුණු අතර, ස්වයං පෙළඹවීම මඟින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. මෙම වර්ෂයේදී පුහුණු වැඩ සටහන් පැවැත්වීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි.0.5ක් වෙන් කර තිබූ අතර, මෙම පුහුණු වැඩසටහන් සාර්ථකව සිදු කිරීම සඳහා වැය වූයේ රු.මි.0.30ක මුදලකි

8. කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකාව තුළ කජු වගාව සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ නංවාලීම සඳහා සංස්ථාව මඟින් ප්‍රධාන ක්‍රියාමාර්ග 04ක් ඔස්සේ අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගනු ලබයි.

01. කජු වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීම.

02. කජු වගා ඉඩම්වල ඵලදායීතාව වැඩි කිරීම.

03. කජු නිෂ්පාදනයේ පිරිසැකසුම් සහ අගය එකතු කළ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

04. මානව සම්පත් ධාරිතාවය වැඩි දියුණු කිරීම.

8.1 කජු වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීම.

මෙමඟින් ග්‍රාමීය වශයෙන් කජු වගාව සිදු කරන ගොවීන්ගේ ජීවනෝපාය ඉහළ දැමීම, අඛණ්ඩව ලෙලි කජු සැපයුම තහවුරු කිරීම සහ සැපයුම වැඩි කිරීම සඳහා කජු වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය ක්‍රමානුකූලව වැඩි කිරීමට මෙමඟින් අපේක්ෂා කරනු ලබයි. මේ යටතේ පහත කාර්යයන් සිදු කරන ලබයි.

8.1.1 ව්‍යාප්ති හා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

- වගා නොකළ හා ඌණ උපයෝගී ඉඩම් සහිත ප්‍රදේශවල ගොවීන් ඉලක්ක කරගනිමින් දිස්ත්‍රික් මට්ටමින් කජු වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අඛණ්ඩ තාක්ෂණික මඟ පෙන්වීම් සඳහා කජු වගා කරන දිස්ත්‍රික්කවල කජු වගාව ව්‍යාප්ත කිරීම සඳහා පුහුණු කෘෂිකාර්මික ව්‍යාප්ති නිලධාරීන් යෙදවීම.
- ගොවීන් කජු වගාව කෙරෙහි නැඹුරු කරවීම සඳහා කජු වගාව සිදු කිරීමෙන් අත්වන ප්‍රතිලාභ පිළිබඳ (පත්‍රිකා, අත්පොත්, වීඩියෝ) වැනි දෑ බෙදාහැරීම තුළින් ගොවීන් ඒ සඳහා නැඹුරු කරවීම.
- දිවයින පුරා කජු පිළිබඳ භෝග සායන, ජංගම පුහුණු ඒකක දියත් කිරීම.
- විශේෂ වැඩසටහන් මඟින් තරුණ පිරිස් හා කාන්තාවන් කජු වගාව කෙරෙහි නැඹුරු කර ගැනීම.

8.1.2 කෘෂි වගාවන් පුනරුත්ථාපනය කිරීම

- GIS සිතියම්ගත කිරීමෙන් සංස්ථාව සතු මෙන්ම පෞද්ගලික ඉඩම් යන දෙකෙහිම හායනයට ලක්වූ හෝ අතහැර දැමූ ඉඩම් හඳුනාගෙන ඒවායේ කෘෂි වගාවන් සිදු කිරීමට පියවර ගැනීම.
- ඒකක කෘෂි ඵලදාව ඉහළ නැංවීම සඳහා කප්පාදු කිරීම, පොහොර යෙදීම සහ පළිබෝධ පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා නිරන්තර අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඉහළ ඝනත්ව රෝපණ ක්‍රමය සහ වියන් කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම.
- පුනරුත්ථාපන කටයුතු දිරිගැන්වීම සඳහා යෙදවුම් සහනාධාර (කාබනික පොහොර, මෙවලම්) ලබාදීම.
- වාර්ෂිකව වතු කාර්ය සාධනය නිරීක්ෂණය කර ඒ අනුව නව ප්‍රතිපාදන ලබා දීම.

8.1.3 නව වගාව සිදු කිරීම.

- කෘෂි පාරිසරික කලාප සිතියම හා වර්ෂාපතන දත්ත භාවිතයෙන් කෘෂි සඳහා සුදුසු නව ප්‍රදේශ හඳුනා ගැනීම.
- වාණිජ පරිමාණයේ කෘෂි වගා කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන් සහ ගොවි සමිති දිරි ගැන්වීම.
- වතු හිමියන්ට රෝපණ ද්‍රව්‍ය සහ පුහුණුව ලබා දෙමින් නිරන්තර පරීක්ෂාවට හා අධීක්ෂණයට භාජනය කිරීම.
- සංස්ථාව මඟින් තෝරාගත් භූමි සඳහා නව වගා බිම් සැකසීම, මායිම් සලකුණු කිරීම, වළවල් කැපීම වැනි කාර්යයන් සඳහා සහය ලබා දීම.

8.1.4 බද්ධ කෘෂි පැළ නිෂ්පාදනය සහ බෙදා හැරීම.

- උසස් ප්‍රචාරණ ශිල්පීය ක්‍රම සහ පළිබෝධ කළමනාකරණය පිළිබඳ තවාන් ක්‍රියාකරුවන් පුහුණු කිරීම.
- බෙදා හරින ලද සියලුම රෝපණ ද්‍රව්‍ය සඳහා සහතික කිරීමේ (GAP) තත්ත්ව පාලන යාන්ත්‍රණය සැකසීම.
- කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ගොවිපළවල් සහ දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රදේශ සඳහා සහනාධාර මිල ගණන් යටතේ බද්ධ පැළ ලබා දීම.
- තවාන්වල දැනට පවතින බද්ධ පැළ සහ ගොවීන්ට නිකුත් කර ඇති පැළ ප්‍රමාණයන් සම්බන්ධයෙන් විනිවිද අධීක්ෂණයක් තුළින් ක්‍රියා කිරීම.

8.1.5 කජු වගා ඉඩම්වල ඵලදායිතාවය වැඩිකිරීම.

නවෝත්පාදනය, තාක්ෂණ හුවමාරුව සහ ක්ෂේත්‍ර පාදක ධාරිතා සංවර්ධනය තුළින් හෙක්ටයාරයකට කජු අස්වැන්න වැඩි කිරීම.

8.2.1 පර්යේෂණයන් සිදු කර නව ප්‍රභේද අභිජනනය හා ක්ෂේත්‍ර පරීක්ෂාවන්.

- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පාලනය යටතේ කලාපීය පර්යේෂණ සහ ආදර්ශන ගොවිපළවල් ස්ථාපිත කිරීම.
- අනාගත අභිජනන භාවිත සඳහා දේශීය ජානකිටුව පවත්වා ගැනීම හා සංරක්ෂණය කිරීම.
- ඉහළ අස්වැන්නක් සහිත ලෙලි කජුවල ගුණාත්මකභාව වැඩි, රෝග ප්‍රතිරෝධක හා නියඟයට ඔරොත්තු දීමට හැකියාව පවතින ප්‍රභේදවල ලක්ෂණ ඇගයීමට ලක් කිරීම.
- විධිමත් පරිදි සහතික කළ ජාතික කජු ප්‍රභේද නිකුත් කිරීමේ පද්ධතියක් හරහා සහතික කළ කජු ප්‍රභේද නිකුත් කිරීම.

8.2.2 නව වගා ශිල්පීය ක්‍රම හා නඩත්තු පිළිවෙත් හඳුන්වා දීම.

- ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් කජු සඳහා විශේෂයෙන් සකස් කරන ලද ජාතික GAP ප්‍රමිතීන්ට අනුව ගොවීන් වගාව සඳහා හුරු කිරීම.
- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුකූලතාව, වාර්තා තබා ගැනීම සහ තත්ත්ව පරීක්ෂාව පිළිබඳ ගොවීන් සහ ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- ජීව විද්‍යාත්මක පළිබෝධ පාලනය ඇතුළු ඒකාබද්ධ පිළිබෝධ කළමනාකරණය (IMP) ප්‍රවර්ධනය කිරීම.
- වතුයායන්වල තිරසාරභාවය සඳහා බිංදු ජල සම්පාදනය වැනි ජල කාර්යක්ෂම වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීම.
- රනිල කුලයට අයත් භෝග සමඟ අතුරු භෝග වගා පද්ධති පවත්වාගෙන යාම තුළින් ගොවීන්ගේ ආදායම වැඩි කිරීම හා පාංශු සෞඛ්‍ය ඉහළ දැමීම.

8.1.6 ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන

- ප්‍රධාන වශයෙන් කජු වගා කරනු ලබන දිස්ත්‍රික්කවල කජු වගාව කෙරෙහි බලපාන ප්‍රධාන පළිබෝධ සහ රෝග හඳුනාගැනීම සඳහා ගොවීන්ට විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කජු වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්කවල වගාව කෙරෙහි පළිබෝධ නිරීක්ෂණ හා ඒවා පිළිබඳ වාර්තාකරණය සිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8.2 කජු පිරිසැකසුම් කර්මාන්තය සහ අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

දේශීය කජු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන භාවිතය සහ වෙළෙඳපොල ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම තුළින් කර්මාන්තයේ වටිනාකම ඉහළ නැංවීම.

8.3.1 GMP, GAP සහ තත්ත්ව ප්‍රමිතිකරණය අනුගමනය කිරීම.

- GMP ප්‍රමිතීන් යටතේ කජු සැකසීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටීන් හඳුන්වා දීම.
- දේශීය ප්‍රමිතිකරණ ආයතනයේ (SLS) සහ ජාත්‍යාන්තර සහතික (HACCP, ISO 22000) ලබා ගැනීමට පහසුකම් සැලසීම.
- සැපයුම්කරුවන් සඳහා තත්ත්ව සහතික කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ ඇසුරුම්කරණය පිළිබඳ පුහුණුව ලබා දීම.

8.3.2 කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම සඳහා කුඩා පරිමාණ ගම්මාන ලෙස හඳුනාගෙන පුහුණු කිරීම.

- ගම් මට්ටමේ පිරිසැකසුම්කරුවන් හඳුනාගෙන ලියාපදිංචි කිරීම සඳහා ඔවුන්ට ගැළපෙන පුහුණු වැඩසටහන් සැකසීම.
- ශ්‍රී ලංකාව තුළ හඳුනාගත් සාර්ථක ව්‍යවසායකයින් සමඟ සම්බන්ධතාවය ඇති කරගැනීම සහ ඔවුන්ගේ දැනුම බෙදා ගැනීමට අවශ්‍ය අවකාශය ලබා දීම.
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සමුපකාර බැංකු සමඟ ණය සම්බන්ධතා සඳහා පහසුකම් සැලසීම.
- යන්ත්‍ර උපකරණ නඩත්තු කිරීම සහ දෝශ නිරාකරණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම.

8.3.3 කජු අතුරු නිෂ්පාදන සංවර්ධනය.

- කජු පුහුලන් ආශිත නිෂ්පාදනයන් පිළිබඳව පර්යේෂණ සිදු කරමින් ඒවා නිෂ්පාදනය කිරීම සඳහා යොමු වීම.

- වාණිජකරණය සඳහා වෙළඳපොළ ප්‍රවර්ධන, පර්යේෂණ සහ ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම.
- තෝරාගත් කජු වගා කරන ගම්මානවල කුඩා කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ කජු පුහුලන් ආශ්‍රිත නිෂ්පාදන ඒකක නියමු ව්‍යාපෘති සිදු කිරීම.
- කජු පිරිසැකසුම් සහ මෙහෙයුම් කටයුතු සඳහා කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ප්‍රජා කණ්ඩායම් හා තරුණ ව්‍යවසායකයින් සම්බන්ධ කර ගැනීම.
- ප්‍රදර්ශන සහ ඩිජිටල් වේදිකා හරහා අතුරු නිෂ්පාදන අලෙවිකරණ සහ සන්නාමකරණය සඳහා සහාය වීම.

8.3.4 කුඩා පරිමාණ පිරිසැකසුම්කරුවන් සඳහා වෙළඳපොල ප්‍රවේශය ශක්තිමත් කිරීම.

- ගම් මට්ටමේ කජු නිෂ්පාදන සඳහා මාර්ගගත වෙළඳපොලක් හඳුන්වා දීම.
- දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම සහ එම සම්මන්ත්‍රණවලට සහභාගී වීම.
- කේවල් කිරීමේ බලය වැඩි දියුණු කිරීම සඳහා කජු පිරිසැකසුම් සමූපකාර වේදිකාවන් සංවර්ධන කිරීම.

8.4 මානව සම්පත් ධාරිතාවය වැඩි දියුණු කිරීම.

කුසලතා, ආකල්ප හා දැනුමින් සන්නද්ධ ශ්‍රම බලකායක් ගොඩනැගීම.

8.4.1 විස්තීරණ සේවක පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- මෙහෙයුම් ප්‍රමුඛතා සමඟ පෙළගස්වන වාර්ෂික පුහුණු දින දර්ශන සංවර්ධනය කිරීම.
- කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් සහ කළමනාකරුවන් සඳහා සෑම වසර 02ට වරක් අනිවාර්ය නැවුම් කිරීමේ පුහුණුවක් හඳුන්වා දීම.

8.4.2 නවීන කාර්ය සාධන ඇගයීම් සහ දිරි දීමනා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

- KPI සමඟ ඩිජිටල් කාර්ය සාධන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (PMIS) හඳුන්වා දීම.

- කාර්තුමය කාර්ය සාධන සාමාලෝචන රැස්වීම් පැවැත්වීම සහ ප්‍රධාන නිමැවුම් සමඟ දිරිගැන්වීම් සම්බන්ධ කිරීම.
- ඵලදායිතා ප්‍රසාද දීමනා, මහජන පිළිගැනීම සහ මූල්‍යමය නොවන ත්‍යාග පිරිනැමීම.
- වෘත්තීය ප්‍රගතිය පුහුණුව සහ කාර්ය සාධන ප්‍රතිඵල සමඟ පෙළගස්වන්න.

8.4.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා සහ ඩිජිටල් මෙහෙයුම් වැඩි දියුණු කිරීම.

- MIS පද්ධති දත්ත සමුදායන් සහ ජංගම දත්ත එකතු කිරීමේ මෙවලම් භාවිතය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- වතු ක්‍රියාකාරකම් සහ ගොවීන්ගේ විමසුම් නිරීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ට ජංගම දුරකථන සහ Lap top ලබා දීම.
- අභ්‍යන්තර සන්නිවේදන වාර්තා තබා ගැනීම සහ වාර්තා ඉදිරිපත් කිරීම් ඩිජිටල්කරණය කිරීම.
- අඛණ්ඩ කුසලතා සංවර්ධනය සඳහා විද්‍යුත් ඉගෙනුම් වේදිකා හඳුන්වා දීම.

8.4.4 දැනුම බෙදාගැනීම සහ අභ්‍යන්තර ඉගෙනීම් දිරිමත් කිරීම.

- හොඳම භාවිත සහ නවෝත්පාදනයන් පිළිබඳව කාර්තුමය අභ්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ව්‍යාපෘතිවලින් සාර්ථක අධ්‍යන ලේඛනගත කර ප්‍රකාශයට පත් කිරීම.
- ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ කාර්ය මණ්ඩලය අතර මාර්ගෝපදේශක පද්ධති ස්ථාපිත කිරීම.
- අභ්‍යන්තර පුවත් පත්‍රිකා සහ තාක්ෂණික දැන්වීම් ප්‍රවර්ධනය කිරීම.

9. කාර්ය සාධනය පිළිබඳ වසර 05ක සාරාංශය

විස්තරය		2023	2022	2021	2020	2019
01	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වගා කරන ලද කජු අක්කර ප්‍රමාණය	සහනාධාර වැඩසටහන 1,356 ගෙවතුවගාව 366 **එකතුව** 1,722	සහනාධාර වැඩසටහන 1,169.26 ගෙවතුවගාව 468 **එකතුව** 1,637.26	සහනාධාරවැඩ සටහන ගෙවතු වගාවඑකතුව 2920 1,080 4,000	සහනාධාර වැඩසටහනගෙ වතු වගාව 2,568 932 එකතුව 3,500	සහනාධාරවැඩ සටහනගෙවතු වගාව 3,305 1,195 එකතුව 4,500
02	සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව	3,036	3,590	5,384	7,676	11,069
03	නිෂ්පාදනය කරන ලද පැළ ගණන	බද්ධපැළ 171,440 බීජපැළ - **එකතුව** 171,440	බද්ධපැළ 31,360 බීජපැළඑකතුව 18,770 50,130	බද්ධපැළ 511,230 බීජ පැළ 17,360 එකතුව 528,590	**බද්ධපැළ** 422,570 **බීජ පැළ** 54,500 **එකතුව** 477,570	බද්ධ පැළ 270,294 බීජ පැළ 79,945 එකතුව 350,239
04	එක්රැස් කරන ලද මව්බීජ සංඛ්‍යාව	289,062	49,000	799,785	500,000	500,000
05	එක්රැස් කරන ලද අංකුර ප්‍රමාණය	231,250	39,200	800,000	520,000	310,000
06	ලබාගත් අස්වැන්න (මෙ.ටො.)	85.06	88.24	106.0	149.46	157.81
07	සංස්ථා වතුයායන්වල නව වගාව (අක්කර)	40	25	90	346	52.5
08	වරලත් අලෙවිසැල් සංඛ්‍යාව	20	40	69	75	56
09	තාක්ෂණ හුවමාරු වැඩසටහන්, පළිබෝධ පාලනය සහ පසු අස්වනු තාක්ෂණය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	13	-	30	82	166

විස්තරය		2023	2022	2021	2020	2019
10	පුහුණු කරන ලද ගොවීන් සංඛ්‍යාව	3,036	558	663	1,369	2,320
11	ආනයනය කරන ලද කජු ප්‍රමාණය (මෙ.ටො.)	ලෙලිකජු - කජු මද 47.66	ලෙලිකජු 207.57 කජු මද -	ලෙලි කජු 0.051 කජු මද 0.047	ලෙලි කජු 549.2 කජු මද 0.025	ලෙලි කජු 527.26 කජු මද 0.826
12	කජු ආනයන බලපත්‍ර නිකුත් කරන ලද ප්‍රමාණය	-	100	-	500	-
13	කජු අපනයනය කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	68.34	58.20	26.26	34.32	47.40
14	කජු අපනයනය කරන ලද වටිනාකම (රු.මි.)	311.08	212.83	89.07	81.13	93.57
15	ලෙලි කජු සහ කජු මද මිලදි ගැනීම (මෙ.ටො.)	ලෙලි කජු - 99.64	ලෙලි කජු - 79.05	ලෙලි කජු - 54.81 කජු මද - -	ලෙලි කජු - 64.0 කජු මද - -	ලෙලි කජු - 20.0 කජු මද - 2.30
16	අගය එකතු කරන ලද කජු මද විකුණුම් ප්‍රමාණය (මෙ.ටො.)	33.72	21.55	26.8	16.91	21.72
17	අගය එකතු කරන ලද කජු මද විකුණුම් වටිනාකම (රු.මි.)	167.82	112.39	92.12	47.23	79.08

10. <u>පදනම් කරගත් ගිණුම් ප්‍රතිපත්ති සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන - 2023</u>

01. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මත ගිණුම් පිළියෙල කර ඇත.

02. ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරන ලදී. වර්ෂය තුළ මිලටගත් වත්කම් ගත් දිනය පදනම් කරගෙන ක්ෂය ගණනය කරන ලදී. වර්ෂය තුළ නිම කරන ලද ගොඩනැගිලි නිම කරන ලද දිනය පදනම් කරගැනීමෙන් නොව මුළු වර්ෂය සඳහාම ක්ෂය ගණනය කරන ලදී.

ක්ෂය කිරීමේ ප්‍රතිශත පහත සඳහන් පරිදි වේ

මෝටර් වාහන	20%
යන්ත්‍ර සුත්‍ර	10%
මෙවලම් හා උපකරණ	10%
කාර්යාලීය උපකරණ	10%
නළ ළිං/වගා ළිං	10%
ලී බඩු උපකරණ සහ සවිකිරීම්	06%
ස්ථිර ගොඩනැගිලි	03%
අර්ධ ස්ථිර ගොඩනැගිලි	33 1/3%

03. දේපළ පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත් වත්කම් පිරිවැයට ගිණුම්ගත කර ඇත. දේපළ පිරියත සහ උපකරණවල අගය ප්‍රත්‍යාගණන වටිනාකම මත සමුච්චිත ක්ෂය හා හානිකරණ ලද අලාභ අඩුකර දක්වා ඇත.

04. පහත සඳහන් පදනම මත තොග ගණනය කරන ලදී.

කජු මද	:	ශුද්ධ විකුණුම් මිලෙන්
ලෙලි කජු	:	සහතික කළ වෙනස් වන මිල/වෙළෙඳපොළ මිල
ගව සහ බැටළු	:	ඒ ඒ පළාත්වල වෙළෙඳ මිල/ජීව බර අනුව
පොල්	:	ශුද්ධ විකුණුම් මිල
අනෙකුත් සියළුම තොග	:	පිරිවැයට ගණනය කරන ලදී.

05. ප්‍රධාන කාර්යාලීය වියදම් පිරිවැය මධ්‍යස්ථාන අතර එහි අන්තර්ගත මුළු වැටුප් වියදමට අදාලව බෙදා හරින ලදී.

06. වතුයායන්හි සාමාන්‍ය වියදම් එල දරණ සහ එල නොදරණ ප්‍රදේශ, පැළ තවාන් සහ සත්ත්ව පාලනය අතර බෙදීම එම ප්‍රදේශ සඳහා වැයවූ සත්‍ය කම්කරු දින ගණනේ අනුපාතය අනුව බෙදා හරින ලදී.

07. එල දරණ වගාවන්වල ක්‍රමක්ෂය කිරීම වර්ෂයකට 5% බැගින් ගණනය කරන ලදි.

08. බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම මුළු ණය ගැතියන්ගෙන් 3.53% බැගින් ගණනය කර ඇත. වෙන් කිරීම් ගිණුමේ වෙනස වර්ෂය තුළ බොල් ණය කපා හැරීම සඳහා මාරු කරන ලදී.

09. පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම පාරිතෝෂික දීමනා පනතේ සඳහන් පරිදි සේවය කරන ලද සම්පූර්ණ වර්ෂගණනකට අනුව ගණනය කරන ලදී. පාරිතෝෂික හිමිකම් ලැබීම සඳහා පනතේ සඳහන් අවම සේවා කාලය ගිණුම් වර්ෂය තුළදී සම්පූර්ණ වූ අයගේ සේවා පිරිවැය ආදායම් ගිණුමට හර කර ඇත.

10. ලැබූ හා ලැබිය යුතු දෑවල වටිනාකම මත ආදායම ගිණුම්ගත කර ඇත. පහත සඳහන් දෑ සැලකිල්ලට ගෙන භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනාගෙන ඇත.

- ආයතනය අවදානම හා ප්‍රතිලාභ යන දෙකම ගැණුම්කරුට ලබා දේ.
- ආයතන කළමනාකාරීත්වයේ මැදිහත්වීමක් විකුණන භාණ්ඩවල හිමිකාරීත්වයට හෝ කාර්යක්ෂම පාලනයක් තබා ගැනීම සඳහා මැදිහත් නොවේ.
- ආදායම විශ්වාසනීය ලෙස හඳුනාගත හැකි වීම.
- ගණුදෙනු හා අදාල ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලා යා හැක.
- ගණුදෙනුවට අදාල වූ හෝ අදාල විය හැකි පිරිවැය විශ්වාසනීය ලෙස අගය කිරීම.

11. ප්‍රාග්ධන වත්කම්හි ක්ෂයවීම් හා ක්‍රමක්ෂය ලෙස ගිණුම් පොත්වලට ඇතුළත් කර ඇති සත්‍ය වටිනාකම්, අදාල ප්‍රාග්ධන වත්කම්වලින් කපා හැරීමෙන් අනතුරුව ඊට සමාන වටිනාකමක් ප්‍රාග්ධන ප්‍රදානවලින් ඉවත් කර ගිණුම්පොත්වල ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

12. මෝටර් වාහන ප්‍රත්‍යාගණනය 2009.01.01 දින සිට බලපැවැත්වෙන දිනය ලෙස නිශ්චය කරන අතර, පිළිගත් රාජ්‍ය ආයතනයක කාර්මික ඉංජිනේරුවරයෙකුගේ මූලිකත්වයෙන් යුතු ස්වාධීන කොමිසමක් මඟින් කරන ලදී.

13. බද්ධ පැළ සහ බීජ පැළ නිෂ්පාදනයට අදාල පරිපාලන වියදම් සේවා සහ වාණිජ අංශ අතර, නිෂ්පාදිත සත්‍ය පැළ හා බෙදා හරින ලද පැළ පදනම් කර ගෙන ඇත.

ශ්‍රී ලංකා කජු සංස්ථාව

31.12.2022 **2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

රු.	වත්කම්	සටහන්	රු.
	ජංගම නොවන වත්කම්		
116,124,752.11	දේපළ පිරියත හා උපකරණ	07	113,259,962.51
25,316,396.38	ඵල දරන වගා නඩත්තු වියදම්	08	81,699,082.73
98,080,023.96	ඵල නොදරන වගා නඩත්තු වියදම්	09	46,008,475.80
588,524.09	අනෙකුත් කුඩා ව්‍යාපෘති	10	840,654.67
6,542,597.00	කෙරීගෙන යන වැඩ-ප්‍රාග්ධන		22,134,175.60
246,652,293.54	**මුළු ජංගම නොවන වත්කම්**		**263,942,351.31**
	ජංගම වත්කම්		
76,769,613.94	තොග	11	105,483,926.55
31,800,793.00	වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	12	28,640,033.48
50,638,657.60	තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම්	13	9,751,226.20
143,842,699.56	මුදල් සහ මුදල් සමාන දෑ	14	156,598,891.68
303,051,764.10	**මුළු ජංගම වත්කම්**		300,474,077.91
549,704,057.64	**මුළු වත්කම්**		**564,416,429.22**
	ස්කන්ධ සහ වගකීම්		
	ස්කන්ධ		
40,000,000.00	මූලික ප්‍රාග්ධනය		40,000,000.00
281,565,222.86	රාජ්‍ය ප්‍රදාන		300,697,860.49
280,919,046.17	අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	15	246,157,218.48
17,441,846.85	ප්‍රාග්ධන සංචිත	16	17,441,846.85
(152,058,776.37)	ලාභ අලාභ ගිණුම		(156,859,994.82)
467,867,339.51	**මුළු ස්කන්ධ**		**447,436,931.00**
	ජංගම නොවන වගකීම්		
35,789,916.00	පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්	17	40,514,827.00
3,500,000.00	දිගුකාලීන ණය	18	3,500,000.00
39,289,916.00	**මුළු ජංගම නොවන වගකීම්**		**44,014,827.00**
	ජංගම වගකීම්		
42,546,802.13	වෙළඳ ණයහිමියෝ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ	19	72,964,671.22
42,546,802.13	**මුළු ජංගම වගකීම්**		**72,964,671.22**
549,704,057.64	**මුළු ස්කන්ධ සහ වගකීම්**		**564,416,429.22**

නීතීඥ උදාර විජේසිංහ	අශෝකා ලංකාතිලක	කේ.එස්.විජයකීර්ති	**එම්.ටී.එස්.කේ.පීරිස්**
සභාපති	**නියෝජ්‍ය සභාපතිනි**	**සාමාන්‍යාධිකාරී(වැ.බ)**	**සහකාරසාමාන්‍යාධිකාරී- මුදල්**

(සටහන් 07)දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	පිරිවැය/ ප්‍රත්‍යාගණන අගය **2023.01.01** (රු.)	අදාල වසරේ වත්කම් එකතුවීම්/ ප්‍රත්‍යාගණනය (රු.)	අදාල වසරේ වත්කම් ඉවත්කිරීම්/ විකුණුම් (රු.)	වත්කමේ වර්තමාන පිරිවැය/ ප්‍රත්‍යාගණන වටිනාකම **2023.12.31** (රු.)	**2023.01.01** දිනට සමුච්චිත ක්ෂය (රු.)	**2023** වර්ෂය සඳහා ක්ෂය කිරීම් (රු.)	**2023.12.31** දිනට සමුච්චිත ක්ෂය (රු.)	ලියා හරින ලද අගය **2023.12.31** (රු.)
සින්නක්කර ඉඩම්	28,335,084.54	513,912.00	-	28,848,996.54	-	-	-	28,848,996.54
ස්ථාවර ගොඩනැගිලි	62,652,301.08	60,051.00	-	62,712,352.08	26,340,617.19	1,697,445.00	28,038,062.19	34,674,289,89
අර්ධ ස්ථීර ගොඩනැගිලි	825,751.00	-	-	825,751.00	734,784.67	90,946.64	825,731.31	19.69
වාහන	128,075,837.84	2,783,825.00	-	130,859,662.84	109,288,984.29	5,725,787.54	115,014,771.83	15,844,891.01
යන්ත්‍ර සූත්‍ර	39,441,163.45	132,000.00	-	39,573,163.45	19,047,630.94	2,657,601.49	21,705,232.43	17,867,931.02
මෙවලම් හා උපකරණ	13,886,742.45	1,737,540.00	-	15,624,282.45	9,277,259.11	643,163,42	9,920,422.53	5,703,859.92
කාර්යාලීය උපකරණ	13,182,407.09	68,440.00	-	13,250,847.09	11,198,797.90	397,545,09	11,596,342.99	1,654,504.10
ලීබඩු හා සවිකිරීම්	8,968,548.82	235,985.00	-	9,204,533.82	6,139,373.98	314,936.41	6,454,310.39	2,750,223.43
නළ ළිං	2,827,622.18	3,596,280.00	-	6,423,902.18	907,577.99	377,848.87	1,285,426.86	5,138,475.32
වගා ළිං	1,333,680.40	-	-	1,333,680.40	1,078,185.29	87,548.14	1,165,733.43	167,946.97
වැව්	608,824.62	-	-	608,824.62	-	-	-	608,824.62
	300,137,963.47	**9,128,033.00**	-	**309,265,996.47**	**184,013,211.36**	**11,992,822.60**	**196,006,033.96**	**113,259,962.51**

නැදගමුව සහ පුත්තලම කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන දෙක පිහිටා ඇත්තේ ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයිති ඉඩමක වේ. අනෙකුත් ඉඩම්වල අයිතිය රජය සතු හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) සතුවේ. මෙම ඉඩම් දීර්ඝකාලීන කල්බදු පදනම යටතේ අත්පත් කරගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2023.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා සටහන්

31.12.2022 (රු.)		31.12.2023 (රු.)
	එල දරන වගාව වියදම්	
24,159,358.85	කජු සටහන්- 8 (අ)	78,708,149.89
1,157,037.53	පොල් සටහන් - 8 (ආ)	2,990,932.84
25,316,396.38	එකතුව	**81,699,082.73**

සටහන් - 8 (අ)

එල දරන වගාව-කජු

31.12.2022 (රු.)	වතුයාය	2023.01.01 දිනට පිරිවැය (රු.)	2023.12.31 දිනට සමුච්චිත ක්‍රම ක්ෂය (රු.)	2023.12.31 දිනට ශුද්ධ වටිනාකම (රු.)
724,885.12	හාඩ් වතුයාය	5,680,877.17	2,693,572.88	2,987,304.29
4,005,275.45	කමන්දළුව වතුයාය	19,223,779.11	14,848,013.87	4,375,765.24
3,618,726,16	පුත්තලම වතුයාය	29,119,436.73	8,926,487.94	20,192,948.79
529,758.50	එළුවන්කුලම ශා.අභි.මධ්‍යස්ථානය	15,159,815.35	13,815,991.68	1,343,823.67
295,714.63	විලව්චිය ශා.අභි.මධ්‍යස්ථානය	985,854.48	409,147.95	576,706.53
3,065,886.40	නාලන්ද ශාක අභි.මධ්‍යස්ථානය	5,963,253.57	3,195,529.85	2,767,723.72
1,000,778.60	මහඔය ශාක අභි. මධ්‍යස්ථානය	2,512,190.75	766,095.24	1,746,095.51
1,381,412.65	මොණරාගල ශාක අභි. මධ්‍යස්ථානය	2,331,959.19	1,067,144.50	1,264,814.69
1,058,004.41	මාන්කර්ණි වතුයාය	1,410,671.56	423,201.78	987,470.78
8,478,916.93	කොණ්ඩව්චි ශාක අභි. මධ්‍යස්ථානය	46,931,816.74	4,466,320.07	42,465,496.67
24,159,358.85	**එකතුව**	**129,319,655.65**	**50,611,505.76**	**78,708,149.89**

සටහන - 8 (ආ)

එල දරන වගාව-පොල්

31.12.2022 (රු.)	වතුයාය	2023.01.01 දිනට පිරිවැය (රු.)	2023.12.31 දිනට සමුච්චිත ක්ෂය (රු.)	2023.12.31 දිනට ලියා හරින ලද අගය (රු.)
692,459.27	හාඩ් වතුයාය	2,465,953.32	1,081,631.53	1,384,321.79
464,577.26	කමන්දළුව වතුයාය	3,725,129.74	2,118,519.70	1,606,610.04
1.00	පුත්තලම වතුයාය	431,998.76	431,997.76	1.00
1,157,037.53		**6,623,081.82**	**3,632,148.99**	**2,990,932.84**

ශ්‍රී ලංකා කපු සංස්ථාව

2022.12.31 දිනට (රු.)	එල නොදරන වගාවේ වියදම්			2023.12.31 දිනට (රු.)
93,717,023.22	කපු සටහන් 9 (අ)			43,248,820.47
4,363,000.74	පොල් සටහන් 9 (ආ)			2,759,655.33
98,080,023.96	**එකතුව**			**46,008,475.80**

සටහන් 9 (අ)

2022.12.31 දිනට පිරිවැය	එල නොදරන වගාව - කපු	2023.01.01 දිනට පිරිවැය (රු)	2023.12.31 දිනට සෘජු වියදම් (රු)	2023.12.31 දිනට පිරිවැය (රු.)
	වතුයාය			
2,500,769.77	භාඩි වතුයාය	-	28,644.00	28,644.00
836,574.25	කමන්දළුව වතුයාය	-	-	-
18,527,780.81	පුත්තලම වතුයාය	497,586.34	2,694,348.91	3,191,935.25
4,911,875.45	එළුවන්කුලම් ශාක අභි.මධ්‍යස්ථානය	3,685,245.38	621,185.90	4,306,431.28
1,376,042.93	මාන්කර්ණි වතුයාය	1,376,042.93	597,158.71	1,973,201.64
870,926.45	මහඔය ශාක අභි. මධ්‍යස්ථානය	-	-	-
81,552.00	මොණරාගල ශාක අභි.මධ්‍යස්ථානය	81,552.22	250,635.00	332,187.00
2,103,465.79	පර්යේෂණ හා සංවර්ධනය	2,103,465.79	-	2,103,465.79
135,360.40	නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානය	135,360.40	-	135,360.40
1,628,450.40	පුනරීන් වතුයාය	1,628,450.40	-	1,628,450.40
4,442,596.44	වෙල්ලන්කුලම් වතුයාය	4,442,596.44	-	4,442,596.44
330,284.62	විලච්චිය ශාක අභිජනන මධ්‍යස්ථානය	-	-	-
53,072,714.82	කොණ්ඩච්චි ශාක අභි. මධ්‍යස්ථානය	16,739,544.25	5,468,374.93	22,207,919.18
2,898,629.09	තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය	2,898,629.09	-	2,898,629.09
93,717,023.22	**එකතුව**	**33,588,473.02**	**9,660,347.45**	**43,248,820.47**

සටහන් 9 (ආ)

2022.12.31 දිනට පිරිවැය (රු.)	එල නොදරණ වගාව - පොල්	2023.01.01 දිනට පිරිවැය (රු)	2023.12.31 දිනට සෘජු වියදම් (රු)	2023.12.31 දිනට පිරිවැය (රු.)
1,833,521.57	භාඩි වතුයාය	1,018,361.38	80,022.30	**1,098,383.68**
2,529,479.17	කමන්දළුව වතුයාය	1,241,961.65	419,310.00	**1,661,271.65**
4,363,000.74		**2,260,323.03**	**499,332.30**	**2,759,655.33**

2022.12.31 දිනට පිරිවැය (රු.)		2023.12.31 දිනටපිරිවැය (රු.)
	සටහන් 10	
	අනෙකුත් කුඩා ව්‍යාපෘති	
482,874.09	තේක්ක පැළ ව්‍යාපෘතිය	482,874.09
93,650.00	දිවුල් ව්‍යාපෘතිය	93,650.00
-	මඤ්ඤොක්කා	-
12,000.00	ගම්මිරිස්	12,000.00
-	උඳු	145,740.58
	පළතුරු ව්‍යාපෘතිය	106,390.00
588,524.09		**840,654.67**

	සටහන් 11	
	ජංගම වත්කම්	
	තොග	
10,685,093.21	කජු මඳ	8,611,790.71
30,113,893.39	පිරිසැකසුම් මධ්‍යස්ථානවල පවතින තොග	27,061,860.08
16,343,218,51	කජු පැළ	20,060,120.78
14,951,472.29	ලෙලි කජු	42,279,285.00
2,573,074.23	ඇසුරුම් ද්‍රව්‍ය	2,905,560.49
2,102,862.31	විවිධ	4,565,309.49
76,769,613.94		**105,483,926.55**

2022.12.31 (රු.)	**සටහන් 12**		2023.12.31 (රු.)
	වෙළෙඳ ණයගැතියෝ හා ලැබිය යුතු අනෙකුත් දෑ		
8,263,310.76	වෙළඳ ණයගැතියෝ	11,293,010.76	
291,695.00	**අඩු කළා:- බොල්ණය වෙන් කිරීම**	398,643.00	10,894,367.76
7,971,615.76			
25,935,361.66	ලැබිය යුතු අනෙකුත් දෑ	19,851,850.14	
2,106,184.42	**අඩු කළා:- හානිවීම්වලින් වන අලාභ**	2,106,184.42	17,745,665.72
31,800,793.00			**28,640,033.48**

	සටහන් 13	
	තැන්පතු අත්තිකාරම් සහ පෙර ගෙවුම්	
14,541,184.00	අත්තිකාරම්	2,035,398.00
16,000.00	වේතන අත්තිකාරම්	-
30,793,050.40	පෙර ගෙවුම්	2,327,405.00
5,288,423.20	කුලී සහ වෙනත් තැන්පතු	5,388,423.20
50,638,657.60		**9,751,226.20**

ශ්‍රී ලංකා කපු සංස්ථාව

සටහන් 14 - මුදල් හා මුදල් සමාන දෑ

2022.12.31 දිනට පිරිවැය (රු.)				2023.12.31 දිනට පිරිවැය (රු.)
337,708.29	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633704	(ජංගම)	5,963,501.18
8,487,922.27	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633705	(ජංගම)	5,463,951.65
781,490.32	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633710	(ජංගම)	-
659,122.04	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1633711	(ජංගම)	-
131,210,295.14	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649789	(ඉතුරුම්)	141,831,714.79
91,973.77	ලංකා බැංකුව - කොල්ලුපිටිය	1649970	(ඉතුරුම්)	-
15,593.10	ලංකා බැංකුව- ජා ඇල	813	(ජංගම)	-
7,750.00	මහජන බැංකුව-නුගේගොඩ	174-1-001-30007348	(ජංගම)	-
4,587.44	මහජන බැංකුව- නුගේගොඩ	174-2-001-1-0007348	(ඉතුරුම්)	-
270,824.17	මහජන බැංකුව- නුගේගොඩ	174-2-002-0-0007348	(ඉතුරුම්)	
31,555.14	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	134011100687	(ඉතුරුම්)	31,555.14
37,840.00	මුදල් -අතඉතිරි (අඹේපුස්ස අලෙවිසැල)			-
-	මුදල් -අතඉතිරි (ප්‍රදර්ශන)			1,158,160.00
27,540.00	මුදල් -අතඉතිරි (බලංගොඩ අලෙවිසැල)			48,720.00
21,320.00	මුදල් -අතඉතිරි (නාරාහේන්පිට අලෙවිසැල)			-
-	මුදල් -අතඉතිරි (රත්නපුර අලෙවිසැල)			169,980.00
91,960.00	මුදල් -අතඉතිරි (කොල්ලුපිටිය අලෙවිසැල)			188,380.00
217,911.00	මුදල් -අතඉතිරි (රාජගිරිය අලෙවිසැල)			319,794.00
10,000.00	සුළු මුදල් අග්‍රිමය			9,500.00
80,000.00	ඉන්ධන අග්‍රිමය			-
10,000.00	මුදල් අග්‍රිමය- මුද්දර			10,000.00
275,000.00	කපු අලෙවිසැල් අග්‍රිමය			282,500.00
200,000.00	මුදල් කිරීම සඳහා ඇති චෙක්පත්			-
300,330.25	මුදල් -අත ඉතිරි (වාණිජ තවාන්)			201,601.00
9,892.00	මුදල්-අත ඉතිරි (ව්‍යාජ්ති)			1,675.00
151,105.00	මුදල් -අතඉතිරි (පර්යේෂණ හා සංවර්ධන)			152,235.00
54,610.96	මුදල් -අතඉතිරි (නැදගමුවපිරිසැකසුම්මධ්‍යස්ථානය)			67,320.76
168,521.23	මුදල් -අතඉතිරි (පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය)			232,968.96
7,404.84	මුදල් -අත ඉතිරි (හාඩ් වතුයාය)			261.00
28,327.52	මුදල්-අත ඉතිරි (කමන්දළුව වතුයාය)			81,622.01
656.07	මුදල්-අත ඉතිරි (මාන්කර්ණි ශාක අභිජනන මධ්‍යස්ථානය)			1,099.75
40,579.91	මුදල් -අත ඉතිරි (පුත්තලම වතුයාය)			5,881.91
11,589.25	මුදල්- අතඉතිරි (එළුවන්කුලම වතුයාය)			12,347.68
19,400.00	මුදල් -අතඉතිරි (ඇල්කඩුව ශාක අභිජනන මධ්‍යස්ථානය)			-
154.70	මුදල් -අතඉතිරි (වෙල්ලන්කුලම ශාක අභිජනන මධ්‍යස්ථානය)			35,621.70
160.15	මුදල් -අතඉතිරි (තිරියාය ශාක අභිජනන මධ්‍යස්ථානය)			160.15
-	මුදල් -අතඉතිරි (මහඔය වතුයාය)			7,120.00
115.00	මුදල් -අතඉතිරි (පුනරින් වතුයාය)			20,446.00
173,599.00	මුදල්-අත ඉතිරි (කොණ්ඩව්වි වතුයාය)			294,913.00
5,861.00	මුදල් -අත ඉතිරි (වයින් ව්‍යාපෘතිය)			5,861.00
143,842,699.56	එකතුව			**156,598,891.68**

2022 (රු.)	සටහන් 15 අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	2023 (රු.)
5,275,688.03	උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය	5,066,937.98
9,381,298.63	සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය	9,220,261.81
266,262,059.51	උක්, බඩඉරිඟු, කපු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන සහ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	231,870,018.69
280,919,046.17		**246,157,218.48**
	සටහන් 16	
	ප්‍රාග්ධන සංචිත	
16,929,116.63	ප්‍රත්‍යාගණන සංචිතය-වාහන	16,929,116.63
512,730.22	අනෙකුත් ප්‍රාග්ධන සංචිත	512,730.22
17,441,846.85	**එකතුව**	**17,441,846.85**
	සටහන් 17	
	විශ්‍රාමික දීමනා ගෙවීම්	
42,948,044.00	වර්ෂය ආරම්භයේදී තිබූ ශේෂය	35,789,916.00
4,656,007.00	වර්ෂයට අදාල ගෙවීම්	8,517,181.00
(11,814,135.00)	ගෙවන ලද/ ගෙවීමට ඇති පාරිතෝෂික දීමනා	(3,792,270.00)
35,789,916.00	**එකතුව**	**40,514,827.00**
	සටහන් 18	
	දිගුකාලීන ණය	
3,500,000.00	වී අලෙවි මණ්ඩලය	3,500,000.00
3,500,000.00	**එකතුව**	**3,500,000.00**
	සටහන් 19	
	වෙළඳ ණය හිමියෝ සහ අනෙකුත් ගෙවියයුතු දෑ	
35,448,561.19	විවිධ ණය හිමියෝ	64,939,680.20
7,098,240.94	උපචිත වියදම්	8,024,991.02
42,546,802.13	**එකතුව**	**72,964,671.22**

පාරිතෝෂික ගෙවීම් සඳහා රු. 40,514,827.00 ක මුදල ආයෝජනය කර නොමැත. මේ සඳහා අයෝජනය කිරීමට අදාල ක්‍රියාමාර්ග ඉදිරියේදී කඩිනමින් සිදු කිරීමට නියමිතයි.

<u>අතිරේක සටහන් ඉදිරිපත් කිරීම.</u>

සටහන් 20

<u>ප්‍රාග්ධන ප්‍රයාපනයන් සහ අසම්භාව්‍යයන්</u>

ප්‍රාග්ධන ප්‍රයාපනයන්

20.1 මෙම සංස්ථාව සතුව සැලකිය යුතු හා කැපී පෙනෙන ප්‍රාග්ධන ප්‍රයාපනයන් වාර්තා කරන දිනට වාර්තා නොවේ.

අසම්භාව්‍ය වගකීම්

20.2 වාර්තා කරන දිනට අදාලව කිසිදු අසම්භාව්‍ය වගකීමක් අණාවරණය වී නොමැත.

සටහන් 21

<u>වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්</u>

අදාල වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසුව සිදුකළ යුතු ගැලපීම් හා අනාවරණය කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාලව නොමැත.

සටහන් 22

22.1 **<u>සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකල ගණුදෙණු</u>**
<u>සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවියයුතු ගෙවීම්</u>

වී අලෙවි මණ්ඩලය	<u>3,500,000.00</u>

22.2 **<u>සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබියයුතු මුදල්</u>**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	9,466,200.00
ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය	1,962,800.00
	<u>11,429,000.00</u>

ශ්‍රී ලංකා කඳු සංස්ථාව

2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් සඳහා ප්‍රකාශය

2022.12.31 (රු)			2023.12.31 (රු)
134,849,168.44	විකුණුම්	01	176,317,074.88
83,472,666.14	විකුණුම් පිරිවැය	02	135,914,991.25
51,376,502.30	දළ ලාභය(අලාභය)		**40,402,083.63**
77,500,000.00	රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන)		80,400,000.00
69,390,183.13	වෙනත් ආදායම්	03	76,599,384.80
198,266,685.43			**197,401,468.43**
15,029,109.31	විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	04	18,339,750.18
145,510,078.61	පරිපාලන වියදම්	05	144,792,740.06
23,101,087.38	වෙනත් වියදම්	06	39,094,227.07
154,999.16	මූල්‍ය වියදම්		195,331.17
183,795,274.46			202,422,048.48
14,471,410.97	වාර්ෂික ලාභය/ (අලාභය)		**(5,020,580.05)**
	වෙනත් විස්තීරණආදායම්		
14,471,410.97	වාර්ෂික ලාභය/ (අලාභය)		**(5,020,580.05)**
(2,232,295.00)	ආයුගණක ලාභය/(අලාභය)		153,725.00
-	වෙනත් විස්තීරණ ආදායම් සඳහා ආදායම් බදු		-
(2,232,295.00)	**වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්**		
16,703,705.97	**වර්ෂය සඳහා ඉපයූ මුළු විස්තීරණආදායම**		**153,725.00**
			(5,174,305.05)

ශ්‍රී ලංකා කජු සංස්ථාව

2023.12.31 දිනට අදාල ලාභාලාභ ගිණුමට අදාලසටහන්

සටහන් 1

විකුණුම්	**2023 වර්ෂය**	**2022 වර්ෂය**
කජු මඳ	167,922,980.38	**113,791,178.44**
අඩුකලා : ආපසු එවුම්	(107,508.00)	-
	167,815,472.38	**113,791,178.44**
පැළ	8,501,602.50	21,057,990.00
ලෙලි කජු	-	-
	176,317,074.88	**134,849,168.44**

සටහන් 2

2022.12.31 දිනට වෙළඳ ගිණුම	**2023 වර්ෂය**	**2022 වර්ෂය**
විකුණුම්පිරිවැය		
ආරම්භක තොගය	27,028,311.72	24,425,421.36
කජු මඳ	10,685,093.21	3,894,533.06
කජු පැළ	16,343,218.51	20,530,888.30
එකතු කලා - මිලට ගැනීම්	-	-
මිලට ගැනීම්		
නිෂ්පාදන වියදම්-කජු මඳ - සටහන් 2.1	126,725,390.69	98,903,031.69
නිෂ්පාදන වියදම් - කජු පැළ - සටහන් 2.2	20,876,162.21	13,985,793.66
	147,601,552.90	112,888,825.35
අඩුකලා:- අවසන් තොගය	174,629,864.62	137,314,246.71
කජු මඳ	8,611,790.71	10,685,093.21
කජු පැළ	20,060,120.78	16,343,218.51
අඩුකලා:-		
අභ්‍යන්තර මාරු	6,780,440.16	21,303,755.70
කිරීම් (පැළ)		
විශේෂ පැළ නිකුත් කිරීම්	984,217.21	936,400.21
මැරුණු පැළ	2,216,262.72	3,615,782.19
නියැදි සහ පැසසුම්	62,041.79	957,330.75
	38,714,873.37	53,841,580.57
	135,914,991.25	**83,472,666.14**

සටහන් 3

වෙනත් ආදායම්	**2023 වර්ෂය**	**2022 වර්ෂය**
පොළී ආදායම් (ඉතුරුම් ගිණුම්)	3,471,898.56	4,667,302.86
පොළී ආදායම් (ආපදා ණය/ විශේෂ ණය)	208,957.88	220,972.45
ලෙලි කජු ආනයන සේවාගාස්තු	-	1,000,000.00
විවිධ ආදායම්	7,006,230.90	15,875,290.90
බෙදාහැරීම් ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම	1,029.00	-
ඉපිල් ඉපිල් විකුණුම්	69,750.00	-
සංචාරක බංගලා කුලී ආදායම්	61,860.00	117,200.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රම ක්ෂයකිරීම	62,629,190.06	42,786,840.22
පොල් විකුණුම්	3,128,968.40	4,107,917.70
කුළු බඩු නිෂ්පාදන විකුණුම්	21,500.00	614,659.00
	76,599,384.80	**69,390,183.13**

ශ්‍රී ලංකා කපුසංස්ථාව

සටහන් 4

විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	**සංස්ථාව ඉපැයූ ආදායම්**	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2023 වර්ෂය**	**2022 වර්ෂය**
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	18,339,750.18	-	18,339,750.18	15,029,109.31
	18,339,750.18		18,339,750.18	15,029,109.31

සටහන් 5

පරිපාලන වියදම්	**සංස්ථාව ඉපැයූ ආදායම්**	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2023**	**2022**
වාණිජ පැළ තවාන්	1,728,275.50	-	1,728,275.50	2,618,117.96
ප්‍රධාන කාර්යාලය	128,178,252.61	-	128,178,252.61	129,447,214.74
අලෙවි කටයුතු	623,623.89	-	623,623.89	895,310.87
පළ නොදරන වගාව	-	2,440,826.53	2,440,826.53	981,754.00
මානව සම්පත් සංවර්ධනය	-	298,600.00	298,600.00	5,000.00
ව්‍යාප්ති අංශය	-	9,029,967.03	9,029,967.03	9,132,226.65
පර්යේෂණ සහ සංවර්ධනය	-	2,493,194.50	2,493,194.50	2,430,454.39
	130,530,152.00	**14,262.588.06**	**144,792,740.06**	**145,510,078.61**

සටහන් 6	**සංස්ථාව ඉපැයූ ආදායම්**	**ප්‍රාග්ධන ප්‍රදාන**	**2023**	**2022**
වෙනත් වියදම්				
හෙලෝපෙල්ටිස් පාලන වැඩසටහන	-	130,709.46	130,709.46	91,433.80
ඵල දරන වගාව -පොල්	3,517,791.89	-	3,517,791.89	1,482,884.13
කුළුබඩු මිලදී ගැනීමේ පිරිවැය	-	-	-	662,758.00
පැළ සඳහා පිරිවැය	-	5,030,028.18	5,030,028.18	17,248,229.26
විදුලිය සැපයීම (කොණ්ඩව්චි වතුයාය)	-	28,199,434.82	28,199,434.82	-
මැරුණු පැළ	2,216,262.72	-	2,216,262.72	3,615,782.19
	5,734,054.61	**33,360,172.46**	**39,094,227.07**	**23,101,087.38**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය (රු)		2023.12.31 දිනෙන් අවසන් වර්ෂය (රු)
	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	
16,703,705.97	වර්ෂය තුළ ලාභ/අලාභය	(5,174,305.05)
(1,697,353.10)	පෙර වසර සඳහා ගැලපීම්	373,086.60
	මුදල් චලනයන්නොවූ අයිතමයන් සඳහා ගැලපීම්	
11,416,492.60	ක්ෂය වීම්	11,992,822.60
2,736,980.19	ක්‍රමක්ෂය	5,848,541.53
4,656,008.00	පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම	9,194,381.00
64,252.00	බොල්ණය සඳහා ලියා හැරීම හෝ වෙන් කිරීම	106,948.00
(6,837,703.50)	පාරිතෝෂික දීමනා සඳහා අධි වෙන්කිරීම	-
1,716,845.00	මෝටර් රථ සඳහා ලියාහරින ලද පිරිවැය	-
(646,578.84)	මෝටර් රථ සඳහා ලියාහරින ලද සම්මුවිත ක්ෂය කිරීම්	-
(369,786.87)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන ලියාහැරීම	(369,786.87)
39,243.95	අනෙකුත් කුඩා ව්‍යාපෘති ලියා හැරීම	-
(4,888,275.31)	පොලී ආදායම් ලැබීම්	(3,680,856.44)
(36,969,702.35)	රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	(27,867,362.37)
(14,075,872.26)	කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් ලාභය /අලාභය	(9,576,531.00)
	කාරක ප්‍රාග්ධනවෙනස්වීම්	
14,182,543.37	තොගය-(වැඩිවීම)/අඩුවීම	(28,714,312.58)
15,525,174.63	ණයගැතියෝ-(වැඩිවීම)/අඩුවීම	3,053,811.52
(6,825,739.75)	අත්තිකාරම් සහ පෙර ගෙවුම්-(වැඩිවීම)/අඩුවීම	40,887,431.40
(8,405,120.92)	ණය හිමියෝ -වැඩිවීම/(අඩුවීම)	29,491,119.01
(2,172,327.32)	උපචිත වියදම් - වැඩිවීම/(අඩුවීම)	926,750.08
12,304,530.01		**45,644,799.43**
(1,771,342.25)		36,068,268.43
(4,976,432.50)	පාරිතෝෂික ගෙවීම්	(4,469,470.00)
(6,747,774,75)	මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**31,598,798.43**
	ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය	
(11,058,103.55)	ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(9,128,033.00)
(179,613.90)	කෙරිගෙන යන ප්‍රාග්ධන වියදම	(15,591,578.60)
(26,488,469.85)	නව වගාව සඳහා ආයෝජනය කිරීම	(10,159,679.75)
4,888,275.31	පොලී ආදායම් ලැබීම්	3,680,856.44
-	වෙනත් කුඩා ව්‍යාපෘති සඳහා ආයෝජනය	(252,130.58)
(32,837,911.99)		**(31,450,565.49)**

	මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය	
29,000,000.00	රාජ්‍ය ප්‍රදාන	47,000,000.00
(5,447,351.00)	අමාත්‍යාංශවලින් ලද ප්‍රදාන	(34,392,040.82)
(16,033,037.74)	මුදල් හා මුදල්හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	12,756,192.12
159,875,737.30	වසර ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ	143,842,699.56
143,842,699.56	වසර අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ	**156,598,891.68**

2022.12.31 දිනට		**31.12.2023 දිනට**
1,943,877.88	අතැති මුදල්	3,308,168.92
10,289,586.02	බැංකුගත මුදල්	11,427,452.83
131,609,235.66	ඉතුරුම්	141,863,269.93
143,842,699.56		**156,598,891.68**

2023.12.31 දිනෙන්අවසන් වර්ෂය සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය						
වෙනස්වීම්	මූලික ප්‍රාග්ධනය (රු)	රාජ්‍ය ප්‍රාග්ධනය (රු)	වෙනත් පාර්ශවයන්ගෙන් ලත් ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත (රු.)	ලාභාලාභ ගිණුම (රු.)	එකතුව (රු.)
2022.01.01 දිනට ශේෂය	40,000,000.00	289,534,925.21	286,736,184.04	17,441,846.85	(167,065,129.24)	466,647,826.86
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-	-	-	(1,697,353.10)	(1,697,353.10)
වර්ෂය තුළදී ලද ප්‍රදාන	-	29,000,000.00	-	-	-	29,000,000.00
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම	-	(36,969,702.35)	(5,817,137.87)	-	-	(42,786,840.22)
මුළු විස්තීරණ ආදායම	-	-	-	-	14,471,410.97	14,471,410.97
ශුද්ධ සත්‍ය වැඩිවීම / (අඩුවීම)	-	-	-		2,232,295.00	2,232,295.00
2022.12.31 දිනටශේෂය	**40,000,000.00**	**281,565,222.86**	**280,919,046.17**	**17,441,846.85**	**(152,058,776.37)**	**467,867,339.51**
2023.01.01 දිනටශේෂය	40,000,000.00	281,565,222.86	280,919,046.17	17,441,846.85	(152,058,776.37)	467,867,339.51
පෙර වර්ෂයට අදාල ගැලපුම්	-	-	-	-	373,086.60	373,086.60
වර්ෂය තුලදී ලද ප්‍රදාන	-	47,000,000.00	-	-	-	47,000,000.00
ලාභ අලාභ ගිණුමට මාරු කිරීම		(27,867,362.37)	(34,761,827.69)		-	(62,629,190.06)
වාර්ෂික ලාභය / (අලාභය)		-	-		(5,020,580.05)	(5,020,580.05)
ශුද්ධ සත්‍ය වැඩිවීම / (අඩුවීම)		-	-		(153,725.00)	(153,725.00)
2023.12.31 දිනටශේෂය	**40,000,000.00**	**300,697,860.49**	**246,157,218.48**	**17,441,846.85**	**(156,859,994.82)**	**447,436,931.00**

11. 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE



මගේ අංකය
எனது இல.
My No. ඒආර්අයි/ඩී /එස්ඵල්සීසී/එෆ්ජ /2023/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 ඔක්තෝම්බර් 11 දින

ශ්‍රී ලංකා කඳු සංස්ථාව
සභාපති කාර්යාලය
15 OCT 2024
1334, පරණ කෝට්ටේ පාර,
රාජගිරිය

සභාපති

ශ්‍රී ලංකා කඳු සංස්ථාව

ශ්‍රී ලංකා කඳු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ චෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කඳු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා කඳු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කඳු මද විකුණුම් වටිනාකම රු.167,815,472 ක් ලෙස සහ විගණනයට ඉදිරිපත් කල වාර්තා අනුව එම වටිනාකම රු.160,485,428 ක් වූයෙන් රු.7,330,044 ක වෙනසක් විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(අ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල කජු මද කි.ග්‍රෑම් 1 ක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී යොදාගතයුතු සංරචකවලට අමතරව වර්ෂයේ ආරම්භක තොගයේ වටිනාකම් යොදාගැනීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය අධිගණනය වී 2023 වර්ෂයේ අවසන් තොගයේ වටිනාකම රු. 6,985,467 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඇ) දේපල පිරියත භාවිතයට ගැනීමට අපේක්ෂිත තත්වයට ගෙන එන තෙක් දරන වියදම්, එකවර ප්‍රාග්ධනිත නොකර භාවිතය ගැනීමට අපේක්ෂිත තත්වයට පත්වන තෙක් කෙරීගෙන යන වැඩ යටතේ වර්ගීකරණ කල යුතු වුවද සංස්ථාව විසින් කොන්ඩවටි වතුයායේ විදුලි වැට ඉදිකිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවීමට සම්බන්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය වූ රු.513,912 ක්, 2023 වර්ෂයේදී ඉඩම් ගිණුමට හර කර තිබුණි.

(ඈ) සංස්ථාවේ ණය අයකරගැනීමේ කාලසීමාව දින 60 ක් වුවද දින 90 ඉක්මවූ වෙළඳ ණයගැනි ශේෂය රු.4,982,960 ක් වූ අතර එම ශේෂය තුළ වසර දෙකක් ඉක්මවූ එක් පෞද්ගලික ආයතනයකින් පමණක් අයවිය යුතු රු.1,474,410 ක ණය ශේෂය අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වෙන් කිරීමක් ද කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට මීට වසර 10කට පෙර රු.9,466,200 ක කජු පැළ ලබා දී තිබුණි. අදාළ අමාත්‍යාංශය වර්තමානයේ අහෝසි කර ඇති හෙයින් වෙනත් ණයගැනි ශේෂය තුළ ඇති එම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැතිවුවද ඒ සඳහා ගිණුම් මඟින් ගැලපීමට කටයුතු කර නොතිබුණි .

(ඊ) වර්ෂ 01 කට වඩා වැඩි වෙනත් ණයගැනි වටිනාකම වූ රු.17,447,496 ක් සඳහා වෙන් කරන ලද හානිකරණ අලාභය රු.2,106,184 කි. 2018 වර්ෂයේ සිට හානිකරණ අලාභ ලෙස සෑම වර්ෂයකම එකම අගයක් පවත්වා ඇතත් එම අගය වාර්ෂිකව යාවත්කාලීන කර අවශ්‍ය ගැලපීම් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(උ) සංස්ථාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ එළුවන්කුලම වතුයායේ 2000 වර්ෂයේදී වගා කරන ලද තේක්ක පැල 2023 වර්ෂය වන විට දැව ලබා ගැනීමේ තත්ත්වය දක්වා වර්ධනය වී ඇති අතර එහි ඇති ගස් ප්‍රමාණය 4,253 ක් පමණ වේ. එම ගස්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 139 ඡේදය ප්‍රකාරව විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් විධිමත් ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ රු.40,514,827 ක ශේෂයට අනුරූපිව කිසිදු ආයෝජනයක් සිදු කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 (සේවක ප්‍රතිලාභ) හි 135 (ආ) ඡේදය ප්‍රකාරව අස්පීත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම (Defined benefit plans) සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම එහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලි ආදායම හෝ වියදම, සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කරන ලද ගෙවීම් සහ ආයුගණන ලාභය/අලාභය යනාදී අයිතමයන් වෙන් වශයෙන් දැක්විය යුතු නමුත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාල සටහනෙහි ප්‍රවර්තන සේවා පිරිවැය, පොලි වියදම, ආයුගණන අලාභය යන සංරචකවල එකතුව වන රු.8,517,181 ක වටිනාකම, වර්ෂය සඳහා වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන 19 හි පෙන්වා තිබුණි.

(ඓ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ වල දල ධාරණ අගය (Gross Carrying Value amount) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 136,155,472 ක් වූ දැනට භාවිතා කරමින් පවතින දේපල, පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 73 වගන්තිය අනුව දේපල පිරියත උපකරණ යටතට ගෙනෙන පිලිවෙලින් පිරිවැය රු.129,319,656 හා රු. 6,623,082 වූ පරිනත කඵ වගාවේ හා පොල් වගාවේ වර්ෂයේ ආරම්භක ශේෂය, වර්ෂය තුල එකතුවීම්, වර්ෂය තුල ඉවත් කිරීම් හා වර්ෂය අවසානයේ ශේෂය දැක්වෙන සැසඳුමක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඕ) 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සංස්ථාව දිගින් දිගටම අලාභ ලබමින් තිබුණු අතර ආසන්නතම වර්ෂ 05 තුළ එනම් 2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයේදී රජයේ ප්‍රදාන නොසලකා පසුගිය වර්ෂ 05 තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දෘෂ්‍ය අලාභය රු. මිලියන 148 සිට මිලියන 102 දක්වා පරාසයක් වී තිබුණි. මේ අනුව අඛණ්ඩව අලාභ ලැබීම , කාර්යමණ්ඩල පුරප්පාඩු හා පවත්නා කඵ වතු උපරිම ලෙස වගා නොකිරීම නිසා නිෂ්පාදනය අඩුවීම වැනි හේතු මත සංස්ථාවේ පැවැත්ම අභියෝගාත්මක වන අතර රජයේ ප්‍රධාන නොලැබුණහොත් අඛණ්ඩ පැවැත්ම මතභේදාත්මක වන බව නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.3 සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්,නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවන්නා ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වඤ්ඤා ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ,2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ),(ඉ),(ඊ), (උ),(ඌ),(එ) (ඒ) හා (ඕ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත	සංස්ථාව විසින් 2011 වර්ෂයේ සිට ආදායම් බදු ගෙවීමට හා ආදායම් බදු වාර්තා යැවීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන වල එම කාලපරිච්ඡේදවලට අදාළව රු.779,483 ක රඳවාගත් බදු (WHT) ලැබිය යුතු ශේෂයක් පෙන්නුම් කර තිබුණි.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 18 වගන්තිය	ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් 2024 ජූනි 11 දිනට නිරවුල් නොකල විගණන ගාස්තුව රු.1,934,310 ක් විය.
(ඇ)	2012 ජූලි 24 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ	සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති කඳු වගා කරන ඉඩම් අක්කර 11,513 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු 2023 දෙසැම්බර් 31 දින දක්වා නිම කර නොතිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට කපු වගා කර නිබෙන බිම් ප්‍රමාණය දැල් වශයෙන් අක්කර 3,449 ක් වූ අතර එල දරන කපු ගස් සංඛ්‍යාව 51,685 ක් විය . එම ගස් වල ලියා හළ ශුද්ධ අගය රු.78,708,150 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා නිබුණ ද එම කපු ගස් සංගණනයක් සිදුකිරීම, ගස් අංකනය කිරීම හා ගස් පිළිබඳ ලේඛනයක් පිළියෙළ කිරීම සිදුකර නොනිබුණි.

(ආ) ආයතනයේ වෙඩි අඩවිය හරහා අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයට කපුමද විකිණීම ආරම්භ කර නිබුණද එම වෙඩි අඩවිය අකර්මන්‍ය වීම හේතුවෙන් 2023 වර්ෂයේ කපුමද මාර්ගගත විකුණුම් රු. 32,230ක් වැනි අවම මට්ටමක පැවතුනි.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීමේ බැංකු ගිණුමේ පැවති රු.141,831,715 ක ශේෂය උපරිම ඵලදායිව ආයෝජනය කර නොතිබුණි.

(ඈ) එවකට පැවති සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය මැදිහත්වීමෙන් ලෙලි කපු මිලදී ගැනීම සඳහා 2005 වර්ෂයේදී ආපසු ගෙවීමේ පදනම මත වී අලෙවි මණ්ඩලයෙන් ලබාගත් රු.3,500,000 ක් හා ඊට අදාළ පොලිය වන රු. 927,500 ක මුදල සමාලෝචිත වර්ෂය දක්වා ගෙවීමට කටයුතු කර නොනිබුණි.

(ඉ) සංස්ථාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අංක 60/07 හා 1973 මැයි 25 දිනැති ගැසට් නිවේදනයේ පලමු උපලේඛනයේ (අ), (ඇ), (ඈ) (ඊ) සහ (උ) වගන්තිවල සඳහන් කරුණු ඉටුකර ගැනීම කෙරෙහි 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ ඉතා අඩු අවධානයක් යොමුවී තිබූ අතර එනම් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, කපු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් සමඟ එක්ව කටයුතු කිරීම සහ විමර්ශන හා පර්යේෂණ කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කර නොනිබුණි.

(ඊ) සංස්ථාව සතුව භාරයේ පවතින වතු 13 ක ඉඩම් වල ප්‍රමාණය අක්කර 11,363 කින් අක්කර 3,449 ක් පමණක් කපු වගා කර ඇතත් වගා නොකල ඉඩම් ප්‍රතිශතය සියයට 70 ක් විය. එසේම ඵලදා වාර්තා අනුව 2019 වර්ෂයේ සිට 2023 දක්වා කාලය තුළ මෙ.ටොන් 157.81 සිට 60.40 දක්වා කපු ඵලදාව අඩු වී සාමාන්‍ය කපු නිෂ්පාදනය මෙ.ටොන් 107.54 ක අගයක් ගෙන නිබුණි. බද්ධ කපු ගස් අක්කරයකට ගස් 70 ක් හා බීජ කපු ගස් අක්කරයකට ගස් 40 බැගින් වගා කල ඵල දරන කපු ගස් ප්‍රමාණය 51,685 ක් ලෙස දක්වා නිබුණි. 2022 වර්ෂයේදී කපු ඵලදාව මෙ.ටොන් 60.40 ක් වූ අතර අක්කරයක අස්වැන්න කපු කි.ග්‍රෑ 17.64 ක අඩු අගයක් ගෙන නිබුණි. ඒ අනුව එක් කපු ගසක සාමාන්‍ය අස්වැන්න

කිලෝග්‍රෑම් 1.17 ක් වැනි දුර්වල තත්ත්වයක පැවතියද නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සාර්ථක පියවර ගෙන නොතිබුණි.

(ඇ) පුත්තලම, කමන්දළුව හා අම්පාර හාඩ් වතුවල පිහිටි පොල්ගස් සංඛ්‍යාව 4,184 ක් වූ අතර, නොමේරූ ගස් 1,147 , ඵලදා ලබන ගස් 2,391 ක් හා කනාටු ගස් 646 කින් සමන්විත වී තිබුණි. 2023 වර්ෂයේ පොල් ඵලදාව ගෙඩි 57,425 ක් වී තිබුණු අතර එම ඵලදාවේ විකුණුම් වටිනාකම රු. 2,613,047 ක් විය. ඒ අනුව ඵලදාව ලබන ගසක වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි 24 ක් වී තිබුණු අතර විකුණුම් ආදායම රු.1,092 ක් වී තිබුණි. ඵලදාව වැඩිකර ගැනීමට පොල් ගස් නඩත්තු කිරීම හා පොහොර යෙදීම දුර්වල වීමත්,කනාටු පොල්ගස් 491 ක් ඉවත් කිරීම හා ඒ වෙනුවෙන් නව පැළ පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අංක SLCC/PLC/CI/22/2023 හි ශ්‍රී ලංකාවේ හෙක්ටයාර් 70,000 ක් පමණ කජු වගාවන් පවතින අතර වර්ෂයකට මෙ.ටොන් 100,000 ක් හා 120,000 ක අතර ප්‍රමාණයක් කජු පුහුලන් අපතයක් හා කජු නිෂ්පාදනයෙන් පසු සියයට 75 ක කජු ලෙලි අපතයක් ලෙස එනම් දළ වශයෙන් මෙ.ටොන් 59.415 ඉවත් වේ. සංස්ථාවේ මෙම අපතයන් ලෙස ඉවත් කරනු ලබන කජු පුහුලන් හා කජු ලෙලි වලින් අතුරු නිෂ්පාදනයක් කිරීමට හෝ පවතින නිෂ්පාදන සංවර්ධනය කිරීමට එම නිෂ්පාදන කර්මාන්තයේ කර්මාන්තකරුවන් සොයා එම කජු පුහුලන් අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින විදුලිජනක යන්ත්‍රය (Generator),බොයිලේරුව (Boiler),කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය හා පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින බොයිලේරුව (Boiler) අක්‍රිය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු පිරිසැකසුම් බොයිලේරුව 2015 වසරේ සිට ක්‍රියාවිරහිත වී කජු තැම්බීමේ ක්‍රියාවලිය නතරවී තිබුණි. අඛලන් වූ බොයිල්ලේරුව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) නැදගමුව කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ශ්‍රේණිගත කිරීම් හා ඇසුරුම් කිරීමේ අංශයට 2021 වර්ෂයේ රු.8,100,000 ක් වැයකර විනාඩියකට පැකට් 60 ක් ඇසුරුම් කළ හැකි ස්වයංක්‍රීය ඇසුරුම් කිරීමේ යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දින දක්වා එම ඇසුරුම් යන්ත්‍රය භාවිතා නොකර නිෂ්කාර්යව තිබුණි.

(ඔ) කොන්ඩව්වි වතුයාය ප්‍රතිසංස්කරණය යටතේ අලි වැට ඉදිකිරීම, ට්‍රැක්ටර් හා ජල බවුසර් මිලදී ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම යන ප්‍රධාන කාර්යයන් සඳහා උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්,කු රුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් රු.225,000,000 ක් ලබාදී එම ව්‍යාපෘතිය 2021 වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණි. කි.මීටර 26 ක් දිග අලිවැට ඉදි කිරීම, නලලිං ප්‍රතිෂ්ඨාපනය, කොන්ඩව්වි වතුයායේ සංචාරක නිවාසය අලුත්වැඩියා කිරීම හා විදුලිය ලබා ගැනීම 2023 දෙසැම්බර් 31 දින වන විටද ඉටු කර නොනිබුණි.

(ක) ස්ථාන භාර නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීමට උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.15,653,000 ක මුදලක් වෙන් කර නිල නිවාස 07 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2021 දෙසැම්බර් 13 දින සංස්ථාවට මුදල් ලැබුනද 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම නිල නිවාස භාවිතයට ගත හැකි ලෙස සම්පූර්ණයෙන් ඉදි කර අවසන්කොට නොනිබුණි.

(ග) ඉඩම් අත්කරගැනීමේ ආඥා පනතේ (460 පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (4) අනුරු විධානය යටතේ අංක 80 හා 1980 මාර්තු 14 දිනැති ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් නිවේදනය මඟින් ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ කොට්ඨාශයේ දාසිය පත්තුවේ කලුවැල්ගොඩ ගමේ අක්කර 1 රූඩ් 2 පර්චස් 29 ක් විශාල ඉඩම් කොටස ගම්පහ දිසාපති විසින් පවරාගෙන 1988 ජනවාරි 01 දින පැවරීමේ සහතික පත්‍රය මඟින් සංස්ථාව වෙත කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පවරා දී ඇතත් 2023 වර්ෂය වන විට මෙම ඉඩම පවරා දී වර්ෂ 35 ගත වී තිබුණද එම ඉඩම සංස්ථාවේ නමින් පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ච) සංස්ථාව විසින් ලංකා බැංකුව කොල්ලුපිටිය ශාඛාවෙන් 2017 සැප්තැම්බර් 14 දින අංක 081430937 දරන උකස් ණය ගිවිසුමට එළැඹ පුත්තලම කජු පිරිසැකසුම් කර්මාන්ත ශාලාව පිහිටි චේනකුඩිරිප්පු වත්ත ඉඩම උකස් කර රු. 10,000,000 ක ණය ලබා ගෙන 2018 සැප්තැම්බර් 19 දින වන විට ලබාගත් ණය මුදල ගෙවා අවසන් කර තිබුණද පුත්තලම ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබූ උකස් ගිවිසුම අවලංගුකර සංස්ථාවට ඉඩම පවරා ගැනීමට 2024 පෙබරවාරි 29 වන විටද කටයුතු කර නොනිබුණි.

(ජ) සංස්ථාවේ ජලසම්පාදන පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන මඟින් රු.මිලියන 100 ක් 2021 වර්ෂයේදී ලබාදී ඇතත් එම ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර නොනිබුණි.

(ට) මන්නාරම දිස්ත්‍රික්කයේ කොන්ඩඩවිල් කපු වතු යායේ නැගෙනහිර මායිමේ කල්ලාරු ඔය පිහිටි ප්‍රදේශයේ අක්කර 02 ක භූමි කොටසක් ගිවිසුමකින් තොරව විදුලි බල මණ්ඩලයේ ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ලංකා විදුලි බල මණ්ඩලය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු අතර කිසිදු බදු ආදායමක් හෝ කුලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) පුත්තලම කපු පිරිසැකසුම් මධ්‍යස්ථානය සඳහා 2021 වර්ෂයේදී සියයට 10 ක් වූ රඳවා ගැනීමේ තැන්පතු මුදල හැර රු. 7,092,000 ක් වැය කර මිලදී ගත් කපු පිරිසැකසුම් කිරීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම හේතුවෙන් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව තිබුණි. සැපයුම්කරුට එරෙහිව නීති මාර්ගයෙන් කටයුතු කිරීමට අමාත්‍යාංශයේ නීති අංශයේ උපදෙස් මත ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දන්වා තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රයේ සැපයුම්කරුට එරෙහිව නීති මඟින් කටයුතු කර නොතිබුණි.

(ත) පුත්තලම කමන්දළුව කපු වතුයායේ බම්බිකුලම වැව ආශ්‍රිත ප්‍රදේශයේ අනවසර වැලි කැනීම පිළිබඳව රස්නායකපුර පොලිසියට හා පොලිස්පති වෙත 2021 වර්ෂයේදී සංස්ථාවේ සභාපති දැනුම් දී තිබූ නමුත් එම අනවසර වැලි කැණීම නැවැත්වීමට අපොහොසත් වී තිබුණි. ඒ හේතුවෙන් වතුයායේ ආරක්ෂාවට හා පරිසරයට අහිතකර ලෙස බලපා තිබුණි.

(ද) සංස්ථාවේ කපු වතුයායවල 2023 වර්ෂයේ ඉලක්කගත අස්වැන්න හා එම වර්ෂයේදී ලැබූ ලෙලි කපු අස්වැන්න සැසඳීමේදී වතුයාය 13 න් කොන්ඩඩවිල් වත්තෙහි හැර කපු වතුයායන් 12 ක ඉලක්ක ලගා කරගෙන නොතිබුණි. එම ඉලක්ක ලගා කර නොගැනීමේ ප්‍රතිශතය සියයට 49 ක් වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී කපු වතුයායන් 2 ක හැර කපු වතුයායන් 11 ක ලෙලි කපු ඵලදාව කි.ග්‍රෑම් 15,148 කින් අඩු වී තිබුණි.

(න) අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර කළමනාකරු ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2010 සිට 2022 වර්ෂයේ අවසානය දක්වා කපු වගාකල යුතු ඉලක්ක ඉඩම් අක්කර ප්‍රමාණය 5085 ක් වී තිබුණු අතර කපු වගා කරන ලද අක්කර ප්‍රමාණය 4929 ක් වී තිබුණි. 2020 සිට 2022 වර්ෂය දක්වා සහනාධාර කපු වගා වැඩසටහන් යටතේ අක්කර 569 ක් සඳහා ගොවීන් 467 දෙනෙකු වෙත කපු පැළ 39,865ක් බෙදා හැර තිබූ නමුත් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ කපු නිෂ්පාදන හා පිරිසැකසුම් කර්මාන්තයේ යෙදෙන පුද්ගලයින් සංඛ්‍යාව එකක් බව දක්වා තිබුණි. මේ අනුව සංස්ථාව විසින් එම දිස්ත්‍රික්කයේ කපු නිෂ්පාදන හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ඵ) මිහින්තලේ කපු පැළ තවානේ භාවිතය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට (අනුරාධපුර භූ ගත ජල අංශය) රු.688,390 ක් ගෙවා 2022 වර්ෂයේදී නළ ළිඳක් ඉදි කර ඇතත් 2023 දෙසැම්බර් 31 දින දක්වා එය භාවිතයට ගෙන නොතිබුණි.

(බ) අනුරාධපුර දිස්ත්‍රික් ව්‍යාප්ති කාර්යාලය අනුරාධපුර නගරයේ පිහිටා තිබුණු අතර කපු පැළ තවාන මිහින්තලය ප්‍රදේශයේ පිහිටා තිබුණි.ඒ ස්ථාන දෙක අතර දුර කිලෝ මීටර 14 ක් විය.ඒ හේතුවෙන් කපු පැළ ලබා ගත යුතු පාරිභෝගිකයින් අනුරාධපුර ව්‍යාප්ති කාර්යාලයට මුදල් ගෙවා කපු පැළ තවානට ගොස් කපු පැළ මිලදී ගැනීමට අතිරේක ක්‍රියාමාර්ගයක් සහ වියදමක් දැරිය යුතු බව නිරීක්ෂණය විය.

ඩබලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

12. විගණකාධිපති වාර්තාවේ සඳහන් අඩුපාඩු නිවැරදි කරගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග.

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කර ඇති විගණකාධිපති වාර්තාවේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් සංස්ථා පාර්ශවයෙන් අදහස් දැක්වීම්, ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව දැනුම්දීම.

1.2 (අ) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇති රු.167,815,472/= ක කජු මද විකුණුම් වටිනාකම ඊට අදාල මූලාශ්‍ර ලේඛන යොදාගෙන ඒ මත පදනම්ව ගිණුම්ගත කරන ලද්දක් බැවින් එය නිවැරදි විකුණුම් අගය වේ. සංස්ථාවේ අලෙවි අංශය මඟින් සපයාගෙන ඇති ලේඛනවලට අනුව මෙහි ඉදිරිපත් කර ඇති කජු මද විකුණුම් වටිනාකම ද ඊට සමාන විය යුතු නමුත් අදාල ලේඛන පිළියෙල කිරීමේදී සිදුවී ඇති දෝෂ සහගත තත්ත්වයක් හේතුකොට ගෙන එම අගය මෙහි සඳහන් පරිදි වෙනසකට භාජනය වී තිබිය හැකිය. ඒ අනුව මීට පෙර ද සඳහන් කළ පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කජු මද විකුණුම් අගය නිවැරදි අගය වන බැවින් අතිරික්ත විකුණුම් වටිනාකමක් ගිණුම්ගත වී නොමැත. කෙසේ නමුත් අලෙවි අංශය මඟින් ඉදිරිපත් කර ඇති විකුණුම් වාර්තාවේ ඇතුළත් දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ආ) එකඟ වෙමි.

මෙම විගණන ඡේදයේ සඳහන්ව ඇති 2023 වර්ෂය අග කජු මද තොගය රු.6,985,467/= කින් අධි ගණනය වී තිබීමේ දෝෂය, 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පූර්ව වර්ෂය ගැළපීමක් ලෙස නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 (ඇ) එකඟ වෙමි.

මෙහි සඳහන් පරිදි ලෙජරයේ ඉඩම් ගිණුමට දෝෂ සහගතව හර කර ඇති රු.513,912/=ක වටිනාකම සම්බන්ධයෙන් සිදු කළ යුතු නිවැරදි කිරීම්, ප්‍රවර්තන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඊට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ඇ) පහත අදහස් දක්වමි.

ණය සහන කාලසීමාව ඉක්මවූ වෙළෙඳ ණයගැති ශේෂ කඩිනමින් අයකරවා ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

එසේම මෙම විගණන නිරීක්ෂණයේ දැක්වෙන පරිදි අදාල වෙළෙඳ ණයගැති ශේෂයෙහි ඇතුළත්ව ඇති රු. 1,474,410/= ක ණයගැති ශේෂය (ලිසල එන්ටප්‍රයිසස් ආයතනය) අයකරවා ගැනීමට දීර්ඝ කාලයක් පුරා ගත් උත්සාහය ව්‍යර්ථ වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන එම ණයගැති ශේෂය අයකරවා ගැනීමට සඳහා මෙම ණයගැති ආයතනයට එරෙහිව අදාල නීතීමය ක්‍රියාමාර්ගවලට ප්‍රවේශවීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගනිමින් ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

1.2 (ඉ) පහත අදහස් දක්වමි.

මෙම විගණන ඡේදයේ සඳහන් රු. 9,466,200/=ක ණය වටිනාකම, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අයකරවා ගැනීමට දැඩි උත්සාහයක් දැරූ නමුත් එය ව්‍යර්ථ විය. මෙම ණය වටිනාකම නැවත අයකරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දිගින් දිගටම සංස්ථාවේ විගණන කමිටු රැස්වීම්වලදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

එහිදී දැනට ක්‍රියාත්මක නොවන රජයේ අමාත්‍යාංශයකින් ලැබිය යුතුව පවතින මෙම ණය මුදල සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීමට නිර්දේශ වූ අතර, මේ සම්බන්ධයෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අදාල ලිපිය යැවීමට කටයුතු කරන ලදී.

ඉහත සඳහන් ලිපිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ප්‍රතිචාර ලිපිය අවශ්‍ය උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් සංස්ථාවේ විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, ඒ අනුව මෙම ණය මුදල අයකරවා ගැනීමේ කටයුතු සඳහා, මෙවැනි දැනට ක්‍රියාත්මක නොවන රජයේ අමාත්‍යාංශවල වත්කම් පැවරීම සිදුකර ඇති රජයේ අමාත්‍යාංශය වන මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යැවීමට තීරණය කරන ලදුව අදාල ලිපිය එම අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කරන ලදී.

ඉහත පරිදි යවන ලද ලිපිය සඳහා මෙතෙක් වන මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ප්‍රතිචාර ලැබී නොමැති හෙයින් ඊට අදාලව 2024.09.05 දිනැති සිහිකැඳවීමේ ලිපියක් ද යැවීමට කටයුතු කර ඇති අතර, එම ප්‍රතිචාර දැක්වීම් ලද වහාම ඊට අනුරූපව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.

1.2 (ඊ) පහත අදහස් දක්වමි.

දැනට සංස්ථාව වෙත අයවීමට පවතින එහෙත් හානිකරන අලාභ වෙන්කිරීමක් සිදුකර නොමැති ද්‍රව්‍යාත්මක ණයගැති ශේෂ සම්බන්ධයෙන් ද අවධානය යොමු කර වර්තමාන හානිකරන අලාභ වෙන්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එම ගැලපීම් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල පරිදි ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 (උ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් එළුවන්කුලම වතුයායේ පවතින තේක්ක ගස් 4,253ක ප්‍රමාණය තක්සේරු කිරීමේ කටයුතු මේවනවිට අවසන් කර ඇති අතර, 2023.03.27 වන දිනට එම තක්සේරුගත අගය රු. මිලියන 244.337 කි. කෙසේ නමුත්, එළුවන්කුලම වතුයායේ නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති හෙයින් එම තේක්ක ගස්වල තක්සේරු වටිනාකම සංස්ථාවේ ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමේ හැකියාවක් නොමැත. අදාල වතුයායේ නීතිමය අයිතිය පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ වූ වහාම මීට අදාල ගැලපීම් ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 (ඌ) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණයේ දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂයට අනුරූපිව මාසිකව රු. 100,000/=ක් බැගින් වන සේ ආයෝජනයක් සිදුකිරීම සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබාගත් අතර, ඒ අනුව අදාල අනෙකුත් අනුමැතීන් ද ලබා ගනිමින් 2024.11.30 දින වනවිට රු.400,000/=ක මුදලක් විෂයගත කරුණට අදාලව ඉතිරි කිරීමේ ගිණුමක ආයෝජනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති කරුණුවලට අනුව, ඉහත ඉතිරි කිරීමේ ගිණුමට මුදල් රැස්වන ආකාරයට අනුව එම මුදල්වලින් යම් කොටසක් වැඩි පොලී ආදායමක් ලැබෙන සේ ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

1.2 (එ) එකඟ වෙමි.

මෙහි සඳහන් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් වන සංසන්දනයන් හා වියදම් පිළිබඳ විශ්ලේෂණයන් ප්‍රවර්තන වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2.(ඒ) එකඟ වෙමි.

මෙහි සඳහන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ද ඇතුළු සංස්ථාවේ සියලු වත්කම් නැවත තක්සේරු කිරීමේ කටයුතු නැතහොත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු මේ වනවිට සිදුකරගෙන යනු ලබන අතර, පාලනාධිකාරිය විසින් තීරණය කර ඇති පරිදි මුලින්ම සිදුකරනු ලබන්නේ සංස්ථාවේ මෝටර් වාහන ප්‍රත්‍යාගණන කිරීමේ කටයුතු වේ.

සංස්ථා ප්‍රධාන කාර්යාලයේ හා දිවයිනේ විවිධ ප්‍රදේශවල පවතින සංස්ථාවේ බාහිර කාර්යාලවල සංස්ථාව සතු මෝටර් වාහන 101ක ප්‍රමාණයක් පවතින අතර, තක්සේරුකරුවන්ට මතුවී ඇති ප්‍රායෝගික ගැටළු කිහිපයක් හේතුකොටගෙන ප්‍රත්‍යාගණනය කළ නොහැකිව පවතින මෝටර් වාහන 10 ක් හැරුනුකොට අනෙක් සියලුම මෝටර් වාහනවල (එනම් මෝටර් වාහන 91 ක) ප්‍රත්‍යාගණන කටයුතු මේවනවිට නිම කර ඇත. හැකි ඉක්මණින් අදාල ප්‍රායෝගික ගැටළු විසඳා ගනිමින් ඉතිරි මෝටර් වාහනවල ද ප්‍රත්‍යාගණන කටයුතු ද සම්පූර්ණ කර අදාල ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

ඉන්පසුව මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන ආකාරයට අනුව ක්‍රමිකව මෝටර් වාහනවලට අතිරේකව අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු හා එම ප්‍රත්‍යාගණන ප්‍රතිඵල ගිණුම්ගත කිරීමේ කටයුතු ද සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

1.2 (ඔ) එකඟ වෙමි.

මෙහි සඳහන් පරිණත කඳු වගාවේ හා පොල් වගාවේ පිරිවැයට සම්බන්ධ සැසඳුම් පිළිබඳ හෙළිදරව් කිරීම්, ප්‍රවර්තන වර්ෂයේ සිට (එනම් 2024 වර්ෂයේ සිට) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 (ඕ) පහත අදහස් දක්වමි.

මෙම සංස්ථාව පිහිටුවීමේදී ඊට අදාල වූ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් සංස්ථාව පිහිටුවීමේ අරමුණුවලට අනුව කඳු මද හා කඳු පැළ අලෙවි කිරීම් වැනි වාණිජ ක්‍රියාකාරකම්වලට අතිරේකව දිවයිනෙහි කඳු වගා ව්‍යාප්තිය හා කඳු වගාවේ හා පොදුවේ කඳු කර්මාන්තයේ කටයුතුවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු පර්යේෂණ හා සංවර්ධන කටයුතු යන සේවා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වගකීම ද සංස්ථාව වෙත පැවරී ඇත.

ඉහත සඳහන් කළ පරිදි සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාත්මක වන ව්‍යාප්ති සහ පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වෙනමම ආදායම් හා වියදම් ගිණුමක්

පිළියෙල නොකරන අතර, වාර්ෂිකව එම පිරිවැය මධ්‍යස්ථානයන්ට අදාල ද්‍රව්‍යාත්මක අගයකින් යුතු පිරිවැය ද සංස්ථාවේ වාණිජ ක්‍රියාකාරකම්වලට අදාල ලාභ මධ්‍යස්ථානවලට අදාල පිරිවැය සමඟ ඒකාබද්ධ කර ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි. සංස්ථාවේ සේවා ක්‍රියාකාරකම්වලට අදාල පිරිවැය ඉහත පරිදි ගිණුම්ගත කරනු ලැබුව ද එම සේවා සැපයීම් මඟින් පොදුවේ ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ මූල්‍ය අගයකින් මැනිය නොහැකි බැවින් ඒවා ගිණුම්ගත කිරීමක් සිදුකළ නොහැකි හෙයින් මෙම විගණන නිරීක්ෂණයේදී එම තත්ත්වය සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම වැදගත් වන බව සඳහන් කළයුතු වේ. කෙසේ නමුත් සංස්ථාවේ විකුණුම් හා අනෙකුත් ආදායම් තවදුරටත් ඉහළ නංවා ගනිමින් හා වියදම් නිසි පරිදි කළමනාකරණය කර ගනිමින් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

ඉහත ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2022 වර්ෂයේදී සංස්ථාව විසින් රු. මිලියන 14.471 ක ශුද්ධ ලාභයක් උපයා ඇති අතර, සමාලෝචිත වර්ෂයේදී ද ශුද්ධ ලාභයක් ඉපයීමට අපේක්ෂා කළ ද කපුු පැළ අලෙවි ආදායමෙන් බහුතර කොටස ප්‍රවර්තන වර්ෂය තුළදී උපලබ්ධි නොවීම හරහා එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. කෙසේ නමුත් 2022 වර්ෂයට පෙර වර්ෂවලට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ අලාභය සැලකිය යුතු වටිනාකමකින් අඩුකර ගැනීමට සංස්ථාව මඟින් කටයුතු කර ඇත.

එසේම විෂයගත කරුණ සම්බන්ධයෙන් 2024.10.24 වන දින පැවති විෂයභාර අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡාවට භාජනය විය. එහිදී සංස්ථාවේ වාණිජ ක්‍රියාකාරකම් හා සේවා ක්‍රියාකාරකම් සඳහා වෙන් වෙන් වශයෙන් ලාභාලාභ/ආදායමට වැඩි වියදම ගණනය කර ඉදිරිපත් කළ හැකි වන සේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා වූ අතර, දැනට භාවිතා කරනු ලබන ගිණුම් ක්‍රමවේදය වෙනුවට එම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යොමුවීමට අවශ්‍ය අධ්‍යයනයන් සිදුකරමින් පවතී.

2.2.2 (අ) පහත අදහස් දක්වමි.

මේවනවිට අදාල ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කරගෙන යනු ලබන අතර, සැලකිය යුතු වර්ෂ ගණනක ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමට පවතින බැවින් ඒ සඳහා ද්‍රව්‍යාත්මක කාලසීමාවක් ගතවේ. ඒ අනුව අදාල කටයුතු සම්පූර්ණ කර එම ආදායම් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

එම ආදායම් බදු වාර්තාවලට අනුව රජයට ගෙවිය යුතු ආදායම් බදු අගයක් පැවතියහොත් මෙහි සඳහන් රු. 779,483/= ක රඳවාගත් බදු වටිනාකම ඊට එරෙහිව හිලව් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 (ආ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් රු.1,934,310/= ක උපචිත විගණන ගාස්තුව මේවනවිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමට කටයුතු කර ඇත.

2.2.2 (ඇ) පහත අදහස් දක්වමි.

මෙම නිරීක්ෂණය යටතේ දැනට නීතිමය අයිතිය සංස්ථාව වෙත පවරාගෙන නොමැති සංස්ථාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම්වල මුළු අක්කර ගණන 11513 ක් ලෙස සඳහන් වුවත්, මීට පෙර මෙම වාර්තාවේ අංක 1.4.3 (ආ) යටතේ සඳහන් කළ පරිදි, පවත්වාගෙන යාම අනර්ථික ලෙස හඳුනා ගන්නා ලද නාලන්ද (අක්කර 135) හා විලව්විය (අක්කර 25) යන වතුයායන්/බීජ උද්‍යාන මේ වනවිට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලීය තීරණය යටතේ අදාල හිමිකාරත්ව ආයතන වෙත නැවත පවරා දීමට කටයුතු කර ඇති බැවින් දැනට සංස්ථාව වෙත නීතිමය අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොමැති ඉඩම්වල සංශෝධිත අක්කර ප්‍රමාණය 11353 කි. (11513 – 160) මෙම සංශෝධිත ඉඩම් අක්කර ප්‍රමාණය සම්බන්ධයෙන් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අනුමැතිය ලබාගෙන ඇති අතර, අදාල සංශෝධිත ඉඩම් අක්කර ප්‍රමාණය පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ.

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	අක්කර ප්‍රමාණය
1. එළුවන්කුලම - අදියර I	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	212
2. එළුවන්කුලම - අදියර II	රජය සතු	පුත්තලම	වනාතවිල්ලුව	407
3. ආච්චිගේවත්ත	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	පුත්තලම	වනාතවිල්ලුව	961
4. කමන්දළුව	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	පුත්තලම	රස්නායකපුර	548
5. හාඩි	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	මඩකලපුව	වාලච්චේන	365
6. සුදුවතුර-ආර	රජය සතු (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව)	මොණරාගල	මොණරාගල	200
7. මහඔය	රජය සතු (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව)	අම්පාර	මහඔය	81
8. මාන්කර්නි	රජය සතු	මඩකලපුව	කෝරලේපත්තුව උතුර	1075

වතුයාය / බීජ උද්‍යානය	අයිතිය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	අක්කර ප්‍රමාණය
9. කොණ්ඩච්චි	රජය සතු	මන්නාරම	මුසලි	6498
10. තිරියාය	රජය සතු	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල	27
11. පුනරින්	රජය සතු	කිළිනොච්චිය	පුනරින්	479
12. වෙල්ලන්කුලම	රජය සතු	මන්නාරම	බටහිර මාන්තායි	500
එකතුව (අක්කර)				**11,353**

ඉහත සඳහන් පරිදි දැනට ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් භුක්ති විඳිනු ලබන රජයට හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල නිර්මය අයිතිය පවරා ගැනීම වෙනුවෙන් ඒවායේ මැනුම් කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය රු. මිලියන 21.348 ක ප්‍රතිපාදන මෙම සංස්ථාව වෙත ලබාදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් මේවනවිට එකඟතාවය පළකර ඇත.

ඒ අනුව මෙම වසරේ ඉදිරි කාලසීමාව තුළදී හෝ 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළදී මැනුම් කටයුතු ආරම්භ කිරීමේ හැකියාව පවතින අතර, එම කාර්යය සඳහා වන මැනුම් නියෝග ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා අදාල ඉඩම් පවතින ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු වේ.

එසේම මේවන විට සංස්ථාව මඟින් භුක්ති විඳිනු ලබන, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම් සම්බන්ධයෙන් 1999 – 2009 කාලසීමාවට අදාල සියළු බදු මුදල් එම කොමිෂන් සභාව වෙත ගෙවා ඇති අතර, අදාල ඉඩම් මැනුම් කිරීමෙන් පසු මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් මැනුම් සැලැස්ම ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රවර්තන වර්ෂය තෙක් හිඟ බදු මුදල් ද ගෙවීමට කටයුතු කර එම ඉඩම්වල බදු ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ හැකිය.

2.3 (අ) පහත අදහස් දක්වමි.

සංස්ථාවේ වතුයායන් හා බීජ උද්‍යානවල පවතින කජු ගස් අංකනය කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර, ඒ සඳහා සැලකිය යුතු කාලසීමාවක් ද ගතවේ. සංස්ථාවේ මූල්‍ය ප්‍රතිපාදනවල සීමිත බව හා පවතින ශ්‍රම සම්පතෙහි සීමිත බව හේතුකොටගෙන එම කාර්යය සම්පූර්ණ කිරීම ප්‍රායෝගිකව අපහසු වේ.

කෙසේ නමුත්, පවතින ප්‍රතිපාදන යටතේ ගස් අංකනය කිරීමකින් තොරව, වතුයායන් හි කාර්ය මණ්ඩලය යොදා ගනිමින් සංස්ථාවේ සංස්ථාවේ සියලුම වතුයායන් හා බීජ උද්‍යානවල පවතින කජු ගස් හා පොල් ගස් පිළිබඳ මූලික සංගණන කටයුතු 2024.10.31 දින වනවිට නිම කරන ලද අතර, ඒ අනුව අදාල සංගණන තොරතුරු සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා කිරීම් ඉදිරියේදී සිදුකරනු ලැබේ.

2.3 (ආ) පහත අදහස් දක්වමි.

සංස්ථාවේ වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ කජු මද නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු පවත්වාගෙන යාමේදී ඒ සඳහා දැරීමට සිදුවන බැංකු ගාස්තු, ලිපිද්‍රව්‍ය වියදම්, දුරකථන හා අන්තර්ජාල වියදම් යනාදිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී එම මාර්ගගත අලෙවි කටයුතු මඟින් උපයාගත හැකි ලාභය පහළ මට්ටමක පවතින බැවින් මාර්ගගත අලෙවි කටයුතු සිදුකරනු ලබන්නේ සීමාසහිතව වන අතර, සංස්ථාවේ අලෙවිසැල් මඟින් කජු මද නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළුවක් නොමැති හෙයින් ද, එමඟින් ඉපයිය හැකි ලාභය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බැවින් ද ප්‍රමුඛතාවය ලබාදී ඇත්තේ අලෙවිසැල් මඟින් කජු මද නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වේ.

2.3 (ඇ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් ඉතිරි කිරීමේ ගිණුමේ පවතින්නේ සංස්ථාවේ කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය වෙනුවෙන් විෂයභාර අමාත්‍යාංශය වෙතින් ලැබී ඇති නමුත් එදිනට වැය කර නොමැති මූල්‍ය ප්‍රතිපාදන වේ.

සමාලෝචිත වර්ෂය තුළදී ඉහත කී ව්‍යාපෘතියේ කටයුතු සඳහා දිගින් දිගටම අදාල මූල්‍ය ප්‍රතිපාදන යොදා ගැනීම සිදුකරන ලද බැවින් වෙනයම් ආයෝජනවල එම මුදල් යෙදවීමේ හැකියාව සීමිත විය. මේවනවිට මෙම ප්‍රතිපාදනවලින් සැලකිය යුතු අගයක් අදාල ව්‍යාපෘතියේ කටයුතු සඳහා වැය කර ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේ අවසානය වනවිට අදාල ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කිරීමට නියමිතව පවතී.

2.3 (ඈ) පහත අදහස් දක්වමි.

මෙම වාර්තාවේ ඉහත අංක 1.2 (ඉ) යටතේ සඳහන් කළ පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් මෙම සංස්ථාව වෙත ලැබිය යුතු රු. 9,466,200/= ක ණය මුදල නැවත අයකරවා ගැනීම සම්බන්ධයෙන් මේවනවිට මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත යවා ඇති ලිපිය සඳහා ලැබෙන ඉදිරි ප්‍රතිචාරවලට අනුව මේ යටතේ සඳහන් වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතුව

පවතින ණය වටිනාකම හා පොලිය ගෙවා නිදහස් කළයුතු ආකාරය සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ඉ) පහත අදහස් දක්වමි.

කජු වගා කිරීම, පිරිසැකසුම් කිරීම සහ අලෙවි කිරීම යන සියලු කාර්යයන් සම්බන්ධයෙන් ස්ථාපනය කර ඇති එකම රාජ්‍ය ආයතනය වශයෙන් අංක 60/7 හා 1973.05.25 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව එම කාර්යයන්ට අදාල ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් විෂයභාර ගරු අමාත්‍යතුමා වෙත අදාල තොරතුරු හා උපදෙස් ලබාදීම ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් සිදුකළ යුතු වේ.

ගරු අමාත්‍යතුමා වෙත අදාල තොරතුරු හා උපදෙස් ලබාදීමේදී ආයතන ධුරාවලියේ ඉහළින්ම පවතින ආයතනය වන විෂයභාර අමාත්‍යාංශය (වර්තමානයේදී වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය) මඟින් අදාල තොරතුරු සංස්ථාව මඟින් ඉල්ලුම් කරනු ලබන අතර, සංස්ථාව මඟින් එම තොරතුරු ලබාදෙනු ලැබේ.

ඊට අමතරව පැන නඟිනු ලබන හදිසි, විශේෂ හා අනෙකුත් විෂයානුබද්ධ කරුණුවලදී විෂයභාර අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන රැස්වීම්වලදී විෂය සම්බන්ධ නිලධාරීන් විසින් ඔවුන්ගේ අදහස්, අදාල තොරතුරු හා විශේෂඥ මත ඉදිරිපත් කරනු ලැබේ.

එසේම කජු සංස්ථාව විසින් ස්වකීය සිද්ධි අධ්‍යයනයේදී හඳුනාගනු ලබන, රාජ්‍ය මැදිහත්වීම් අවශ්‍ය ගැටළුසහගත කරුණුවලදී සහ කජු සංස්ථාව විසින් මැදිහත්විය යුතු එහි මූලික පරමාර්ථවලින් පරිබාහිර කරුණුවලදී ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙතින් ඉල්ලීමක් සිදුකර ලැබෙන අනුමැතියට අනුව අදාල කටයුතු සිදුකරනු ලැබේ.

ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් කජු වගාව, කජු වගාව ආශ්‍රිතව පැතිරෙන රෝග, පලිබෝධ නාශක, පොහොර හා කජු වැවිලි ක්ෂේත්‍රයට අදාලව දැනට නිර්මාණය වී ඇති හා ඉදිරියේදී නිර්මාණය විය හැකි ගැටළු හා අභියෝගවලට මුහුණදීමට හා ඒවාට විසඳුම් සොයා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබේ.

ඊට අමතරව කජු පිරිසැකසුම් කටයුතු හා අලෙවි කටයුතුවලට අදාල සියලුම පර්යේෂණ මෙම සංස්ථාවේ තත්ත්ව සහතික කිරීමේ නිලධාරීගේ මැදිහත්වීමෙන් සංස්ථාවේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේදී සිදුකරනු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අගය එකතුකිරීමේ කජු නිෂ්පාදන රාශියක් වෙළෙඳපොලට හඳුන්වාදීමට හැකිවී ඇත.

එසේම කජු අලෙවිකරණය වැඩිදියුණු කිරීමේ පරමාර්ථයෙන් ලෝක වෙළෙඳපොලේ තත්ත්වයන් විමර්ශනය කරමින් කජු සංස්ථාව සඳහා වෙළෙඳ සන්නාමයක්, (Trade mark) උද්යෝගී පාඨයක් (Slogan) සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සැසඳෙන පරිදි ඇසුරුම් ආකෘති සකස් කිරීමක් සිදුකර ඇති අතර, වෙළෙඳ සන්නාමය හා උද්‍යෝගී පාඨය ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා අදාල ලේඛන මේවනවිටත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත යොමු කර ඇත.

තව ද, ශ්‍රී ලංකා කජු සංස්ථාවේ එක් එක් අංශය යටතේ ගැනෙන තොරතුරු විධිමත් ලෙස ඒකරාශී නොවීමේ ගැටළු හේතුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් වරින්වර සිදුකරන විමසීම් සඳහා සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. මෙම දුර්වලතාවය හඳුනාගෙන විෂයභාර අමාත්‍යාංශය වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ එක්ව තොරතුරු ඒකරාශී කර ජාලගත කිරීමේ කටයුතු මේවනවිට ආරම්භ කර ඇත.

එමෙන්ම මේවනවිට, අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනය සමඟ ආයතනික මට්ටමින් කටයුතු කිරීම ආරම්භ කර ඇති අතර, එම ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගනිමින් විෂයභාර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහනකට මෙම සංස්ථාව සම්බන්ධ වී ඇත.

එමෙන්ම දිවයින පුරා කජු ව්‍යාප්තිය බහුල ප්‍රදේශවල විශේෂයෙන්ම ස්ථානගත වී ඇති කජු පිරිසැකසුම් මධ්‍යස්ථාන අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා, යම්කිසි පිරිසැකසුම් ආයතනයක් විසින් ලෙලි කජු දේශීය පරිභෝජනය සඳහා හෝ TIEP (Temporary Importation for Exports) ක්‍රමය යටතේ අගය එකතු කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා වෙනත් රටකින් ලෙලි කජු තොග ආනයනය කිරීමට ඉල්ලීමේදී ඉහත දක්වා ඇති පරිදි එම ආයතනවල ආනයන හැකියාව හා පිරිසැකසුම් ධාරිතාවය පිළිබඳ නිර්දේශ ලබාදීමේ වගකීම අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත විධිමත්ව පවරා ඇත.

ඒ අනුව එලෙස ලෙලි කජු තොග ආනයනය සඳහා පිරිසැකසුම්කාර ආයතන ඉදිරිපත් වන අවස්ථාවලදී එම පිරිසැකසුම් මධ්‍යස්ථානවල/කර්මාන්තශාලාවල ධාරිතාවය හා ආනයන ශක්‍යතාවය සම්බන්ධයෙන් මෙම සංස්ථාව මඟින් නිර්දේශ ලබාදීමේ වගකීම ඉටුකර ඇත.

එසේම අන්තර්ජාතික වෙළෙඳපොලට පිවිසීම සඳහා ජාත්‍යන්තර පිරිවිතර හා ප්‍රමිත අවශ්‍යතා සපුරාලිය යුතු අතර, ශ්‍රී ලංකා කජු සංස්ථාව මේවනවිට එයින් බහුතරයක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

මීට පෙර ද සඳහන් කළ පරිදි වෙළෙඳ සන්නාමය හා උද්‍යෝගී පාඨය සහ ජාත්‍යන්තර ප්‍රමිතවලට සැසඳෙන ඇසුරුම් ආකෘති සංස්ථාව මඟින් සකස් කර ඇති අතර, පිරිසැකසුම්කරණය සඳහා වන ප්‍රමිත ලබා ගැනීමට සිදුකළ යුතු පර්යේෂණ හා යටිතල පහසුකම් සකස් කිරීම සඳහා යෝජනා හා ව්‍යාපෘති වාර්තා විෂයභාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම කටයුතු සිදුකිරීම සඳහා විෂයභාර අමාත්‍යාංශයෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ අනුව මේවනවිට මෙම සංස්ථාව මඟින් ඊට අදාල කටයුතු ද මේවනවිට ආරම්භ කර ඇත.

තව ද, ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවීමේ එක් මූලික පරමාර්ථයක් වනුයේ කජු වගාව දිවයිනෙහි ව්‍යාප්ත කිරීමයි. ඒ සඳහා රජයේ කෘෂි සහනාධාර ප්‍රතිපත්තිය යටතේ විෂයභාර අමාත්‍යාංශය මඟින් ලබාදෙන ප්‍රතිපාදන මඟින් හා කජු වගා සහනාධාර වැඩසටහන හා කජු කෘෂි අපනයන ගම්මාන ව්‍යාපෘතිය තුළින් මෙම සංස්ථාවට අයත් පැළ තවාන්වල නියමිත ක්‍රියා පටිපාටීන් අනුගමනය කර නිෂ්පාදනය කරනු ලබන ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු බද්ධ හා බීජ කජු පැළ ලබාදීම මඟින් මෙන්ම යහපත් කෘෂිකර්ම උපචාරයන් අනුගමනය කරමින් කජු පැළ සිටුවීම පිළිබඳ අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමට අදාල ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් මෙම කජු වගා ව්‍යාප්ති කාර්යය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව සක්‍රීය ලෙස දායක වේ.

මීට අමතරව Dilma Conservation වැනි ධරණීය කෘෂිකර්මය සඳහා අතහිත ලබා දීම අරමුණු කරගත් ආයතන සමඟ ඒකාබද්ධව කජු වගා ව්‍යාප්තිය සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ සහන මිලට කජු පැළ ලබාදීම මෙන්ම නොමිලයේ විශේෂඥ දැනුම ලබාදීම මෙම සංස්ථාව මඟින් සිදුකරනු ලැබේ.

ඉහත කරුණු දැක්වීම්වලට අනුව මෙම සංස්ථාව පිහිටුවීමේදී අදාල වූ අංක 60/7 හා 1973.05.25 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරයාව දැනුවත් කිරීම හා ඊට අදාල උපදෙස් ලබාදීම, කජු නිෂ්පාදන පිරිසැකසුම් කිරීම, අලෙවිය හා අපනයනය දියුණු කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් හා එක්ව කටයුතු කිරීම සහ විමර්ශන හා පර්යේෂණ කටයුතු යන කාර්යයන් සැලකිය යුතු මට්ටමකින් සංස්ථාව මඟින් ක්‍රියාත්මක කර ඇති බව සඳහන් කළ හැකිය.

2.3 (ඊ) පහත අදහස් දක්වමි.

කජු අස්වනු සමයේ පවතින අහිතකර කාලගුණික හා දේශගුණික තත්ත්වයන්, දැඩි වන අලි හානි, කෘමි හානි, වතුයායන් හි ඉතා පැරණි කජු ගස් විශාල සංඛ්‍යාවක් පැවතීම යනාදී කරුණු හේතුකොටගෙන සමාලෝචිත කාලසීමාවට අයත් සමහර වර්ෂවලදී අපේක්ෂිත කජු අස්වැන්න අදාල වතුයායන් තුළින් එක්රැස් කර ගැනීමේ දුෂ්කරතා නිර්මාණය වී ඇති හෙයින් කජු නිෂ්පාදනය සමහර වර්ෂවලදී අඩුවී ඇත.

කෙසේ නමුත් සංස්ථාවේ වතුයායන් මඟින් සිදුකරන ලෙලි කජු නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමේ අරමුණින් සංස්ථාවේ පුත්තලම ආච්චිගේවත්ත වතුයායේ පැවති පැරණි කජු වගාව සම්පූර්ණයෙන් ඉවත් කර එහි නව කජු වගාවක් සිදු කර ඇති අතර, ඉදිරි වර්ෂවලදී මෙම නව කජු වගාව තුළින් සතුටුදායක ලෙලි කජු අස්වැන්නක් ලබා ගැනීමට හැකි වේ.

එසේම කජු නිෂ්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා 2021 - 2023 කාලසීමාවේදී සංස්ථාවේ කොන්ඩච්චි වතුයාය තුළ අක්කර 420 ක භූමි කොටසක නව කජු වගාවක් සිදුකර ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේදී ද (එනම්, 2024 වසරේදී ද) කොන්ඩච්චි වතුයායේ අක්කර 330 ක නව කජු වගාවක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. එමෙන්ම ප්‍රවර්තන වර්ෂයේදී සංස්ථාවේ එළුවන්කුලම වතුයාය තුළ ද අක්කර 105 ක (මින් අක්කර 40 ක් 2023 වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කළ ද එම වගා කටයුතු ද ප්‍රවර්තන වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත වේ.) නව කජු වගාවන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබන අතර, මීට අමතරව එක්රැස් කරගත හැකි ලෙලි කජු අස්වනු ප්‍රමාණය ඉහළ නංවා ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂය තුළදී සංස්ථාවේ වෙල්ලන්කුලම හා පුනරීන් වතුයායන් තුළ දැඩි ලෙස කැළය වැවී තිබූ කජු වගාව සහිත අක්කර 100 ක ප්‍රමාණයක වල් මර්ධනය සිදුකිරීමට කටයුතු කරන ලද අතර, එමඟින් සාර්ථක ප්‍රතිඵල අත්වී ඇත.

එමෙන්ම, අතුරු භෝග වගා කටයුතු සඳහා පෞද්ගලික අංශයේ වැවිලිකරුවන්ට ඉඩම් බදුදීම මඟින් ඔවුන්ගේ සහාය ලබාගෙන ද වතුයායන් හි නව කජු වගාවන් සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, වගාව සඳහා උනන්දුවක් දක්වන පෞද්ගලික අංශයේ ආයෝජකයන් සමඟ විධිමත් පරිදි ගිවිසුම්ගතව ඔවුන්ගේ අරමුදල් භාවිතයෙන් ද නව කජු වගාවන් සඳහා යොමුවීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

2.3 (ඌ) පහත අදහස් දක්වමි.

රටෙහි පැවති විවිධ අර්බුදකාරී තත්ත්වයන් හේතුකොටගෙන හා සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වයට අනුව පසුගිය ආසන්න වර්ෂ 05 ක පමණ කාලයක් පුරා පොල් වගාවට අවශ්‍ය රසායනික පොහොර යෙදීම් සිදුකර නොමැති වීමෙන් පොල් අස්වනු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී තිබීම මෙම විගණන ඡේදයේ යටතේ සඳහන් කර ඇති කරුණු සඳහා හේතුවී ඇත.

කෙසේ නමුත් ප්‍රවර්තන වර්ෂයේ (එනම් 2024 වර්ෂයේ) මුල් කාර්තුවේදී පොල් වගාව සඳහා පොහොර යෙදීමට කටයුතු කරන ලද අතර, එමඟින් ඉදිරි වර්ෂවලදී පොල් අස්වනුවල සැලකිය යුතු වර්ධනයක් අපේක්ෂා කළ හැකිය. එසේම සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කමන්දළුව වතුයායේ අක්කර 25 ක නව පොල් වගාවක් ද සිදුකර ඇත.

2.3 (ඍ) පහත අදහස් දක්වමි.

<u>කජු පුහුලන්.</u>

මෙම සංස්ථාව මඟින් 2020 වර්ෂය දක්වා කජු පුහුලන්වලින් වයින් නිෂ්පාදනය කිරීමේ කටයුතු සිදුකර ඇති අතර, අවසන් වශයෙන් සංස්ථාව මඟින් වයින් නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ කරගත් නිෂ්පාදකයාගේ නිෂ්පාදන දෝෂයක් හේතුකොටගෙන මූලික වයින් නිෂ්පාදිතය පදම් වීමට තැබීමේදී එහි අධික ලෙස මණ්ඩි තැන්පත්වීමක් සිදුවී ඇත.

මෙම තත්ත්වය හේතුකොටගෙන අදාල වයින් නිෂ්පාදිතය සීඝ්‍රයෙන් පහළ ගොස් එය විනාකිරි බවට පත්වීමේ ලක්ෂණ පෙන්නුම් කළ හෙයින් අදාල වයින් නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කරන ලදුව එම දෝෂ මහහරවාගෙන නැවත වයින් නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලෙසට අදාල නිෂ්පාදකයා වෙත උපදෙස් ලබාදුන් නමුත් අදාල නිෂ්පාදිතය යථා තත්ත්වය ගැනීමට එම නිෂ්පාදකයා දිගින් දිගටම අපොහොසත් වූ හෙයින් වයින් නිෂ්පාදන කටයුතු නවතාලීමට සිදුවිය.

පසුව මෙම වයින් නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා හා ඊට අතිරේකව කජු පුහුලන් මඟින් ඇල්කොහොල් නිෂ්පාදන කිරීම සඳහා අවස්ථා කිහිපයකදීම වෙනත් නිෂ්පාදකයින්ගේ මැදිහත්වීමෙන් කටයුතු සිදුකළ ද පර්යේෂණ මට්ටමේදීම එම නිෂ්පාදිත අපේක්ෂිත තත්ත්වයෙන් බැහැර වූ බැවින් හා වෙනත් ප්‍රායෝගික ගැටළු නිර්මාණය වීමෙන් එම නිෂ්පාදන කටයුතු ද දිගින් දිගටම පවත්වාගෙන යාම අපහසු විය.

කෙසේ නමුත් මෙම කජු පුහුලන් ආශ්‍රයෙන් ඇල්කොහොල් නිෂ්පාදනය කිරීම සඳහා ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සංකල්ප පත්‍රිකාවක් විෂයභාර අමාත්‍යාංශය වෙත යොමු කිරීම සුදුසු වන බවට 2024.12.02 වන දින පැවති සංස්ථාවේ පර්යේෂණ හා කළමනාකරණ කමිටුවේදී තීරණය වූ බැවින් මේවනවිට අදාල සංකල්ප පත්‍රිකාව විෂයභාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

එසේම 2024.12.19 වන දින විෂයභාර අමාත්‍යාංශය මඟින් සිදුකරන ලද කැඳවීමකට අනුව කජු පුහුලන් මඟින් ඇල්කොහොල් ස්ප්‍රිතු නිෂ්පාදනය කිරීම සඳහා ඉදිරිපත් වී ඇති ආයෝජකයෙකු සමඟ සාකච්ඡාවක් පැවති අතර, එහිදී සාකච්ඡා කරන ලද කරුණුවලට අනුව අදාල ආයෝජකයාට විෂයගත කරුණට අදාලව ව්‍යාපාර යෝජනාවක් පිළියෙල කර එය විෂයභාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට දැනුම්දුන් අතර, එම නිෂ්පාදන සම්බන්ධයෙන් වෙළෙඳපොල තත්ත්වය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට එහිදී සංස්ථාවේ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

<u>කජු ලෙලි.</u>

කජු ලෙලි මඟින් දියර/තෙල් (Cashew Nut Shell Liquid - CNSL) නිස්සාරණය කිරීමේ යන්ත්‍රයක් සංස්ථාවේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ පවතින අතර, මීට සැලකිය යුතු කාලයකට පෙර එම යන්ත්‍රය මඟින් පර්යේෂණ මට්ටමෙන් අදාල කජු ලෙලි ඇසුරින් දියර/තෙල් නිපදවා ඇති අතර, අලෙවිය සඳහා ගැනුම්කරුවන් සොයා ගැනීම අපහසු වූ බැවින් එම නිෂ්පාදන කටයුතු නවතා දමා ඇත.

කෙසේ නමුත් දැනට කජු පිරිසැකසුම හරහා අපතයක් ලෙස ලැබෙන කජු ලෙලි බාහිර ගැනුම්කරුවන්ට විකිණීම මඟින් සංස්ථාව මඟින් ආදායම් උපයා ගන්නා අතර, ඉදිරියේදී කජු ලෙලි මඟින් ලබා ගන්නා දියර/තෙල් සඳහා වෙළෙඳපොලක් නිර්මාණය වුවහොත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර, අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.3 (එ) (ඒ) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් විදුලිජනක යන්ත්‍රය හා බොයිලේරුව ඉතා පැරණි ඒවා වුව ද එම යන්ත්‍ර වරින්වර අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කටයුතු සඳහා භාවිතා කරන ලද යන්ත්‍ර වන අතර, විවිධ ප්‍රායෝගික හේතූන් මත මේවායේ සමහර අලුත්වැඩියා කටයුතුවල යම් ප්‍රමාදයක් සිදුවී ඇත. ඉදිරියේදී මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ.

එසේම මීට පෙර මෙම වාර්තාවේ අංක 2.3 (උ) යටතේ සඳහන් කළ පරිදි කජු ලෙලි තෙල් සඳහා වර්තමාන වෙළෙඳපොල ඉල්ලුමක් නොමැතිවීම හේතුකොටගෙන මෙම කජු ලෙලිවලින් තෙල් නිපදවන යන්ත්‍රය භාවිතයට නොගෙන පවතින අතර, කෙසේ නමුත් ඉදිරියේදී වෙළෙඳපොල සාධක වෙනසකට භාජනය වුවහොත් අවශ්‍යතාවය පරිදි සේවා කටයුතු සිදුකර මෙම යන්ත්‍රය නැවත අදාල නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගැනීමේ හැකියාව පවතී.

2.3 (ඔ) පහත අදහස් දක්වමි.

කජු ක්ෂේත්‍රයේ පවතින එකම රාජ්‍ය ආයතනය වශයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත දිවයිනෙහි කජු වගාව, කජු ව්‍යාප්තිය, කජු පිරිසැකසුම, කජු පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනය, කජු අලෙවිකරණය යනාදී ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරමින් අදාල කාර්යයන් සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම පැවරී ඇත.

2020 හා 2021 වර්ෂයන් හිදී දිවයින පුරා පැතිර ගිය Covid – 19 වසංගත රෝග තත්ත්වය හමුවේ කජු ක්ෂේත්‍රයේ වගාකරුවන්, පිරිසැකසුම්කරුවන්, අලෙවිකරුවන් යනාදී විශාල පිරිසකට සිය ආදායම් අහිමි වී ගිය අතර, එසේ ආර්ථික වශයෙන් අපහසුතාවයට පත්වූ කජු ක්ෂේත්‍රය නියෝජනය කරන පුද්ගලයන් එම අපහසුතාවයන්ගෙන් මුදවා ගැනීම සඳහා කටයුතු කිරීමේ වගකීම ද මෙම සංස්ථාව වෙත පැවරී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කඩිනම් තීරණ ගැනීමේ අවශ්‍යතාවයක් මතුවිය.

මෙම තත්ත්වයට විසඳුම් ලබාදීම සඳහා අමාත්‍යාංශ ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී මෙම සංස්ථාවේ එවකට සිටි සභාපතිතුමියගේ ඉල්ලීම මත සහ එවකට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානවල සිදුකරන නිරීක්ෂණ චාරිකා කිහිපයකදී සිදුකරන ලද නිරීක්ෂණවල ප්‍රතිඵලයක් ද ලෙස සංස්ථාවට හා කජු ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන පිරිසැකසුම්කරුවන්ට පොදුවේ ප්‍රතිලාභ ලැබෙන පරිද්දෙන් මෙම විගණන නිරීක්ෂණයට පදනම් වූ කජු ඇසුරුම් යන්ත්‍රය හා තවත් කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතියක් (මෙම පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය සම්බන්ධයෙන් මෙම විගණකාධිපති වාර්තාවේ අංක 2.3(ඩ) යටතේ විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.) මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාව වෙත ලබාදීමට කටයුතු කරන ලදී.

සංස්ථාවේ කජු පිරිසැකසුම් කටයුතුවල අවසාන අගය එකතු කිරීමේ කටයුතු හා අවසාන ඇසුරුම් කටයුතු සිදුකරනු ලබන්නේ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ

වන බැවින් කජු ඇසුරුම් යන්ත්‍රය එම පරිශ්‍රයේ ස්ථාපනය කරන ලද අතර, කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ද නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කළ හැකි වුවත්, ක්ෂේත්‍රයේ පුද්ගලයන්ට වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි පරිද්දෙන්, දිවයිනෙහි කජු කර්මාන්තයේ කටයුතු වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි සංස්ථාවේ පිරිසැකසුම් මධ්‍යස්ථානයේ එම කජු පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතිය ස්ථාපනය කරන ලදී.

එමෙන්ම 2020 වර්ෂය අගභාගයේදී පමණ ඉදිරිපත් වූ 2021 වර්ෂයේ රාජ්‍ය අයවැය ප්‍රකාශනයට අනුව එවකට විෂයභාර රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මෙම සංස්ථාවේ මන්නාරම, කොන්ඩච්චි වතුයායේ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා රු.මිලියන 225 ක ප්‍රතිපාදන සංස්ථාව වෙත ලබාදෙන ලද අතර, එම රු. මිලියන 225 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 125 ක් කොන්ඩච්චි වතුයායේ 2021 වර්ෂය සඳහා වූ ව්‍යාපෘතිය යටතේ අක්කර 1000 ක භූමි කොටසක නව කජු වගාවක් සිදුකිරීම හා අනෙකුත් සංවර්ධන හා යටිතල පහසුකම් වෙනුවෙන් වෙන් කර තිබිණි.

ඒ අනුව වසර 03 ක කාලසීමාවක් තුළදී එම අක්කර 1000 ක භූමි ප්‍රමාණය තුළ ක්‍රමිකව නව කජු වගාව සිදුකර ලැබෙන අස්වනු ප්‍රමාණය සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදුකර, ඉහළ කාර්යක්ෂමතාවයෙන් යුතුව එම ලෙලි කජු නිෂ්පාදනවල පිරිසැකසුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරිසැකසුම් හා ඇසුරුම් යන්ත්‍රවල අවශ්‍යතාවය ද මෙම මිලදී ගැනීම්වලදී සැලකිල්ලට භාජනය කරන ලදී.

කෙසේ නමුත් Covid – 19 වසංගත රෝගී තත්ත්වය දීර්ඝ කාලයක් දිවයින පුරා පැවතීම හා ඉන්පසුව ඇතිවූ ආර්ථික අවපාත තත්ත්වය හේතුකොට ගෙන අදාල නව කජු වගාවන්වල කටයුතු නිසි ලෙස සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ අතර, ඒ අනුව ඉහත පරිදි මිලට යන්ත්‍ර මඟින් ද අපේක්ෂිත නිෂ්පාදිත ධාරිතාවයන් ළඟා කර ගැනීමට නොහැකි විය. මේ අනුව විෂයගත ඇසුරුම් යන්ත්‍රය සංස්ථාවේ වර්තමාන කජු නිෂ්පාදන ධාරිතාවයන්ට නොගැලපෙන හෙයින් එම ඇසුරුම් යන්ත්‍රය විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් භාවිතයෙන් උපරිම වෙළෙඳපොල මිල ගණනකට අලෙවි කර, එම මුදලින් සංස්ථාවේ වර්තමාන නිෂ්පාදන ධාරිතාවයට ගැලපෙන නව ඇසුරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ඉල්ලුම් කිරීම සඳහා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මේ අනුව ඉහත ඇසුරුම් යන්ත්‍රය අලෙවි කිරීම සඳහා සිදුකළ යුතු මූලික කටයුතු මේවනවිට ආරම්භ කර ඇති අතර, ඒ අනුව මූලික වශයෙන් ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් (NERD) අදාල යන්ත්‍රයේ වර්තමාන

වෙළෙඳපොල තක්සේරු වටිනාකම පිළිබඳ වාර්තාවක් ඉල්ලුම් කර ඇත. ඊට අතිරේකව අදාල ඇසුරුම් යන්ත්‍රයේ වර්තමාන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වාර්තාවක් ද ලබා ගැනීමේ කටයුතු ද සිදුකරමින් පවතින අතර, ඒ අනුව හැකි ඉක්මණින් මෙම ඇසුරුම් යන්ත්‍රය අලෙවි කිරීමේ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

2.3 (ඕ) පහත අදහස් දක්වමි.

<u>නල ළිං ප්‍රතිෂ්ඨාපනය හා ජල ටැංකි ඉදිකිරීම.</u>

මෙහි සඳහන් නල ළිං ප්‍රතිෂ්ඨාපන කටයුතු මේවනවිට අදාල පරිදි සම්පූර්ණ කර ඇත. කෙසේ නමුත් අදාල නල ළිං ප්‍රයෝජනයට ගැනීම සඳහා තවදුරටත් ඉදිකළයුතු ජල ටැංකි 04 න් එක් ජල ටැංකියක ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ඇත. තවත් ටැංකි 02 ක මූලික ඉදිකිරීම් අවසන් කර ඇති නමුත් ඒවායේ ජල ටැංකි ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකළයුතුව පවතී. අනෙක් ජල ටැංකියේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොමැති අතර, කෙසේ වෙතත් ප්‍රවර්තන වර්ෂයේ අවසානය වනවිට මෙම විෂයගත කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

<u>අලි වැට ඉදිකිරීම.</u>

මෙම විගණන ඡේදය යටතේ සඳහන් කොන්ඩච්චි වතුයාය වටා කිලෝමීටර් 26 ක දිගකින් යුතු අලි වැට ඉදිකිරීමේ කටයුතුවලට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුනු අතර, අදාල කටයුතුවල සිදුවූ ද්‍රව්‍යාත්මක ප්‍රමාදය හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී වරින් වර සිහිකැඳවීම් සිදුකළ ද එම කටයුතු සම්පූර්ණ නොවීය. සැලකිය යුතු දීර්ඝ කාලසීමාවකින් පසු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අදාල ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොමැති බවට දැනුම්දී එම කටයුතුවලින් ඉවත් විය.

ඒ අනුව දැනට සංස්ථාව මඟින්ම අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම ආරම්භ කර ඇති අතර, මේවනවිට විෂයගත ප්‍රසම්පාදන කටයුතු සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් අලි වැට ඉදිකිරීමට අදාල පිරිවිතරයන් සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත.

මේ අනුව ලංසු කැඳවීම සඳහා ප්‍රසිද්ධ කළයුතු පුවත්පත් දැන්වීම හා ලංසු ලේඛන පිළියෙල කර එම ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත්

කර ඇත. මෙම ප්‍රසම්පාදනයේ ඉතිරි කටයුතු ද කඩිනම්ව නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

<u>සංචාරක නිවාසය ඉදිකිරීම .</u>

මෙහි සඳහන් කොන්ඩච්චි සංචාරක නිවාසයේ වැඩ කටයුතුවලින් 80% ක් පමණ මේවනවිට නිම කර ඇති අතර, ප්‍රවර්තන වර්ෂයේ අවසානය වනවිට එම සියලු වැඩ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

<u>විදුලි බලය ලබා ගැනීම.</u>

කොන්ඩච්චි වතුයායේ දැනට ඉදිකෙරෙමින් පවතින සංචාරක නිවාසයේ ගොඩනැගිල්ලට හැර විෂයගත ව්‍යාපෘතිය යටතේ සැලසුම් කරන ලද අනෙකුත් සියලු ගොඩනැගිලි සඳහා විදුලි බලය ලබාගෙන ඇත. පෙර කී සංචාරක නිවාසය වයරින් කිරීමේ කටයුතු සිදුකිරීමට ඉතිරිව පවතින අතර, එම කටයුතු නිමකළ වහාම එම ගොඩනැගිල්ල සඳහා ද විදුලි බලය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

2.3 (ක) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණය යටතේ සඳහන් නිල නිවාස 07 ක ප්‍රමාණයෙන් මේව නවිට නිල නිවාස 04 ක ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, ඒ අනුව එම නිල නිවාස භාවිතයට ගනු ලැබේ.

එසේම මෙම ව්‍යාපෘතිය යටතේ නාලන්ද බීජ උද්‍යානය/වතුයාය පරිශ්‍රයේ මූලික ඉදිකිරීම් ආරම්භ කරන ලද නිල නිවාසයේ වැඩ කටයුතු නවතා දමා ඇති අතර, ඊට හේතුව වන්නේ තවදුරටත් පවත්වාගෙන යාම අනර්ථික වීම මත සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව නාලන්ද බීජ උද්‍යානය/වතුයාය එහි මුල් භිමිකාරත්වය දැරූ ඇල්කඩුව වැවිලි සමාගම වෙත නැවත පැවරීමට සංස්ථාව මඟින් කටයුතු කර තිබීමයි.

එමෙන්ම මොනරාගල හා දඹුල්ල යන ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද නිල නිවාස සම්බන්ධයෙන් අදාල භූමිවල ස්වභාවය අනුව ඉතිරි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර නැවත වරක් ඉංජිනේරු වාර්තා ලබා ගැනීම සඳහා යොමු වී ඇති අතර, ඒ අනුව එම කටයුතුවල යම් ප්‍රමාදයක් පවතී. අදාල ප්‍රමාදයන් මහහරවා ගනිමින් එම නිල නිවාසවල ඉදිකිරීම් කටයුතු ද හැකි ඉක්මණින් නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.3 (ග) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් නැදගමුව ඉඩමේ ඔප්පුව නිරවුල් කර ගැනීම සඳහා ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යවන ලද ලිපියට ප්‍රතිචාරිකව එම කාර්යාලයෙන් ඉල්ලුම් කරන ලද සියලු ලේඛන මේවනවිට යැවීමට කටයුතු කර ඇත. එසේම අදාල කටයුත්ත ඉටු කරවා ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් ද අඛණ්ඩව සිදුකරගෙන යනු ලැබේ.

2.3 (ච) පහත අදහස් දක්වමි.

මේවනවිට පුත්තලම පිරිසැකසුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ ඔප්පුව නිරවුල් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, ඒ අනුව අදාල පත්ඉරු යාවත්කාලීන කරවා ගැනීමේ කටයුතු ද අවසන් කර ඇත.

2.3 (ජ) පහත අදහස් දක්වමි.

මෙම ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂා කළ ද, මේ යටතේ උප ව්‍යාපෘති රාශියක් පැවතීම සහ එම උප ව්‍යාපෘතිවල ඇතුළත් කාර්යයන් වෙන් වෙන් වශයෙන් සැලසුම් කර, ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම යන කරුණු හේතුකොටගෙන අදාල ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කරනු ලැබූ කාලසීමාව ඉක්මවා යෑම සිදුවිය.

තව ද, 2022 වර්ෂය තුළදී ඇතිවූ ආර්ථික අර්බුදය සමඟ මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදමට වඩා සත්‍ය වශයෙන් දැරීමට සිදුවන වියදම ඉහළ යාමෙන් ඒ සඳහා විකල්ප ක්‍රමවේද සැකසීමටත්, නැවත සංශෝධිත ඇස්තමේන්තු පිළියෙල කිරීමටත් සිදුවූ අතර, විෂයගත ව්‍යාපෘතිය යටතේ පැවති ඉදිකිරීම් සඳහා අවශ්‍ය සිමෙන්ති, යකඩ වැනි ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟය ද මෙම ව්‍යාපෘතියේ මන්දගාමීත්වයට ඍජුවම හේතුවිය.

කෙසේ නමුත් ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ තවදුරටත් ජල ටැංකි ඉදිකිරීමේ කටයුතු හා කොන්ඩච්චි වතුයාය වටා අලි වැට ඉදිකිරීමේ කටයුතු නිම කිරීමේ කටයුතු ඉතිරිව පවතින අතර, මෙම වාර්තාවේ අංක 2.3 (ඕ) යටතේ එම කටයුතුවල වර්තමාන ප්‍රගතිය දක්වා ඇත.

2.3 (ට) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් විෂයගත කරුණට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර, මෙම විදුලි බල මණ්ඩලය වෙත සංස්ථාව මඟින් ලබාදී කොන්ඩච්චි වතුයායේ අක්කර 02 ක භූමි කොටසට විධිමත් ගිවිසුමක් යටතේ එම මණ්ඩලයෙන් බදු කුලී මුදලක් අයකරවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව දෙපාර්ශවය විසින් අදාල ගිවිසුම අත්සන් තැබීමට කටයුතු කරනු ලබන අතර, මේ අනුව විදුලි බල මණ්ඩලය වෙත ඉහත කී ඉඩම් කොටස පරිහරණය සඳහා ලබා දී ඇති සමස්ත කාලසීමාව සඳහාම බදු කුලී අයකරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ඩ) පහත අදහස් දක්වමි.

මෙම විගණන නිරීක්ෂණය යටතේ සඳහන් කර ඇති පිරිසැකසුම් යන්ත්‍රයේ සැපයුම්කරුට එරෙහිව මූලික නීතිමය කටයුතු ආරම්භ කර ඇත.

එසේම අදාල පිරිසැකසුම් යන්ත්‍ර පද්ධතියේ අන්තර්ගත ලෙලි කපු කැපීමේ යන්ත්‍ර කොටස හා කපු මද ශුද්ධ කිරීමේ යන්ත්‍ර කොටස මේ වනවිට පිරිසැකසුම් කටයුතු සඳහා සාර්ථක ලෙස භාවිතා කරනු ලබන අතර, එම කොටස් ද ඇතුළුව පද්ධතියේ අනෙක් යන්ත්‍ර කොටස් ද ස්වයංක්‍රීය පිරිසැකසුම් ක්‍රියාවලියකට සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.3 (ත) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් ආකාරයටම කමන්දළුව වතුයාය පරිශ්‍රය තුළ සිදුවෙමින් පවතින අනවසර වැලි කැනීම් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම පොලිසිය වෙත දැනුම්දීමට කටයුතු කර ඇතත්, ඉන් කිසිදු ප්‍රතිඵලයක් අත් නොවීය.

මෙම කමන්දළුව වතුයාය පිහිටි ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ පවතින ඉඩමක් වන බැවින් මෙම තත්ත්වය සම්බන්ධයෙන් එම කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ද අදාල දැනුවත් කිරීම් සිදුකරන ලද අතර, ඒ අනුව අදාල ශ්‍රී ලංකා කපු සංස්ථාව හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඒකාබද්ධව විෂයගත කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි නීතිමය පියවර ගැනීම සඳහා කරුණු සාකච්ඡා කර, ඊට අදාල කටයුතු ආරම්භ කර ඇත.

කෙසේ නමුත් මීට පෙර මෙම වාර්තාවේ අංක 2.2.2 (ඇ) යටතේ සඳහන් කර ඇති පරිදි නීතිමය අයිතිය ලබා ගැනීමේ පරමාර්ථයෙන් සංස්ථාවේ වතුයායන්/බීජ උද්‍යානවල ඉඩම්වල මැනුම් කටයුතු සම්පූර්ණ කිරීමේදී මෙම කමන්දළුව වතුයායේ

ඉඩම ද මැනීම සිදුකරන බැවින් අදාල අවස්ථාවේදී මෙම දැනට අනවසර වැලි කැනීම් සිදුකරන ඉඩම් කොටස ද සංස්ථාවට අයිති ඉඩම් කොටසක් බවට තහවුරු කරගත් පසු මෙම ගැටළුකාරී තත්ත්වය බොහෝදුරට නිරාකරණය කරගත හැකිවේ යැයි අපේක්ෂා කළ හැකිය.

2.3 (ද) පහත අදහස් දක්වමි.

2023 වර්ෂයේදී පැවති අධික වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් කජු මල් වියළි යාම, පරාගණය කරන කෘමි සතුන් විනාශ වීම යනාදී කරුණු 2023 වර්ෂයේ කජු අස්වැන්න අඩු වීම කෙරෙහි බලපෑ මූලික හේතු සාධක වශයෙන් දැක්විය හැකි වේ. මෙම තත්ත්වය කජු සංස්ථාවේ වතුයායන් සඳහා පමණක් නොව පොදුවේ දිවයිනෙහි අනෙකුත් වතුයායන් සඳහා ද ඒ ආකාරයෙන්ම බලපා තිබිණි.

එසේම සංස්ථාවේ එළුවන්කුලම, නාලන්ද, වෙල්ලන්කුලම හා පුනරින් යන වතුයායන්වල පැවති දැඩි වන අලි හානි හේතුවෙන් විශාල ගස් ප්‍රමාණයක් මිය යාම ද මේ සඳහා චක්‍ර ලෙස බලපා ඇත. වන අලි හේතුවෙන් වාර්ෂිකව විනාශ වන කජු ගස් ගණන සැලකිය යුතු අගයක් ගන්නා අතර, එම හානිය හේතුවෙන් කජු ගස්වල කඳපණු හානිය පැතිරීම ද වේගවත් වී ඇත. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා අදාල වතුයායන් වටා අලි වැට ඉදි කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. කෙසේ නමුත් 2023 වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී (එනම් 2024 වර්ෂයේදී) සමස්ත ලෙලි කජු අස්වනු ලැබීම් ප්‍රමාණය 55%කට ආසන්න ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති බව සඳහන් කළයුතු වේ.

2.3 (න) පහත අදහස් දක්වමි.

අනුරාධපුරය ද ඇතුළුව දිවයිනෙහි කජු වගාව සිදුකරන දිස්ත්‍රික්කවල කජු වගාව සහ ඊට අදාල අනෙකුත් තොරතුරු සපයා ගැනීම සඳහා සංස්ථාව මඟින් පුවත්පත් දැන්වීමක් පළ කරනු ලැබූව ද ඒ සඳහා යහපත් ප්‍රතිචාර නොලැබුනි. කෙසේ නමුත් අදාල තොරතුරු සපයා ගැනීම සම්බන්ධව විකල්ප කටයුතු තවදුරටත් සිදුකරගෙන යනු ලබන අතර, ඒ අනුව ඉදිරියේදී අදාල දිස්ත්‍රික්කවල කජු නිෂ්පාදන හා පිරිසැකසුම් කර්මාන්ත සංවර්ධනයට අදාල තොරතුරු ලබාගෙන ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමේ හැකියාව පවතී.

2.3 (ප) පහත අදහස් දක්වමි.

මෙහි සඳහන් මිහින්තලේ කජු පැළ තවාන් පරිශ්‍රයේ ඉදි වන නළ ළිඳ කොන්ඩච්චි ජල සම්පාදන පද්ධති නවීකරණ ව්‍යාපෘතිය යටතේ පවතින ප්‍රතිපාදනවලින් අදාල

අනුමැතීන් යටතේ සිදුකරනු ලබන ඉදිකිරීමක් වන අතර, මේ වනවිට ජල මෝටරය සවිකිරීමේ කටයුතු හැර විෂයගත කටයුත්තට අදාල අනෙකුත් සියලු කාර්යයන් අවසන් කර ඇත. ඉතාමත් කඩිනමින් අදාල මෝටරය ද සවිකර මෙම නළ ළිඳ භාවිතයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.3 (ඛ) පහත අදහස් දක්වමි.

දැනට සංස්ථාවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නේ කුලී පදනම මත සපයාගත් ගොඩනැගිල්ලක වන අතර, එම ස්ථානයේ කපු පැළ තවානක් පවත්වාගෙන යාමට සුදුසු පරිසරයක් නොමැත.

කෙසේ නමුත් අනුරාධපුර නගරයේ පිහිටා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩ පහසුකම් සහිත ගොඩනැගිල්ලක්, සංස්ථාවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා ඉල්ලුම් කර ඇති අතර, ඒ අනුව ඉදිරියේදී එම ස්ථානයේ ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපනය කළ පසු ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවතින බැවින් එම ස්ථානයේම කපු පැළ විකිණීමේ කටයුතු සඳහා තැබීමේ හැකියාව ලැබේ.

13. වර්ෂ 05ක ගිණුම් සාරාංශ.

ලාභ ලාභ ගිණුම	2023	2022	2021	2020	2019
	Rs.	Rs.	Rs.	Rs.	Rs.
ශුද්ධ විකුණුම්	176,317	134,849	139,223	109,120	100,082
විකුණුම් පිරිවැය	135,915	83,472	99,661	(72,190)	(67,857)
දළ ලාභය	**40,402**	**51,377**	**39,562**	**36,930**	**32,225**
අනෙකුත් ආදායම්	76,599	69,390	42,727	43,300	48,343
පුනරාවර්තන ප්‍රදාන	80,400	77,500	64,800	60,000	60,000
පරිපාලන වියදම්/අනෙකුත් වියදම්	(196,573)	(181,059)	(160,419)	(147,982)	(167,334)
ක්‍රමක්ෂය	(5,849)	(2,736)	(3,082)	(3,134)	(3,420)
වාණිජ කටයුතුවලින් ලත් ශුද්ධ ලාභය	**(5,021)**	**14,472**	**(16,412)**	**(10,886)**	**(30,186)**
සේවා අංශය- ආදායම් ඉක්ම වූ වියදම්	**-**	**-**	**-**	**-**	**-**
ආයුගණක (ලාභය)/අලාභය	**(154)**	**(2,232)**			
ශුද්ධ ලාභය/අලාභය	**(5,175)**	**16,704**	**(16,412)**	**(10,886)**	**(30,186)**
ශේෂ පත්‍රය					
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත සහඋපකරණ	113,260	116,125	117,553	77,883	82,027
ඵල දරන වගා නඩත්තුව	81,699	25,316	28,053	31,135	34,270
ඵල නොදරන වගා නඩත්තුව	46,008	98,080	71,592	60,329	37,862
කෙරීගෙන යනප්‍රාග්ධන වැඩ	22,134	6,543	628	576	69
අනෙකුත් කුඩා ව්‍යාපෘති	841	588	6,363	122	675
මුළු ජංගම නොවනවත්කම්	**263,942**	**246,652**	**224,189**	**170,045**	**154,903**
ජංගම වත්කම්					
තොග	105,484	76,770	90,952	64,467	38,264
වෙළඳ ණයගැනියෝ සහ ලැබිය යුතු අනෙකුත් දෑ	28,640	31,801	47,390	18,474	21,207
අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	9,751	50,639	43,813	9,828	6,093
මුදල් හා මුදල් සමාන දෑ	156,599	143,842	159,876	42,516	5,202
මුළු ජංගම වත්කම්	**300,474**	**303,052**	**342,031**	**135,285**	**70,766**
මුළුවත්කම්	**564,416**	**549,704**	**566,220**	**305,330**	**225,669**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
මූලික ප්‍රාග්ධනය	40,000	40,000	40,000	40,000	40,000
රාජ්‍ය ප්‍රදාන	300,698	281,565	289,535	256,381	202,788
අනෙකුත් පාර්ශවයන්ගෙන් ලැබුණු ප්‍රදාන	246,157	280,919	286,736	32,337	15,766
ප්‍රාග්ධන සංචිත	17,442	17,441	17,442	17,441	17,442
ලාභාලාභ ගිණුම	(156,860)	(152,058)	(167,065)	(149,638)	(141,197)
මුළු හිමිකම්	**447,437**	**467,867**	**466,648**	**196,521**	**134,799**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම්	40,515	35,790	42,948	38,953	35,046
දිගු කාලීන ණය	3,500	3,500	3,500	3,500	3,500
මුළු ජංගම නොවනවගකීම්	**44,015**	**39,290**	**46,448**	**42,453**	**38,546**
ජංගම වගකීම්					
වෙළඳ ණයහිමියෝ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	72,964	42,547	53,124	66,359	52,324
මුළු ජංගම වගකීම්	**72,964**	**42,547**	**53,124**	**66,359**	**52,324**
මුළු ස්කන්ධ සහවගකීම්	**564,416**	**549,704**	**566,220**	**305,333**	**225,669**
ශුද්ධ වත්කම් ප්‍රතිලාභය %	(1.16)	3.6%	(3.5%)	(5.5)	(22.39)
ශුද්ධ ලාභ අනුපාතය %	(2.9%)	12.4%	11.8%	(9.98)	(30.2)
ජංගම අනුපාතය	4.1	7:1	0:3	2:01	1:4
ක්ෂණික වත්කම් අනුපාතය	2.7	5:3	4:7	1:1	0:4
මුළු ආදායමට මුළු වියදම	0.98	1:1	(0.93)	(0.89)	(1.3)